# The SIGNALLER

## SRI LANKA SIGNAL CORPS JOURNAL - 2020





විශ්‍රාමික හා රාජකාරී කරනු ලබන මේජර් ජෙනරාල්වරුන්ගේ ඡායාරූප ඇතුලත් ඡායාරූප පුවරුවක් සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී සහ තවත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය පනාගොඩ දී විවෘත කරන ලද අවස්ථාවේදී ගත් ඡායාරූපය



වන්නි මානුෂීය මෙහෙයුමේදී තුවාල ලබා රණශූරතයට පත්වූ 10 වන රෙජිමේන්තුවේ සැරයන් පතිරණ පී ඩී පී හා ශ්‍රියානී සන්ධ්‍යා කුමාරි මෙනවිය සමග අතිනත ගැනීමේ විවාහ උත්සවය 2020 මාර්තු මස 12 වන දින වාද්දුව ලායා බීච් හෝටලයේදී පවත්වන ලද අතර ඒ සඳහා සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී සහ තවත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහභාගී වූ අවස්ථාවේ දී ගත් සමූහ ඡායාරූපය

# නව සොයාගැනීම් හා නිර්මාණ





පසුගිය වසරේ සිදු වු පාස්කු ඉරුදින ප්‍රහාරය නිසා රටම පීඩාවට පත්වු අතර ඒ සදහා ආරක්‍ෂක අමාත්‍යාංශය විසින් විවිධ ආරක්‍ෂක ක්‍රියාමාර්ග ගත් අතර සංඥා බළකා සෙනීන් විසින් ඒ සදහා ඩ්‍රෝන පැමරයක් නිෂ්පාදනය කරන ලද අතර එහි ක්ෂේත්‍ර පරීක්‍ෂාව පාර්ලිමේන්තු පරිශ්‍රය තුල අත්හදා බලන ලද අවස්ථාව






කොවිඩ් 19 වසංගතයෙන් ආරක්‍ෂාවීම සදහා විවිධ උපක්‍රම භාවිතා කරනු ලබන අතර සංඥා බළකා සෙනින් විසින් නිරෝධායනය වන සෙනින්ගේ ප්‍රයෝජනය සදහා සෞඛ්‍ය ආරක්‍ෂක ක්‍රමෝපායන්ට අනුකූලව නිර්මාණය කල පාදයෙන් හා ස්වයංක්‍රියව ක්‍රියාත්මක වන ජල කරාම දෙකක් 10 ශ්‍රීලංසංබ ගුවන් විදුලි බළඹණයේ රාජකාරී කරනු ලබන සෙ/281969 කෝප්‍රල් පින්නවල පි එච් අයි එම් යන කොනොනි සහ යාන්ත්‍රික අංශයේ රාජකාරී කරනු ලබන සෙ/285588 ලා/කෝ පුෂ්පකුමාර එච් එම් ඩී කේ යන කොනොනින් විසින් නිර්මාණය කරන ලදි



පරිඝණක වැඩපළ - පනාගොඩ යටතේ රාජකාරී කරනු ලබන සෙ/284558 ලා/කෝ මධුශාන් එම් එම් ඩී කොනොනි විසින් නිර්මාණය කරන ලද විද්‍යුත් වාහන පරීක්‍ෂක යන්ත්‍රය



පරිඝණක වැඩපළ - පනාගොඩ යටතේ රාජකාරී කරනු ලබන සෙ/283830 සංසෙ ගුණවර්ධන පී ඩබ් අයි පී විසින් නිර්මාණය කරන ලද සංවේදක ජල කරාමය

# “The Signaller” සඟරාවේ ගමන් මග

# 1998 සිට 2020 දක්වා .....


































































## කතුවැකිය

ශ්‍රී ලංකා සංඥා බළකායට වසර 77 ක් සපිරෙන ඓතිහාසික අවස්ථාවේ වාර්ෂිකව පළකරනු ලබන "ද සිග්නලර්" සඟරාවේ ප්‍රධාන කර්තෘ වශයෙන් කටයුතු කිරීමට ලැබීම පිළිබඳව අවංකවම සතුටු වෙමි.

මීට වසර විසිදෙකකට ප්‍රථම ආරම්භ කරන ලද මෙම සඟරාව තුළින් සංඥා බළකායේ වසරක් පුරා සිදුවු කාලීන සිදුවීම් සෑම සාමාජිකයෙකුටම දැනගැනීමට, ඔවුන්ගේ නිර්මාණශීලී හැකියාව විදහා දැක්වීමට හා තම දැනුම වර්ධනය කර ගැනීමටත් මනා පිටුවහලක් වන බැව් නොඅනුමානය. අප වීරෝදාර සෙබළුන්ට මෙම කලාපය තුළින් තම නිර්මාණාත්මක අදහස් එළිදැක්වීමට ඉතා හොඳ තෝතැන්නක් සැකසෙන අතර, ඒ සඳහා සියලුම මුලස්ථාන හා ඒකකයන්හී නිලධාරී/ සෙසුනිලයින් විසින් දක්වන ලද සහයෝගය ඉතා අගය කොට සලකමි.

ලෝකයේ දැනට පවතින තාක්ෂණික දියුණුවත් සමග ආරක්ෂක හමුදාවන් භාවිතා කරන තාක්ෂණික උපකරණ/ උපක්‍රම හා විශේෂිත වු හමුදාමය පරිගණක වැඩසටහන් පිළිබඳව විශේෂ අවධානය යොමුකර එයට මුහුණදීම සඳහා සංඥා බළකාය වශයෙන් යම් ආකාරයක කාර්යභාරයක් ඉටුකළ යුතුව ඇති බැව් ද සිහිපත් කිරීමට කැමැත්තෙමි.

අවසාන වශයෙන් මෙම සඟරාව සිත්ගන්නා සුළු අයුරින් හා හරවත්ව සකස් කර මුද්‍රණය කිරීම සඳහා දායක වු සංඥා බළකාධිපති ඇතුළු සියලුම නිලධාරීන් සහ සෙසුනිලයන්ටත්, කාලෝචිත හා නිර්මාණශීලී අදහස් හා නිර්මාණයන්ගෙන් දායක වු සැමටත් කෘතඥතාපූර්වකව ස්තූතිවන්ත වන අතර, මෙවර කලාපය අලංකාර අන්දමින් සංස්කරණය කර ඔබ අතට පත් කිරීමට කටයුතු කළ සංස්කාරක මණ්ඩලයටත් ප්‍රධාන කර්තෘ වශයෙන් මාගේ ප්‍රශංසාව පුද කරමි.

**එස් ජේ කේ ඩී ජයවර්ධන යුඑස්පී පීඑස්සී**
**කර්නල්**
**ප්‍රධාන සංස්කාරක**


රෙජිමේන්තු මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා සංඥා බළකාය,
යුද්ධ හමුදා කඳවුර,
පනාගොඩ,
හෝමාගම.

Tel : +94112855361
E-mail : rhqslsc@army.lk
Web : www.army.lk/signaller


## පටුන


| | |
|---|---|
| සංඥා බළකාධිපතිගේ පණිවුඩය | 1 |
| ප්‍රධාන සංඥා නිලධාරීගේ පණිවුඩය | 3 |
| සංඥා බළකායෙහි අතීත මතක සටහන් | 4 |
| අභිමානවත් 76 වන සංවත්සරය සැමරීම | 9 |
| මතක පොතින් | 11 |
| ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විශ්‍රාම ගැනීම | 62 |
| විශේෂ අවස්ථාවන් | 65 |
| සංඥා ක්ෂිතිජයෙන් ඔබ්බට | 66 |
| උසස්වීම් / ජයග්‍රහණ / පාඨමාලා | 66 |
| ක්‍රීඩා දක්ෂතාවයන් | 71 |
| මන්දාකිණිය | 76 |
| කැටපත් පවුර | 82 |
| මංගල සීනු | 84 |
| සංවේගයෙන් සිහිපත් කරමි | 86 |
| ගෞරවණීය උපහාර | 87 |



## සංඥා බළකාධිපතිගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංඥා බළකායේ 12 වන බළකාධිපති වශයෙන් "ද සිග්නලර්" සඟරාවේ 22 වන කලාපය සඳහා පණිවුඩයක් ගෙන ඒමට ලැබීම ඉතාමත් ගෞරවයක් ලෙස සලකමි. වසර 77 ක අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා සංඥා බළකායේ ප්‍රගමනය උදෙසා නවතම තාක්‍ෂණික උපක්‍රම සහ පුද්ගලික අභිවෘද්ධිය වෙනුවෙන් දායක කර ගැනීම තුළින් අද්විතීය සන්නිවේදන දායකත්වයක් යුද්ධ හමුදාවට මෙන්ම ශ්‍රී ලංකාවට ලබාදීම අපගේ නව අරමුණ වනු ඇත.

ගෝලීය තොරතුරු තාක්‍ෂණයේ සීඝ්‍ර දියුණුව හමුවේ පුළුල් වූ ආරක්‍ෂණ ක්‍රමවේදයක් යුද්ධ හමුදාව තුළ ක්‍රියාත්මක කරමින් සයිබර් අවකාශයේ ඇති වෙනස්වන අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමේ හැකියාව තවදුරටත් වැඩිදියුණු කිරීමට මා බලාපොරොත්තු වන අතර, නවීන තාක්ෂණික උපකරණ භාවිතය මගින් සන්නිවේදන ජාලයන් පුළුල් කිරීම සහ තොරතුරු පද්ධති විධිමත්ව පරිපාලනය කිරීම වස් සිදුකළ යුතු සියලු ක්‍රියාකාරකම් සිදුකිරීම උදෙසා මාගේ උපරිම දායකත්වයක් ලබා දීමට කටයුතු කරමි.

තවද, දශක තුනක කාලයක් මුළුල්ලේ මව්බිම වෙළාගත් රුදුරු ත්‍රස්තවාදයේ අඳුරු සෙවණැලි මුලිනුපුටා දමා මාතෘභූමියට දීප්තිමත් අනාගතයක් ළඟා කරදීමෙහිලා පැවති මානුෂීය මෙහෙයුමේදී සංඥා බළකායේ සාමාජිකයන් වන අප හට පැවරුණු සුවිශේෂී කාර්යභාරය වූ සංඥා රාජකාරීන් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම වුවත් එතැනින් නොනැවතුණු අප බළකාය රුදුරු ත්‍රස්තවාදීන් සමග සටන් වැදෙමින් තම ජීවිතද තවත් පිරිසක් තම ශරීර කොටස්ද කැප කරමින් මාතෘභූමියේ විජයග්‍රහණය උදෙසා දැක්වූ පරම සහයෝගය හා කැපකිරීම් ද මම ඉතා ගෞරවයෙන් හා සාඩම්බරයෙන් යුක්තව සිහිපත් කරමි.

බහුකාර්ය ශක්‍යතාවයෙන් හෙබි නිලධාරීන් සහ සෙසුනිලයින් පුහුණු කිරීම හා සේවයේ නියතු සියලු දෙනාගේ සුබසාධන කටයුතු වැඩිදියුණු කිරීම තුළින් උපරිම කාර්යක්‍ෂමතාවයෙන් යුත් බළකායක් නිර්මාණය කර ගැනීම, ප්‍රධාන අභිලාෂය වන අතර, එමගින් විවිධ කුසලතාවන්ගෙන් හෙබි අය පුහුණු කිරීම මගින් ප්‍රමාණාත්මකව අඩු හට පිරිසක් කළමනාකරණය කර ගැනීම හා එමගින් වැඩි පිරිසකගේ කාර්යයක් සිදුකළ හැකි බහුකාර්ය මෙන්ම නිර්මාණශීලී පුද්ගල සම්පතක් බළකායේ උන්නතිය උදෙසා දායක කර ගැනීම මාගේ ප්‍රධාන අභිලාෂයකි.

ශ්‍රී ලංකා සංඥා බළකාය සවිමත් අඩිතාලමක් මත ගොඩනැගුණු ප්‍රතාපවත් බළකායක් බවට පරිවර්තනය කිරීමෙහිලා දායක වූ දැනට රාජකාරී කරන හා රාජකාරී කළ සියලු සාමාජිකයින්ටත්, කලෝචිත සඟරාවක් ලෙස "ද සිග්නලර්" සඟරාව ඔබ වෙත ගෙන ඒමට කැපවූ සඟරාවේ සංස්කාරක මඬුල්ලටත් මාගේ කෘතඥතාව පුදකර සිටින අතර, සාමය සතුට සපිරි සෞභාග්‍යමත් සුබ අනාගතයක් උදෙසා සුභාශිංසන එක් කරමි.

**ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩියු පීඑස්සී**
**මේජර් ජෙනරාල්**
**සංඥා බළකාධිපති**



නව සංඥා බළකාධිපති වශයෙන් මේජර් ජෙනරාල් ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2020.02.25 වන දින මධ්‍යස්ථාන සේනාවිධායක විසින් පිළිගත් අවස්ථාව



ශ්‍රී ලංකා සංඥා බළකායේ නව සංඥා බළකාධිපති වශයෙන් මේජර් ජෙනරාල් ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී උදෙසා 2020.02.25 වන දින පිරිනමන ලද සම්මාන පෙළපාළිය



## ප්‍රධාන සංඥා නිලධාරිගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංඥා බළකාය මගින් සිය අභිමානවත් 77 වන සංවත්සරය සමරනු ලබන මෙම ඓතිහාසික මොහොතට සමගාමීව එළිදක්වනු ලබන 2020 "ද සිග්නලර්" සඟරාව වෙනුවෙන් ප්‍රධාන සංඥා නිලධාරී වශයෙන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකමි. ප්‍රෞඪ ඉතිහාසයක් ඇති සංඥා බළකායේ සාමාජිකයින් වන අප සංඥා රාජකාරී ඉටුකිරීම මෙන්ම තොරතුරු තාක්ෂණික රාජකාරී ඉටුකිරීමේදීද දක්වන ලද දක්ෂතා හා කැපකිරීම් තුළින් යුද්ධ හමුදාවට ලබාදී ඇති අසීමිත දායකත්වය වත්මන් ප්‍රධාන සංඥා නිලධාරී වශයෙන් අගය කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ දුරකථන ජාලය වැඩි දියුණු කිරීම සඳහා නව සන්නිවේදන තාක්ෂණික ක්‍රමවේද උපයෝගි කරගනිමින් ස්වයංක්‍රීය හුවමාරු ඒකාබද්ධ කිරීම තුළින් දුරකථන සම්බන්ධතා කාර්යක්ෂමව ඉටුකිරීමට කටයුතු කළ අතර ගුවන් විදුලි සම්බන්ධතාද වැඩි දියුණු කිරීම මගින් සංඥා සම්බන්ධතා ලබාදීම වර්ධනය කිරීමට හැකිවීම ශ්‍රී ලංකා සංඥා බළකාය වෘත්තිමය වශයෙන් ලද විශාල ජයග්‍රහණයක් ලෙස සලකමි. යුද්ධ හමුදාවේ තොරතුරු තාක්ෂණ භාවිතය වේගවත් ගමන් මගකට යොමු කිරීමටත් ශ්‍රී ලංකාවේ මේ වන විට පවතින විශාලතම පරිගණක දත්ත ජාලය වන යුද්ධ හමුදා පරිගණක දත්ත ජාලය භාවිතයෙන් යුද්ධ හමුදා මූලස්ථානය, ක්ෂේත්‍ර මූලස්ථාන, රෙජිමේන්තු මධ්‍යස්ථාන සහ බළඇණි දක්වා යුද්ධ හමුදා දත්ත හුවමාරු කර ගැනීම, සජීවී සම්මන්ත්‍රණ, විද්‍යුත් තැපැල් පහසුකම් හා අන්තර්ජාල පහසුකම් සැපයීම වැඩි දියුණු කිරීම සහ එහි නිරතුරු පුහුණුවීම් පැවැත්වීමට කටයුතු කළ අතර එමගින් යුද්ධ හමුදාව තුළ එදිනෙදා අවශ්‍යතා සඳහා වූ සන්නිවේදන අභියෝග ජයගැනීමට හැකිවීම සංඥා බළකාය ලද ජයග්‍රහණයක් ලෙස මම දකිමි.

එසේම ශ්‍රී ලංකාව තුළ කෝවිඩ්-19 වසංගත තත්වය පාලනය කිරීම උදෙසා යුද්ධ හමුදාව යටතේ රට පුරා ස්ථාපනය කරන ලද නිරෝධායන මධ්‍යස්ථානයන් 74 හී සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ කටයුතු ස්ථාපනය කිරීමෙහිලා සංඥා බළකාය විසින් ඉටු කරනු ලබන මෙහෙය මේ අවස්ථාවේදී විශේෂයෙන් අගය කළ යුතුය.

සන්නිවේදන තාක්ෂණය හා තොරතුරු තාක්ෂණය පෙරදැරි කරගත් ශිල්පීය ඥානය හා තාක්ෂණික දත්තයන් අප බළකායේ සියලුම නිලයින්ගේ රාජකාරී කාර්යක්ෂමතාවට නොතිත් පිටුවහලක් වන අතරම ඔවුන්ගේ නිර්මාණශීලී හැකියාවන් වර්ධනය කිරීමට මහඟු දායකත්වයක් ලබා දෙනු ඇති බව මාගේ විශ්වාසයයි. එහිදී "ද සිග්නලර්" සඟරාව එළිදැක්වීම නිලධාරීන් හා සෙසුනිලයින්ගේ එම නිර්මාණශීලී හැකියාවන් මෙන්ම කුසලතා වැඩි දියුණු කිරීමට තෝතැන්නක් වන බැවින් එය දිනෙන් දින දියුණු වේවායි මම ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

කුරිරු ත්‍රස්තවාදය නිමා කිරීමෙන් අප මාතෘභූමියේ ඒකීයභාවය වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කළ වීරෝදාර සංඥා රණවිරුවන් හා දැනට ආබාධිතව ප්‍රතිකාර ලබමින් සිටින රණවිරුවන් හට ඉක්මන් සුවය මෙන්ම ජීවිත පරිත්‍යාග කළ සංඥා රණවිරු පවුල්වල සියලුම සාමාජිකයින්ට ප්‍රධාන සංඥා නිලධාරී ලෙස මාගේ ගෞරවපූර්වක ආචාරය මේ අවස්ථාවේ පුද කරන අතර, අප බළකායේ දැනට සේවයේ නියුතු සියලුම සාමාජිකයින් හට තම රාජකාරිය හොඳින් ඉටුකර තමන්ගේ අනාගත අභිවෘද්ධිය ළඟාකර ගැනීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන අතර "ද සිග්නලර්" සඟරාව එළිදැක්වීමට කටයුතු කළ කර්තෘ මණ්ඩලයටද මාගේ හෘදයාංගම ස්තුතිය පුදකරමි.

**ඩබ්ලිව් පී ඒ කේ තිලකරත්න පීඑස්සී**
**මේජර් ජෙනරාල්**
**ප්‍රධාන සංඥා නිලධාරී**

# ශ්‍රී ලංකා සංඥා බළකායෙහි අතීත මතක සටහන්



1943 වසර ආරම්භයේදී අණදෙන නිලධාරී තනතුර දැරූ කර්නල් සැමුවෙල් ඇතුළු නිලධාරීන්



1950 වසරේදී ආරම්භ වූ ප්‍රථම නිත්‍ය සංඥා බණ්ඩයෙහි නිලධාරී අණදෙන කපිතන් නොයෙල් ජොබ්ස් පසුව සංඥා නිත්‍ය බළඝණයෙහි නිලධාරී අණදෙන තනතුර හෙබවීමෙන් අනතුරුව සමුගැනීමේ ඡායාරූපය



සංඥා බළකායෙහි ප්‍රථම බළඝණය වශයෙන් ස්ථාපිත වූ III වන බළඝණය ආරම්භයේ එහි බළඝණ බලලත් නිලධාරී
ඩබ් පී කැම්ප්බෙල් ඇතුළු ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන්



**Stunt Riding Display by Ceylon Signals Corps (Ceylon Army)**
**Sgt D C Pereira, Staff Sgt A I Martil & Cpl A H L Weerakoon**



**Despatch Rider (Sgt C M G Dias) on escort duty to H R H**
**the Duke of Gloucester on his visit to the Island**



1964 දී කපිතන් ඒ එම් ෆර්ඩි ප්‍රධාන උපදේශක වශයෙන් ස්ථාපිත වූ සංඥා පුහුණු බළඝණයෙහි පුහුණු සංඥා සෙබළුන්

# සියවස් සපිරි බ්‍රිතාන්‍ය රාජකීය සංඥා බළකාය

රාජකීය සංඥා බළකාය ස්වකීය ඓතිහාසික ශතසංවත්සරය 2020 ජුනි මස 28 වන දිනට යෙදී තිබිණි.

වසර 1870 දී ටෙලිග්‍රාප් සංඥා සම්බන්ධතාවය බ්‍රිතාන්‍ය හමුදාව වෙත සැපයීම උදෙසා රාජකීය ඉංජිනේරු බළකායට අනුයුක්තව කපිතාන් මොන්ටේගු ලැම්බර්ට් නිලධාරී යටතේ 'සී' ටෙලිග්‍රාප් ඛණ්ඩය ස්ථාපනය කරන ලදි. 1884 මැයි මස 1 වන දින 'සී' ඛණ්ඩය රාජකීය ඉංජිනේරු බළකායෙහි 22 වන බළඝණය සහ 34 වන බළඝණය සමග ඒකාබද්ධව රාජකීය ඉංජිනේරු ටෙලිග්‍රාප් බළඇණිය ස්ථාපනය වන ලදි.

මෙම බළඇණිය 1908 වර්ෂය දක්වා සංඥා සම්බන්ධතා වගකීම දරණ ලද අතර 1908 වසරේ බ්‍රිතාන්‍ය හමුදාවෙහි සංඥා සම්බන්ධතාවය උදෙසා රාජකීය ඉංජිනේරු සංඥා සේවා සැපයීම ආරම්භ වී ඇත.

සංඥා බළකාය ස්වාධීන වශයෙන් ස්ථාපනය කිරීම උදෙසා රාජකීය බලපත්‍රය සහ අනුමැතිය එවකට බ්‍රිතාන්‍ය රාජ්‍ය යුධ ලේකම් ලෙස කටයුතු කල ගරු වින්ස්ටන් චර්චිල් මැතිතුමා විසින් 1920 ජුනි මස 28 දින අත්සන් තැබීමෙන් පසු ආරම්භ වී ඇති අතර පසුව එවකට බ්‍රිතාන්‍ය රාජකීය කිරුළ දැරූ පස්වන ජෝර්ජ් රජතුමා විසින් 1920 අගෝස්තු 05 වන දින රාජකීය සංඥා බළකාය යන නාමය ප්‍රධානය කරන ලදි.



කපිතාන් මොන්ටේගු ලැම්බර්ට්



රාජකීය සංඥා බළකායේ
ප්‍රථම කර්නල් සේනාවිධායක
මාරි රජ කුමරිය
(1935 සිට 1965 දක්වා)



රාජකීය සංඥා බළකායේ
ප්‍රථම බළකාධිපති
ලුතිනන් ජෙනරාල්
සර් ජෝන් එස් ෆවුලර්
කේසීබී කේසීඑම්ජී

රාජකීය සංඥා බළකායේ
සියවන සැමරුම් ලාංඡනය




පළමුවන ලෝක යුධ සමයෙහි රාජකීය ඉංජිනේරු බළකාය යටතේ
රාජකාරී කල සංඥා බළඝණය.



'සී' ටෙලිග්‍රාප් ඛණ්ඩය 1872 වසරේදී

George R.I.

**ROYAL WARRANT.**

**Corps of Signals.**

WHEREAS WE have noted with great satisfaction the splendid work which has been performed by the Signal Service branch of Our Royal Engineers during the War of 1914-19, and Whereas in Our Warrant of 28th June, 1920,* We authorised the formation of the Corps of Signals; 20 / Engineers / 5502

OUR WILL AND PLEASURE is that this Corps shall enjoy the distinction of "Royal" and shall henceforth be known as Our "Royal Corps of Signals."

Given at Our Court at St. James's, this 5th day of August, 1920, in the 11th year of Our Reign.

By His Majesty's Command,

W. S. Churchill

රාජකීය සංඥා බළකා ආරම්භක බලපත්‍රය

George R.I.

**ROYAL WARRANT.**

**Corps of Signals.**

WHEREAS WE deem it expedient to authorize the formation of a Corps to be entitled "Corps of Signals"; 20 / Engineers / 5469

OUR WILL AND PLEASURE is that the Corps of Signals shall be deemed to be a Corps for the purpose of the Army Act, and that the words "Corps of Signals" shall be inserted in Our Warrant of 7th July, 1916,* defining the expression "Corps."

OUR FURTHER WILL AND PLEASURE is that the rates of pay for officers, warrant officers, non-commissioned officers and men of the Corps of Signals shall be as provided in the Schedule attached to this Our Warrant.

Given at Our Court at St. James's, this 28th day of June, 1920, in the 11th year of Our Reign.

By His Majesty's Command,

W. S. Churchill

MAJ GEN DAPN DEMATANPITIYA ndu psc
COLONEL COMMANDANT SRI LANKA SIGNAL CORPS

REGIMENTAL CENTRE
ARMY CANTONMENT
PANAGODA, HOMAGAMA,
SRI LANKA

Phone : +9411 - 2242819/ +9411 - 2063205
+9476 6907306
Email : prabathdematanpitiya@gmail.com
Web : alt.army.lk/signaller

Colonel - in - Chief
Royal Corps of Signals
British Army
DORSET

20 June 2020

Dear General

It is my great honor and pleasure to congratulate the Royal Corps of Signals of the British Army as it celebrates its Centenary Celebrations on the 28th of June 2020.

I truly believe that the birth of the Royal Corps of Signals was the natural outcome of the services rendered by the corps to the Royal British Army, the British nation and the British Monarchy to their utmost satisfaction throughout British engagements in warfare leading up to 1920, particularly during World War I as part of the Royal Corps of Engineers.

On this momentous and distinguished occasion, the Sri Lanka Corps of Signals, a South Asian counterpart descendent from the Royal Corps of Engineers, remembers with pride, the strong lasting and rewarding ancestral affiliations it enjoyed with the Royal Corps of Signals that flagged the inauguration of the Ceylon Signal Corps in 1943. Therefore, I, the incumbent Colonel Commandant of the Sri Lanka Signal Corps, together with all my retired and serving Signalers extend our best wishes to all members of the Corps of Royal Signals.

I wish that the Royal Corps of Signals grow from strength to strength and know, with certainty, that it shall stand, steadfast and true to the highest ideals of universal military proficiency, acting as a beacon proclaiming the glory, grandeur and professionalism of the British Military into the next centuries.

Yours truly

ශ්‍රී ලංකා සංඥා බළකා බළකාධිපති විසින් රාජකීය සංඥා බළකා සියවන සැමරුම වෙනුවෙන් නිකුත් කරන ලද සුභාශිංසන ලිපිය සහ රාජකීය සංඥා බළකාධිපති විසින් නිකුත් කළ පිළිතුරු ලිපිය

ARMY

**Lieutenant General Sir Nicholas Pope KCB CBE**
**Master of Signals**
**Regimental Headquarters Royal Signals, Griffin House,**
Blandford Camp, BLANDFORD FORUM, Dorset, DT11 8RH

| | | | |
|---|---|---|---|
| Telephone | 01258 482081 | Military | 94371 2081 |
| Facsimile | 01258 482084 | Military | 94371 2084 |
| Email | R SIGNALS HQ-RegtSec@mod.gov.uk | | |

DEPUTY CHIEF OF THE GENERAL STAFF

Major General Dapn Dematanpitiya
Colonel Commandant Sri Lank Signal Corps
Regimental Centre
Army Cantonment
Panagoda
Homagama
Sri Lanka

25 July 2020

Dear General,

May I take this occasion to thank you for your kind greetings to mark the occasion of the Centenary Celebrations of the Royal Corps of Signals of the British Army on 28th of June 2020.

COVID 19 had a significant impact on the manner in which we were able to mark this significant milestone in the history of our Corps. But I am convinced that this does not detract in any way from the remarkable acts of heroism, sacrifice and dedication that our forebears have achieved through the last one hundred years. We truly stand on the shoulders of giants.

And no organisation can exist in isolation. I am enormously proud of the relationships that exist between our Corps and those of other nations. The Sri Lanka Corps of Signals holds a special place in our hearts and I hope that we may find opportunities to strengthen the ties and bonds of friendship over the coming years.

With kind regards & my very best wishes,

Nick



රාජකීය සංඥා බළකායේ ශතසංවත්සර සැමරුම වෙනුවෙන් පැවැත්වූ වැඩසටහන් මාලාවේ සුවිශේෂී අවස්ථාවක් වූ 2020 පෙබරවාරි 29 වන දින සැලිස්බරි දේවස්ථානයෙහි පැවති දේව මෙහෙයට සහභාගී වූ කර්නල් සේනාවිධායක ඈන් රජ කුමරිය වෙත සම්මාන මුරය පිරිනැමීම.

# සංඥා බළකා ලාංඡනය පිළිබඳ ඓතිහාසික මතකයන්

බ්‍රිතාන්‍ය රාජකීය ඉංජිනේරු බළකාය යටතේ ස්ථාපිතව තිබූ ටෙලිග්‍රාෆ් බළඇණියෙහි 1891 වසරෙහි අණදෙන නිලධාරී වූ මේජර් සී එෆ් චාල්ස් බේ‍රස්ෆෝඩ් (Maj C F C Beresford) විසින් බළඇණිය සඳහා විශේෂිත වූ ලාංඡනයක අවශ්‍යතාව ඔහු විසින් අවධාරණය කර සිදුකළ යෝජනාවකට අනුව එම බළඇණියෙහි ලාංඡනය ලෙස මර්කරි දෙවිදුන්ගේ රුව යොදාගෙන ඇත.

ග්‍රීක සහ රෝම දේව ධර්මයෙහි සංඥා සම්බන්ධතා පණිවිඩකරු වගකීම දැරූ දෙවිදුන් වශයෙන් ප්‍රචලිත මර්කරි හෙවත් හර්මීස් දෙවිදුන්ගේ අනුරුව ටෙලිග්‍රාෆ් බළඇණියෙහි ලාංඡනය වශයෙන් යොදා ගෙන ඇත. මෙම රුව බළඇණි ලාංඡනය වශයෙන් යොදා ගැනීමට මේජර් සී එෆ් සී බේ‍රස්ෆෝඩ් වෙත ප්‍රස්තුත වූ අදහස වශයෙන් අනුමාන කරනු ලබන්නේ ඔහුගේ පියා විසින් 1851 වසරේදී හයිඩ්පාර්ක්හි පැවති ප්‍රදර්ශනයකින් මිලදී ගන්නා ලද මර්කරි දෙවිදුන්ගේ අනුරුවක් නිසා බවය.







මෙම අනුරුවෙහි මූලික ප්‍රතිමාව ඉතාලි ජාතික ප්‍රතිමා කලා ශිල්පී ග්ලංබොලොංඤ Giambologna (Jean de Boulogne) විසින් 1578 - 1580 කාලපරිච්ජේදය තුළ නිර්මාණය කරන ලද (අංක 1 ඡායාරූපය) ෆ්ලෝරන්ස්හි පිටි පැලැස්හි (Pitti Palace, Florence) ස්ථාපනය කර තිබූ පිළිරුවෙහි ප්‍රතිනිර්මාණයකි. 1891 දී මේජර් බේ‍රස්ෆෝඩ් සහ ලුතිනන් සී ජේ එල්කින්ටන් (Lt C J Elkington) විසින් නිර්මාණ දායකත්වය මත මර්කරි අනුරුව ඇතුළත්ව සැකසූ වේත්‍රයක් (Mace) බළඇණි තූර්යවාදක කණ්ඩය වෙත ප්‍රදානය කරන ලදි (අංක 2 ඡායාරූපය).



ග්ලංබොලොංඤ (ජියැන් ද බොලොංඤ)

මර්කරි දෙවිදුන්ගේ ලාංඡනය වෙත 'ජිමී' යන අන්වර්ථ නාමය යෙදීමට හේතු සාධක වූ කරුණක් වශයෙන් අනුමාන කරනු ලබන්නේ මෙම පිළිරුවෙහි මූලික නිමැවුම්කරු වශයෙන් හැඳින්වෙන ග්ලංබොලොංඤ (ජියැන් ද බොලොංඤ) Giambologna (Jean de Boulogne) ගේ නම කෙටියෙන් පාදක කරගෙන සිදුවූවක් යන මතයක් පවතී.



මේජර් සී එෆ් සී බේ‍රස්ෆෝඩ්

එයට හේතුවක් වශයෙන් වූ තවත් කරුණක් වන්නේ 1921 - 1929 දක්වා බළකාය නියෝජනය කළ 1924 රාජකීය යුධ හමුදාවෙහි බොක්සිං කිරුළ හිමි කරගත් ජිමි එම්බ්ලම් (Jimmy Emblem) යන ක්‍රීඩකයාගේ (අංක 3 ඡායාරූපය) නාමය නිසා බැව් මතයක් පවතී. එම්බ්ලම් යන්නෙන් අදහස් කරනුයේ ලාංඡනය යන්න බැවින් ජිමි අපගේ ලාංඡනය යන්න සොල්දාදුවන් අතර ප්‍රචලිත වීමෙන් එම අන්වර්ථ නාමය භාවිතා කරන්නට ඇතැයි මත දරයි.

**සැකසුම : බ්‍රිගේඩියර් එල් එස් පී පෙරේරා යූඑස්පී**




Emblem and Motto of the Royal Engineers Telegraph Battalion - 1884




JIMMY EMBLEM
of "G" Coy , S T C Crowborcugh. Winner of the Eastern Command Middle Weight Championship

# අභිමානවත් 76 වන සංවත්සරය සැමරීම

## ශ්‍රී ලංකා සංඥා බළකාය සිය අභිමානවත් 76 වන සංවත්සරය සමරන ලද වගයි.

ශ්‍රී ලංකා සංඥා බළකායේ සිය අභිමානවත් 76 වන සංවත්සරය 2019 ඔක්තෝබර් මස 19 වන දිනට යෙදී තිබු අතර, සංවත්සරයට සමගාමීව හමුදා සම්ප්‍රදායානුකුල උත්සව මාලාවක් බළකාය විසින් සංවිධානය කර තිබුණි. සංවත්සර උත්සවයේ පළමු වැඩසටහන ආරම්භ කරමින් 2019 ඔක්තෝබර් මස 17 වන දින පනාගොඩ සංඥා බළකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ පිහිටි රණවිරු ස්මාරකය අභියසදී රට වෙනුවෙන් දිවිපිදු වීරෝදාර රණවිරුවන් සිහිපත් කරමින් රණවිරු අනුස්මරණ උත්සවයක් වීරෝදාර රණවිරු පවුල් රැසකගේ සහභාගිත්වයෙන් පවත්වන ලදි.

මෙම සැමරුම් උත්සවය සඳහා ප්‍රධාන සංඥා නිලධාරී/ සංඥා බළකාධිපති වු මේජර් ජෙනරාල් එන් එම් හෙට්ටිආරච්චි වීඑස්වී යුඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ඇතුළු සංඥා බළකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරී හා විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් ඉතා උත්කර්ශවත් අන්දමින් පවත්වන ලදි.

2019 ඔක්තෝබර් මස 16 වන දින අපර භාගයෙහි සංඥා බළකා රණවිරු ස්මාරකය අභියස පැවැති වීරෝදාර රණවිරුවන් අනුස්මරණ උත්සවයෙන් ආරම්භ වු සංවත්සරික උත්සව මාලාවෙහි ප්‍රථම වැඩසටහන එදිනම පැවැත්වු සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාව සහ පසුදින මහා සංඝරත්නය උදෙසා හීල් දානය සහ මහා සංඝරත්නය විෂයෙහිලා දහවල් දානය පිරිනැමීමත් සමගින් ආරම්භ විය.

සංඥා බළකා සංවත්සර දිනය වන 2019 ඔක්තෝබර් මස 19 වන දින සංඥා බළකාධිපති වෙනුවෙන් භට පිරිස් විසින් සම්ප්‍රදායානුකූලව කඳවුරු සම්මාන මුරය හා සම්මාන පෙළපාලිය පැවැත්වූ අතර, සංඥා බළකාධිපතිගේ සහභාගීත්වයෙන් දහවල් සියලු නිල භෝජන සංග්‍රහයක්ද පවත්වන ලදි.

මෙම සංවත්සරයට සමගාමීව සංඥා රෙජිමේන්තු නිලධාරී නිවස්න සාදය, බනි/සැරයන් නිවස්න සාදය පැවැත්වු අතර, ඒ සඳහා සංඥා බළකාධිපති ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් එම අවස්ථාවට සහභාගි විය.

























# ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ අණ, පාලනය සහ පරිපාලනය සඳහා අවශ්‍ය වන සන්නිවේදන, පරිගණක තොරතුරු තාක්‍ෂණ සහ විද්‍යුත් සංග්‍රාමික කටයුතු පහසුකම් සැපයීම ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලයේ වගකීම වේ. යුද්ධ හමුදා සන්නිවේදන, පරිගණක හා තොරතුරු තාක්‍ෂණය සම්බන්ධ කටයුතු පිළිබඳ ප්‍රධාන සංඥා නිලධාරී යුද්ධ හමුදාධිපති වෙත ඉදුරාම වගකිව යුතු වේ. තවද, ඒ පිළිබඳ උපදේශකයෙකු ලෙසද කටයුතු කරයි. එම කරුණු පදනම් කර ගෙන වඩාත් කාර්යක්‍ෂම හා ඵලදායි සන්නිවේදන සේවාවක් සැපයීම මූලික කරගෙන වර්ෂ 2007.03.12 වන දින පනාගොඩ යුද්ධ හමුදා ජනපදය තුළදී ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය ස්ථාපනය කරන ලද අතර, වර්ෂ 2019 නොවැම්බර් මස 29 වන දින නව යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර හි අභිනවයෙන් ස්ථානගත වන ලදී.

ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය ආරම්භයේ සිට මේ දක්වා ප්‍රධාන සංඥා නිලධාරීන් සත්දෙනෙකු සමස්ත යුද්ධ හමුදාවටත් සන්නිවේදන ක්ෂේත්‍රයේ රාජ්‍ය ආයතනයන්හිත් අවශ්‍යතා ඉටුකිරීම වෙනුවෙනුත් මහගු සේවාවක් ඉටු කර ඇති අතර, වර්තමානයෙහි මේජර් ජෙනරාල් ඩබ්ලිව් පී ඒ කේ තිලකරත්න පීඑස්සී යුද්ධ හමුදාවේ 7 වන ප්‍රධාන සංඥා නිලධාරී වශයෙන් 2020.02.27 දින එම තනතුරෙහි රාජකාරී භාරගැනීමෙන් පසු මෙම කාර්යාලය සඳහා නායකත්වය ලබාදෙමින් යුද්ධ හමුදා සංඥා අවශ්‍යතාවයන් කෙරෙහි මනා අවබෝධයෙන් යුද්ධ හමුදාධිපතිගේ ඉදිරි දැක්මෙහි සංකල්පයන්ට අනුගත වෙමින් යුද්ධ හමුදාවේ අභිවෘද්ධිය සඳහා කැපවීමෙන් රාජකාරීන් සිදුකරනු ලබයි.

මෙම කාර්යාලයේ කාර්යභාරය හා කාර්යයන් අනුව රජයේ හා පුද්ගලික රූපවාහිණී/ ගුවන් විදුලි නාලිකාවන් හා දුරකථන සේවා ඇතුළු සන්නිවේදන කෙෂ්ත්‍රයට සම්බන්ධ අනෙකුත් ආයතන සමගද ක්‍රියාකාරීව සම්බන්ධීකරණ කටයුතු සිදුකරමින් සිටින අතර, ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා ඇතැම් රාජ්‍ය ආයතනයන් වෙත ඔවුන්ගේ සන්නිවේදන අවශ්‍යතාවයන් සඳහා උපාය මාර්ගික සහාය ලබා දීම සිදුකරනු ලබයි.

රට තුළ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වු කොරෝනා වසංගතය මැඩපැවැත්වීම පිණිස අතිගරු ජනාධිපතිගේ උපදෙස් පරිදි පිහිටුවන ලද ජනාධිපති කාර්යසාධක බළකාය යුද්ධ හමුදාධිපති ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලද රාජගිරියේ පිහිටි ප්‍රධාන මෙහෙයුම් මූලස්ථානයන්හි රාජකාරී මනාව සහ ක්‍රමවත්ව ඉටුකිරීම පිණිස තොරතුරු තාක්‍ෂණය හා සංඥා සම්බන්ධතා නිසි පරිදි ලබාදී එය ක්‍රියාත්මක කිරීම විශේෂයෙන් සඳහන් කළ යුත්තකි. මෙම කොරෝනා වසංගතය මැඩ පැවැත්වීම සඳහා ආසේමු මූලස්ථාන යටතේ නිරෝධායන මධ්‍යස්ථාන 74ක් ස්ථාපිත කර ඇති අතර, ඒ සඳහා අවශ්‍ය වන තොරතුරු තාක්‍ෂණ, සංඥා සම්බන්ධතා සහ ජන ඇමතුම් උපකරණ සේවාව මනාව ඉටුකරන ලදි.

යුද්ධ හමුදා සන්නිවේදන පහසුකම් ආසේමු, සේමු ඇතුළු අනෙකුත් යුද්ධ හමුදා ආයතනයන් දක්වා ව්‍යාප්ත කිරීම සඳහා දුරකථන භුවමාරු, රේඩියෝ රිලේ පද්ධති ස්ථාපනය කිරීම සහ පරිගණක ජාලගත කිරීම සිදුකිරීම ප්‍රධාන සංඥා නිලධාරීගේ උපදෙස් හා මඟපෙන්වීම යටතේ ඒ ඒ සංඥා ඒකකයන් වෙතින් ඉටුකර ඇති අතර, ආරක්‍ෂාව අතින් වැදගත් කඳවුරු තුළ ආරක්‍ෂාව තහවුරු කිරීම සඳහා නව ආරක්‍ෂණ ක්‍රමවේදයක් වශයෙන් CCTV කැමරා පද්ධති ස්ථාපනය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය කරන උපකරණ/ උපාංග අභිනවයෙන් මිලදී ගැනීමද ප්‍රධාන සංඥා නිලධාරීගේ උපදෙස් හා මඟපෙන්වීම යටතේ මෙම කාර්යාලය වෙතින් ඉටු කරනු ලබයි.

තවද, යුද්ධ හමුදාවේ තොරතුරු සහ සංඥා තාක්‍ෂණික යටිතල පහසුකම් ආරක්‍ෂා කරගනිමින් ඒවා නිසි අයුරින් පවත්වාගෙන යාම නූතන සයිබර් ප්‍රහාරයන් අභියෝගයක්ව පවතින අතර, වර්තමාන ලෝකයෙහි දිනෙන් දින අළුත් වෙමින් පවතින නවීන සන්නිවේදන ක්‍රම හා තොරතුරු තාක්‍ෂණයට අදාළ වෘත්තීය පුහුණු වැඩසටහන් එම ක්ෂේත්‍රයේ ප්‍රමුඛ රාජ්‍ය හා පෞද්ගලික ආයතන විද්වතුන් සමග එක්වී ක්‍රියාත්මක කර ඒ තුළින් ලබාගන්නා ලද දැනුම හා ක්‍රමවේදයන් ආරක්‍ෂක සේනා මූලස්ථානයන් යටතේ දේශන පවත්වමින් අනෙකුත් නිලධාරී/ සෙසුනිලයින් හටද ලබාදීමට කටයුතු කර ඇත.

තොතාඅම යටතේ දැනට යුද්ධ හමුදාවේ ක්‍රියාකරවන පිළිවෙත් සහ සංඥා/ ලිපි හුවමාරුව ස්වයංක්‍රිය ශ්‍රිතයකට (Automated Function) අනුව ඵලදායි ලෙස ක්‍රියා කරවීම සඳහා මෘදුකාංග ව්‍යාපෘති 52ක් (Software Project), වෙබ් අඩවි 59ක් (Web Sites) හා නව නිපයුම් ව්‍යාපෘති 04ක් (R & D Innovation Projects) දැනට නිමකර ක්‍රියාකාරිත්වයේ පවතින අතර, ඒ සබැඳිව ඉදිරිපත් කිරීමක් (Finger Swift) නමින් යුද්ධ හමුදාධිපති වෙත 2020 සැප්තැම්බර් මස 07 වන දින ඉදිරිපත් කරන ලදි.

ආරක්‍ෂක අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත පැවරෙන වගකීම් නිසියාකාරව ඉටුකිරීමට කටයුතු කිරීම (ත්‍රිවිධ හමුදා මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතිය, උපාය මාර්ගික ආරක්‍ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය වැනි) හා ජාතික ආරක්‍ෂාව අතින් ගත් කළ වැදගත් නව ප්‍රතිපත්තීන් හා පනත් සැකසීමේදී අවශ්‍ය කරනු ලබන දත්තයන් හා තාක්‍ෂණික තොරතුරු සැපයීමට ක්‍රියාකිරීම මෙම කාර්යාලය වෙතින් ඉටුකරන රාජකාරීන් අතරින් විශේෂ ගණයෙහිලා සැළකිය හැකිය.

දැනට සේවයේ නියුතු රණවිරුවන්ගේ මෙන්ම යුද්ධයේදී මියගිය හා ආබාධිත වු රණවිරුවන්ගේ පවුල්වල දූ දරුවන්ගේ පරිගණක තාක්ෂණික දැනුම වර්ධනය කිරීමේ අභිලාෂයෙන් පිහිටුවා ඇති රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනයන් ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය අධීක්ෂණය යටතේ පවත්වාගෙන යන අතර, එමගින් රණවිරුවන්ගේ මෙන්ම ඔවුන්ගේ පවුල්වල දූ දරුවන්ගේ සුබසාධන කටයුතු කෙරෙහි මූලිකත්වයක් ලබාදෙමින් සහන ගාස්තුවක් යටතේ උසස් තත්වයේ පරිගණක පාඨමාලා හැදෑරීමට අවස්ථාව සලසා දී ඇත. එහි තවත් එක් පියවරක් ඉදිරියට තබමින් අභිනවයෙන් ඉදිකරනු ලැබූ හත් වන තොරතුරු තාක්ෂණ සම්පත් කේන්ද්‍රය යාපනයේදී 2019.03.11 දින 6 ශ්‍රීලංසංබහිදී සුබ මොහොතින් විවෘත කරන ලදී. එක් එක් ආරක්ෂක සේනා මූලස්ථාන ආවරණය වන පරිදි අනුරාධපුරය, පනාගොඩ, යාපනය, මහනුවර, කොකාවිල්, කුරුවිට සහ ත්‍රිකුණාමලය යන ස්ථානවල රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතන ස්ථාපනය කර ඇති අතර, එම පුහුණු ආයතන මගින් රණවිරු පවුල්වල දූ දරුවන්, අනෙකුත් දූ දරුවන් මෙන්ම යුද්ධ හමුදා සාමාජිකයින් 1909 දෙනෙකු හට 2019 වර්ෂය තුළදී පාඨමාලා හැදෑරීමට අවස්ථාව සලසාදී ඇති අතර, මෙම පුහුණු ආයතනයන්හි 2020 පළමු කාර්තුව තුළ පමණක් සිසුන් 525 දෙනෙකු හට පාඨමාලා හැදෑරීමට අවකාශ සලසා ඇත.



2019.11.29 දින නව යුද්ධ හමුදා මූලස්ථානයේ ස්ථානගත වීම වෙනුවෙන් සමරු සටහන් තබමින්




රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනය ත්‍රිකුණාමලය වෙතින් යුද්ධ හමුදා සාමාජිකයන් හට ප්‍රායෝගික පුහුණුවීම් සිදුකිරීම



මේජර් ජෙනරාල් ඩබ්ලිව් පී ඒ කේ තිලකරත්න පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2020.02.27 දින ප්‍රධාන සංඥා නිලධාරී තනතුරෙහි වැඩ භාරගැනීම



ලුතිනන් කර්නල් පී එච් එන් චන්ද්‍රසේකර ජ්‍යෙෂ්ඨ නිලධාරී 2020.03.11 දින ප්‍රමානි 1 (විද්සංබ) තනතුරෙහි වැඩ භාරගැනීම




2020.01.30 දින යුද්ධ හමුදාධිපතිගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද Zero Day of 2020 Virtual Battle සයිබර් ආරක්ෂණ වැඩමුලුව අවසානයේ ලබාගත් සමූහ ඡායාරූපය

# තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය



**මේජර් ජෙනරාල්**
**පී ඒ ජේ පීරිස් එන්ඩීයු**
**අධ්‍යක්ෂක ජෙනරාල් තොරතුරු තාක්ෂණ**

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ තොරතුරු තාක්ෂණ අංශයෙහි අභිවෘද්ධිය උදෙසා විශාල මෙහෙයක් ඉටුකරනු ලබන අතර, එය වර්ෂ 2010 මාර්තු මස 01 වන දින ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය යටතේ ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ සියලුම ආයතන සඳහා වු මෘදුකාංග නිර්මාණය, වෙබ් අඩවි නිර්මාණය සහ පරිගණක ජාල විසදුම්, සැලසුම් කිරීම, නිපදවීම හා නඩත්තු කිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදුකරනු ලබයි. තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක ජෙනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ  ක්‍රියාත්මක වන තොරතුරු තාක්ෂණ පහසුකම් සැලසීම සඳහා වු මෘදුකාංග සංවර්ධන හා ඉංජිනේරු මධ්‍යස්ථානය, දත්ත මධ්‍යස්ථාන, ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය, වෙබ් අඩවි අංශය සහ පර්යේෂණ හා සංවර්ධන අංශයකින් වර්තමාන තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. ඊට අමතරව යුද්ධ හමුදාව තුළ තොරතුරු තාක්ෂණ ව්‍යාප්තිය සමග ඇති වී ඇති සයිබර් තර්ජනයන්ට සාර්ථකව මුහුණදීම, සයිබර් ආරක්ෂණ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ සයිබර් ආරක්ෂණ ඒකකයක් වශයෙන් 12 වන ශ්‍රී ලංකා සංඥා බළකාය 2016 ජනවාරි මස 25 වන දින ස්ථාපනය කරන ලදී.

6 වන ශ්‍රී ලංකා සංඥා බළකාය සහ 11 වන ශ්‍රී ලංකා සංඥා බළකාය, යුද්ධ හමුදා මූලස්ථානය ප්‍රමුඛ ආරක්ෂක සේනා, සේනාංක, බළසේනා, ඒකක, පුහුණු පාසල් හා අනෙකුත් ස්වාධීන මූලස්ථාන/ ආයතන ආවරණය කරමින් සමස්ත යුද්ධ හමුදාව තුළ තොරතුරු තාක්ෂණ සේවා කටයුතුවල නියුතු වේ. එමෙන්ම එම ඒකකයන් හා සම්බන්ධීකරණයෙන් 12 ශ්‍රිලංසංබ ඒකකය සහ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයට අනුයුක්තව රාජකාරී ඉටුකරනු ලබන විශේෂඥ දැනුම සහිත මෘදුකාංග ඉංජිනේරුවරුන්, ජාලකරණ ඉංජිනේරුවරුන්, තොරතුරු තාක්ෂණ ආරක්ෂක විශ්ලේෂකයන්, මෘදුකාංග තත්ව පරීක්ෂක ඉංජිනේරුවරුන්, දෘඩාංග ඉංජිනේරුවන් හා තොරතුරු තාක්ෂණ නිලධාරීන් මෙන්ම පරිගණක ක්‍රියාකරුවන් සහ පරිගණක කාර්මිකයින් විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි තොරතුරු තාක්ෂණ අංශයෙහි අභිවෘද්ධිය සඳහා වු විවිධ ව්‍යාපෘති සහ එම විෂය සම්බන්ධ විවිධ වු තොරතුරු තාක්ෂණ රාජකාරීන්වල නිරතව සිටින අතර, එම සියලුම ව්‍යාපෘතින් තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සෘජු අධීක්ෂණය යටතේ ඉටුකරනු ලබයි.

මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ 6 වන තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක වශයෙන් මේජර් ජෙනරාල් පී ඒ ජේ පීරිස් එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී 2019 දෙසැම්බර් මස 27 වන දින එම තනතුර හි රාජකාරී ආරම්භ කරන ලදි.

තොරතුරු තාක්ෂණ යුගයේ පරිවර්තනය හා සමගාමීව වෘත්තීමය හමුදාවක් ලෙස දියුණුවෙමින් පවතින ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ මතුවන තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සපුරාලීම, පර්යේෂණ හා සංවර්ධනය කාර්යයන් ඉටුකරලීම සබැඳි අභියෝගාත්මක වගකීම තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂගේ මගපෙන්වීම යටතේ ඉතා සාර්ථකව සහ ප්‍රතිඵලදායක ලෙස සිදුකරනු ලබයි. එම කාර්යභාරයෙහි වැදගත් සන්ධිස්ථානයක් ලෙස දැනට තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන මෘදුකාංග සංවර්ධන හා ඉංජිනේරු අංශය විසින් ඉටුකරගෙන යනු ලබන කාර්යභාරයෙහි ප්‍රතිඵල ලෙස සමස්ත යුද්ධ හමුදවේ ප්‍රයෝජනය සඳහා සංවර්ධනය කොට භාවිතා කරනු ලබන හා සංවර්ධනය කරමින් පවතින පහත සඳහන් තොරතුරු කළමනාකරන පද්ධති දැක්විය හැක.

**සමස්තයක් ලෙස යුද්ධ හමුදා මට්ටමින් ක්‍රියාත්මක කර ඇති මෘදුකාංග පද්ධති**

- Daily Mail Dispatch Service
- Army Central Human Resource Management System
- Army Hospital Information System
- Army Web Portal System
- Event Calendar System

**සමස්තයක් ලෙස යුද්ධ හමුදා මට්ටමින් සංවර්ධනය කරමින් පවතින මෘදුකාංග පද්ධති**

- Strength Management System - Sri Lanka Army
- Geo Based Personal Information System
- Army Headquarters Access Management System

**යුද්ධ හමුදා ශාඛා මට්ටමින් ක්‍රියාත්මක කර ඇති මෘදුකාංග පද්ධති**

- Officers Career Development Monitoring System - MS Br
- Employee Details Management System in AHQ (COVID-19) - AG Br
- Finance Management & Bill Status Monitoring System - FM Br
- Tender Notification System - MGO Br

**යුද්ධ හමුදා ශාඛා මට්ටමින් සංවර්ධනය කරමින් පවතින මෘදුකාංග පද්ධති**

- Vehicles Repair Details Management System - MGO Br

**යුද්ධ හමුදා අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් ක්‍රියාත්මක කර ඇති මෘදුකාංග පද්ධති**

| | |
|---|---|
| COVID 19 - Quarantine Details Management System | - Dte of Ops |
| Physical Test Evaluation System | - Dte of Trg |
| New Army ID Card System | - Dte of MI |
| Document Management System | - Dte of PA |
| Insurance Management System | - Dte of Welfare |
| Shopping Cart for Army Welfare Shop | - Dte of Welfare |
| Automated Assets Management System | - Dte of AM |
| Army Benevolent Fund System | - Dte of ABF |
| Inventory Management System | - Dte of Engr Svcs |
| Sri Lanka Army Automated Material Management System | - Dte of Ord Svcs |

**යුද්ධ හමුදා අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් සංවර්ධනය කරමින් පවතින මෘදුකාංග පද්ධති**

| | |
|---|---|
| Integrated Operations Management System | - Dte of Ops |
| Integrated Training Information Platform - Officers | - Dte of Trg |
| Sports Medicine Section Information System (SMSIS) | - Dte of Sports |
| Disciplinary Records Management System | - Dte of Leg |
| Accident Details Monitoring System | - Dte of Pro |
| Welfare Management System for Dte of Welfare | - Dte of Welfare |
| Veterans' Training Management Systems | - Dte of VA |
| Information System for Arrested Personnel | - Dte of HR & HL |
| Air Ticketing Information System - Air Travel | - Dte of Mov |
| Ration Management System | - Dte of S&T |
| Fuel Distribution Management System | - Dte of S&T |
| Centralized Medical Stock Management System | - Dte of AMPS |
| Centralized Dental Stock Management System | - Dte of ADS |
| Dental Information Management System | - Dte of ADS |

**විශේෂ අවශ්‍යතා වෙනුවෙන් සකස් කර ක්‍රියාත්මක කර ඇති මෘදුකාංග පද්ධති**

| | |
|---|---|
| Meal Management System | - AHQ Offrs' Mess |
| Weapon Details Management System | - CAAD |
| Virusara Card System | - RSA |
| KIA / WIA Service Personnel Welfare Management System | - RSA |
| Army Para Games System | - Para Committee |
| Vehicles Tracking System | - Ex Cormorant Strike |

**විවිධ විශේෂ අවශ්‍යතා වෙනුවෙන් සංවර්ධනය කරමින් පවතින මෘදුකාංග පද්ධති**

| | |
|---|---|
| Information System for Trade Test Classifications | - Log Command |
| Welfare Management System for Civilian Staff | - Dte of CA |
| Unit Benevolent Fund | - RHQs |
| Ranaviru Apparel Information System | - Ranaviru Apparel |
| Laya Hotel Billing System | - Laya Hotel Headquarters |

අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ක්‍රියාත්මක පර්යේෂණ හා සංවර්ධන අංශය මගින් බහුවිධ ඉංජිනේරු තාක්ෂණයට අදාළව (Electronic/ Electrical/ Software Engineering) ව්‍යාපෘතීන් තුළින් එළිදක්වා ඇත. විවිධ නිර්මාණ යුද්ධ හමුදාවේ විවිධ අංශයන් වෙත ලබාදී ඇති අතර, පහත සදහන් පර්යේෂණ සංවර්ධන ව්‍යාපෘතීන් මේ වන විට නිමකර ඇති අතර, එම ව්‍යාපෘතීන් හි සාර්ථකත්වය යුද්ධ හමුදාධිපති විසින් මහත්සේ ඇගයීමකට ලක්කර ඇත.

පුද්ගලයින් 3 දෙනෙකු එකවර පුහුණුකර විය හැකි සුළු අවි විඩම්භකය (Multiple Integrated Advanced Weapon Simulator)
Mobile Hand Disinfection Unit
Scoring & Marking Solution for PACES 2020
Raffle Draw System

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ 10 වන සංවත්සරය සමරමින් 2020 මාර්තු මස 13 වන දින පිළියන්දල රේණුකා වැඩිහිටි නිවාසයේ වාසය කරනු ලබන වැඩිහිටියන් 30 දෙනෙකු සඳහා උදා සහ දිවා ආහාර සමග භාණ්ඩ පරිත්‍යාගයක් තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලද අතර, එම අවස්ථාව සඳහා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම නිලධාරීන් සහ සෙසුනිලයින් සහභාගී වන ලදි. එමෙන්ම 10 වන සංවත්සරයට සමගාමීව සියලු නිල සුහද හමුවක් වාද්දුව ලායා බීච් හෝටල් පරිශ්‍රය තුළදී අති උත්කර්ෂවත් අන්දමින් දවස පුරා පවත්වනු ලැබු අතර එය නිලධාරි/සෙසුනිලයින්ගේ සහයෝගීතාව වර්ධනයට ඉමහත් පිටුවහලක් විය.







**Multiple Integrated Advanced Weapon Simulator හා Mobile Hand Disinfection Unit යුද්ධ හමුදාපති විසින් නිරීක්ෂණය කරන අවස්ථාව**



බ්‍රිගේඩියර් පී ඒ ජේ පීරිස් එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරි තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක වශයෙන් 2019.12.27 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අවස්ථාව



කර්නල් කේ සී ප්‍රතාපසිංහ ජ්‍යෙෂ්ඨ නිලධාරී තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රථම කර්නල් (තොරතුරු තාක්ෂණ) වශයෙන් 2020.07.07 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අවස්ථාව





රේණුකා වැඩිහිටි නිවාසයේ වාසය කරනු ලබන වැඩිහිටියන් සඳහා ත්‍යාග ප්‍රධානය කිරීම





තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිලධාරීන් සහ සෙසුනිලයින් 10 වන සංවත්සරය සමරමින්

යුගයේ අවශ්‍යතාව මත නව්‍යකරණය කරා පියනගන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ සංඥා බළකාය ඉටුකරනු ලබන නිහඬ හා අද්විතීය සේවාවන් හි තවත් එක් පැතිකඩක් එළිදැක්වීම සඳහා සංවිධානය කරන ලද මෘදුකාංග හඳුන්වාදීමේ වැඩසටහන "FINGER SWIFT" නමින් 2020 සැප්තැම්බර් මස 07 වන දින ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන හා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා මූලස්ථානයේදී පවත්වන ලදි. තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂගේ මගපෙන්වීම යටතේ මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ මෘදුකාංග සංවර්ධන හා ඉංජිනේරු අංශය විසින් නිර්මාණය කරන ලද මෘදුකාංග රාශියක් හඳුන්වාදීම මෙහිදී සිදුවූ අතර, අභිනවයෙන් හඳුන්වාදෙන ලද යුද්ධ හමුදා රෝහල් තොරතුරු පද්ධතිය (Army Hospital Information System) හි අඩංගු තොරතුරු යුද්ධ හමුදා සාමාජිකයින්ට පහසුවෙන් ලබාගැනීම සඳහා හඳුන්වාදී ඇති Sri Lanka Army Patient Portal (SLAPP) අදාළ ජංගම දුරකථන යෙදවුම යුද්ධ හමුදාධිපතිගේ සුරතින් එළිදැක්වීම එහිදී සිදුවිය. එහිදී යුද්ධ හමුදාධිපති විසින් සංඥා බළකාය මගින් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සිදුකරන විශිෂ්ට සේවාව විශේෂ ඇගයීමකට ලක්කරන ලද අතර, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා සිදුකරනු ලබන සියලුම කටයුතු හා ව්‍යාපෘතීන් සඳහා යුද්ධ හමුදා මූලස්ථාන මට්ටමින් ලබාදිය යුතු සියලුම පහසුකම් ලබාදීම සඳහා කටයුතු කරන බව අවධාරණය කරන ලදි.










තොරතුරු තාක්ෂණ යුගයේ අභියෝගාත්මක හෙට දිනයේ අභිමානයෙන් යුතු හමුදාවක් ලෙස වෘත්තීය දැනුමෙන් සන්නද්ධව, තාක්ෂණය සමග නව මානයන් ඔස්සේ මතුවන සියලු අභියෝග ජය ගැනීමට තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ඉටුකරනු ලබන සුවිශාල කාර්යභාරය ශ්‍රී ලංකා සංඥා බළකායේ කීර්තිය වර්ධනය කිරීමට ද මහත් වූ පිටුවහලක් වනු නොඅනුමානය.

# සංඥා බළසේනා මූලස්ථානය



**බ්‍රිගේඩියර්**
**ඩබ්ලිව් එල් ප්‍රේමසිරි යූඑස්පී**
**සංඥා බළසේනාධිපති**

ශ්‍රී ලංකාව තුළ ඇතිවූ ත්‍රස්තවාදී අරගල හේතු කොටගෙන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ව්‍යාප්තියත් සමග අණදීමේ හා පාලන කටයුතු ක්‍රමවත්ව ඉටුකිරීම සඳහා අවැසි සංඥා සම්බන්ධතාව ඉටුකිරීමේ අරමුණින් 1988/06/01 වන දින ප්‍රධාන සංඥා නිලධාරී අධ්‍යක්ෂක මණ්ඩලය/ සංඥා බළසේනාව වශයෙන් යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරම්භ කරන ලද අතර, මානුෂීය මෙහෙයුම් ආරම්භ කිරීමත් සමග සංඥා බළසේනා මූලස්ථානයක් වශයෙන් ස්වාධිනව 2008.08.11 දින සිට මෙම මූලස්ථානය රාජකාරී කිරීම ආරම්භ කරන ලදි. බළසේනාව ආරම්භයේ සිට දිවයිනේ පැවති යුධමය කාලවකවානුව තුළ බළකායට ආවේණික සන්නිවේදන රාජකාරී ඉටුකිරීමෙන් සහ ඉදුරාම ක්‍රියාන්විත රාජකාරීවල යෙදීමෙන් සමස්ත යුද්ධ හමුදාව තුළ සංඥා බළකාය ප්‍රශංසාවට ලක්ව ඇත.

යුධමය කාලවකවානුවෙන් පසු එවකට ආධාරක බළඇණි වශයෙන් පැවති ඒකක වෘත්තිය සංඥා ඒකක බවට පරිවර්තනය වෙමින් ශ්‍රී ලංකා සංඥා බළකාය තව දුරටත් පුළුල් වූ අතර, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත අවැසි සන්නිවේදන අවශ්‍යතා නව තාක්ෂණයෙන් යුතුව ඉතා උසස් මට්ටමින් ඉටු කිරීමේ භාරදූර වගකීම මෙම බළසේනා මූලස්ථානය වෙත පැවරී ඇති අතර, වාර්ෂිකව යුද්ධ හමුදා මූලස්ථානය වෙතින් වෙන් කරන ප්‍රතිපාදන ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය වෙතින් මනාව පාලනය කරමින් ලබාදෙන උපකරණ හා පද්ධති භාවිතයෙන් මේ වන විට ඉතා සාර්ථකව එම වගකීම ඉටුකරමින් පවතී.

2020 මාර්තු මස සිට රට තුළ පවතින කොවිඩ් 19 හෙවත් නව කොරෝනා වෛරසය හේතු කොටගෙන 2020 වර්ෂයේ සංඥා බළසේනා මූලස්ථානයේ මූලිකත්වයෙන් පැවැත්වීමට සැලසුම් කර තිබූ වැඩසටහන් රාශියක් ප්‍රමුඛතාවය මත වෙනස් කිරීමකට භාජනය කර යුද්ධ හමුදාව වෙතින් පවත්වාගෙන යනු ලබන පූනානි, කන්දකාඩු, කහගොල්ල හා වැලිකන්ද ඇතුළු සියලුම නිරෝධායන මධ්‍යස්ථාන සහ තවත් රෝහල් ගණනාවකට අවශ්‍ය සන්නිවේදන පහසුකම් සපයමින් කොරෝනා උවදුර මැඩපැවැත්වීමෙහි ලා දායකත්වය දැක්වීමට සංඥා බළසේනා මූලස්ථානයට හැකිවී තිබේ.



2020.01.01 දින බළසේනාධිපතිගේ ප්‍රධානත්වයෙන් පැවති වසරේ වැඩ ආරම්භ කිරීමේ දින දිවුරුම් දීමේ අවස්ථාව



2020.01.11 දින සංඥා බළකාය මගින් පැවැත්වූ චිත්‍ර ප්‍රදර්ශනය විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වීම



2020.01.18 දින සංඥා බළසේනා මූලස්ථානය ප්‍රධානත්වයෙන් පැවති අටවිසි බුද්ධ ප්‍රතිමා තැන්පත් කිරීමේ අවස්ථාව



2020.05.28 දින 2(සේවි) ශ්‍රී ලංකා සංඥා බළකායේ කඳවුරු සංචාරය අතරතුරදී සමරු පොත සටහන් කළ අවස්ථාව

## සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය

සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සංඥා බළකායෙහි ඒකකයන් 11 ක් සංඥා පාසල ඇතුළත්ව අනෙකුත් සංඥා බළකායට අයත් ස්වාධීන ආයතනයන්හී පාලන සහ පරිපාලන වගකිම් ඉටුකරමින් සංඥා බළකායෙහි අභිවෘද්ධිය උදෙසා වු කාර්යභාරය මනාව සනිටුහන් කරනු ලබයි. පසුගිය වර්ෂය තුළ සංඥා බළකායෙහි ඒකකයන්හී පාලන පරීක්ෂාවන් සිදුකිරීම, සෙසුනිලයන්ගේ නිල උසස් කිරීම ප්‍රමුඛ අනිකුත් සියලු පාලන කටයුතු සිදුකර ඇත.



රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයෙහි මර්කරී ඔසු උයනේ සංඥා බළකාධිපති විසින් 2019.10.19 වන දින පැලයක් රෝපනය කළ අවස්ථාව




රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රය වෙත පිවිසුම් ස්ථානය "Home of Signal" ප්‍රතිමා නාමපුවරුව සංඥා බළකාධිපති විසින් 2019.10.10 විවෘත කළ අවස්ථාව





සංඥා බළකායෙහි නිලධාරී/ සෙසුනිලයින්ගේ කලා දක්ෂතා ඔප්නැංවීම සඳහා පවත්වන ලද "සෙබල සිතුවම්" චිත්‍ර ප්‍රදර්ශණය ජේඩීඒ පෙරේරා කලාගාරයේදී 2020.01.11 සහ 12 දින යුද්ධ හමුදාපතිගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද අවස්ථාව





අටවිසි බුදු පිළිම වහන්සේලා බෝධීන් වහන්සේ අභියස තැම්පත් කිරිම, සංඥා බළකා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරී, සෙසුනිලයින් හා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ සභාපතිණීය ඇතුළු සාමාජිකයින්ගේ දායකත්වයෙන් 2020.01.18 වන දින සිදුකළ අවස්ථාව

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක ලෙස රාජකාරී සිදුකරන මේජර් ජෙනරාල් ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී නව සංඥා බළකාධිපති වශයෙන් සිය තනතුරේ වැඩ භාරගැනීම 2020.02.26 වන දින මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සිදුවූ අතර, ඒ සඳහා සම්මාන මුරය සහ සම්මාන පෙළපාලිය සහ සියලු නිලයන් ඇමතීම සිදුවිය.

















11 වන සංඥා රෙජිමේන්තුව විසින් 'Refresh Hub' නමින් නැවුම් පලතුරු හලක් සංඥා බළකාධිපතිගේ ප්‍රධානත්වයෙන් 2020.07.27 වන දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී විවෘත කරන ලදි.





යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානිගේ පාලන පරීක්ෂාව 2020.09.24 වන දින මෙම සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්වු අතර, එම ජ්‍යෙෂ්ඨ නිලධාරි පිළිගැනිම සංඥා බළකාධිපතිගේ ප්‍රධානත්වයෙන් සිදුවිය.

















2020.09.23 වන දින නව සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් කර්නල් පී පී ඒ ගුණසේකර යුඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ මොහොත



2020.09.23 වන දින ලුතිනන් කර්නල් බී ඩී ප්‍රනාන්දු යුඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක තනතුරේ රාජකාරී ආරම්භ කළ අවස්ථාව



2020.09.17 වන දින ලුතිනන් කර්නල් එච් කේ යු නදික යුඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී ප්‍රථම මානි 1 (රණසේවා) තනතුරේ රාජකාරී ආරම්භ කළ අවස්ථාව



2020.10.05 වන දින ලුතිනන් කර්නල් බී පී උඩගේ යුඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී මානි 1 (පාලන) තනතුරේ රාජකාරී ආරම්භ කළ අවස්ථාව




2020.10.05 වන දින ලුතිනන් කර්නල් එල් යු අයි ලොකුසූරිය ජ්‍යෙෂ්ඨ නිලධාරී මානි 1 (භකාස) තනතුරේ රාජකාරී ආරම්භ කළ අවස්ථාව



2020.10.19 වන දින මේජර් ආර් ඩී ආර් එම් ප්‍රනාන්දු ආර්එස්පී යුඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී විධායක අධිකාරී තනතුරේ රාජකාරී ආරම්භ කළ අවස්ථාව



2020.07.27 වන දින මේජර් එම් ඒ එස් එස් මුතුගොඩ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී මානි 11 (පාලන) තනතුරේ රාජකාරී ආරම්භ කළ අවස්ථාව

# 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය

1943 ඔක්තෝම්බර් මස 19 වන දින අංක 9183 ගැසට් පත්‍රය මගින් 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය සිලෝන් සංඥා බළකාය නමින් පිහිටුවන ලදි. ඉන් අනතුරුව රටේ විවිධ ක්‍රියාන්විත/ක්‍රියාන්විත නොවන අවශ්‍යතාවන් සඳහා සංඥා සම්බන්ධතාව ලබාදීමට 1 වන සංඥා රෙජිමේන්තුව ක්‍රියාකල අතර, පනාගොඩ/ මඩකලපුව/ මින්නේරිය/ වැලිඔය සහ ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයන්හී ස්ථානගතව සිට මානුෂිය මෙහෙයුමෙන් අනතුරුව වර්තමානයේ මුලතිව් දිස්ත්‍රික්කයේ වට්ටප්පලෙයි ප්‍රදේශයේ ස්ථානගතව ඇති අතර, ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) සහ ඒ යටතේ ඇති සේනාංක මූලස්ථාන, බළසේනා මූලස්ථාන, ඒකක මෙන්ම අනෙකුත් යුද්ධ හමුදා මූලස්ථාන/ අනුඛණ්ඩ සඳහා සංඥා සම්බන්ධතාවය ලබා දෙමින් හා නවීන තාක්ෂණය භාවිතා කරමින් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමග සම්බන්ධතාවයෙන් කටයුතු කර ෆයිබර් ඔප්ටික් තාක්ෂණය ඔස්සේ ආසේමු බළප්‍රදේශය තුළ අන්තර්ජාල පහසුකම් සහිත දත්ත සන්නිවේදන පහසුකම් ඇතිකරමින් සංඥා සම්බන්ධතාවන් වැඩිදියුණු කිරීමේ කටයුතු සිදුකරනු ලබන 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය වසර 76 ක අභිමානවත් ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියයි.



ලුතිනන් කර්නල්
එච් පී ජේ ටී පෙරේරා
ආර්එස්පී
අණදෙන නිලධාරී



අභිනවයෙන් ඉදිකළ රාජකාරී කාර්යාලය අණදෙන නිලධාරීගේ සහභාගිත්වයෙන් 2020.02.27 වන දින විවෘත කරන ලද අවස්ථාව



අණදෙන නිලධාරී වශයෙන් රාජකාරී කරනු ලැබූ ලුතිනන් කර්නල් ටී එස් ලියනගුණවර්ධන ජ්‍යෙෂ්ඨ නිලධාරී නික්මයාම වෙනුවෙන් පවත්වනු ලැබූ සම්මාන පෙළපාලිය






නව අණදෙන නිලධාරී වශයෙන් ලුතිනන් කර්නල් එච් පී ජේ ටී පෙරේරා ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2020.03.08 වන දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අවස්ථාව





2020.03.15 වන දින සංඥා බළකාධිපතිගේ මෙම ඒකක සංචාරය





ඒකකයේ නිලධාරීන්ගේ මූලික සංඥා දැනුම වර්ධනය කිරීම සඳහා 2020.04.27 දින සිට 2020.05.04 දක්වා සංඥා පුහුණු සංස්කරණ පාඨමාලාවක් පැවැත්වූ අවස්ථාව





2020.06.09 වන දින ප්‍රධාන සංඥා නිලධාරීගේ මෙම ඒකක සංචාරය





2020.06.15 වන දින නව රෙජිමේන්තු සැරයන් මේජර් ලෙස බනි 11 කුමාර ආර් පී එන් එල් බලලත් නිලධාරී වැඩ භාර ගන්නා ලද අවස්ථාව

# 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය



ලුතිනන් කර්නල්
එන් පී ඒ මෙන්ඩිස් පීඑස්සී
අණදෙන නිලධාරී

වසර 31 ක ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන 3 වන සංඥා රෙජිමේන්තුව එහි ආරම්භය සනිටුහන් කළ වර්ෂ 1989 ක්වූ මාර්තු මස 09 වන දින පටන් මේ දක්වා වූ දීර්ඝ කාලය මුළුල්ලේ මාතෘභූමිය හා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙනුවෙන් ඉටුකළා වූ අභිමානවත් සේවය පිළිබදව නිහතමානීව ආඩම්බරයට පත්වන්නෙමු.

මෙම රෙජිමේන්තුව ආරම්භ කළ දින සිට මාතෘභූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාව උදෙසා ත්‍රස්තවාදයට එරෙහිව සිදුකළ යුද්ධයෙහි විජයග්‍රාහී දිනය වන 2009 මැයි මස 18 දින දක්වාත් එතැන් පටන් මේ දක්වා සියලු ශ්‍රී ලාංකිකයින් අත්විදින සාමකාමී වාතාවරණය තුළත් නිසි සංඥා සම්බන්ධතාවන් පවත්වමින් සංඥා රාජකාරීන් මෙන්ම පාබල රාජකාරීන්ද ඉටුකරමින් විවිධ වූ තාක්ෂණික ඥානයෙන් මෙන්ම අඛණ්ඩවූ කැපවීමෙන් ජාතිය ගොඩනැගීමේ මහගු ක්‍රියාදාමයට ද දායක වෙමින් මෙම රෙජිමේන්තුවෙහි සියලුම නිලයින් විසින් ඉමහත් වූ ශ්‍රමයෙන්, කාය දානයෙන් හා ප්‍රාණ දානයෙන් ඉටුකළ සේවය අමිල වේ. අනුපමේය වේ. ගෞරවණීය වේ.

පැවති යුද්ධයෙහි අත්දැකීමෙන් ලද පන්නරය තුළින් වර්ධනය කරගත් වෘත්තීය නිපුණත්වයෙන් පරිපූර්ණ සාමකාමී නව මගකට පිවිස නව තාක්ෂණයද සමගින් උරෙනුර ගැටෙමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ සන්නිවේදන තාක්ෂණය හා එම සේවා පහසුකම් සැපයිමෙහිලා දැඩි කැපවීමකින් හා ඉතා උසස් මට්ටමකින් රාජකාරීන් ඉටුකළ මෙම රෙජිමේන්තුව එතුළින් ගොඩනගාගත් විශ්වාසයද සමගින් මේ වනවිට රාජකාරීන් ඉටුකරන ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) බලප්‍රදේශය තුළද සුවිශේෂී ගෞරවයක් හිමි කරගෙන සිටී. මේ අතර, ඒකක 31 වන සංවත්සරයට සමගාමීව සිවිල් සේවක මහතුන් සඳහා අභිනවයෙන් ඉදිකල සිවිල් සේවක විවේකාගාරය අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එන් පී ඒ මෙන්ඩිස් පීඑස්සී විසින් 2020 මාර්තු මස 09 වන දින විවෘත කරන ලදි. එසේම ආසේමු (යාපනය) යටතේ පාලනය වන සේමු, බසේමු, ඒකක හා අනුකණ්ඩයන්හි පහසුව වෙනුවෙන් ඒකකය තුළ අභිනවයෙන් ඉදිකරන ලද ඒකක ගුවන් විදුලි උපකරණ ගබඩාව මෙන්ම සී කණ්ඩය හා ජනක යන්ත්‍ර ගබඩාවද 2020.05.24 වන දින ඒකක අණදෙන නිලධාරී විසින් විවෘත කරන ලදි.

යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයෙහි අධීක්ෂණය යටතේ එම බලප්‍රදේශය තුළ ඇති පාබල ඒකකයන්හි විශේෂ පාබල ක්‍රියාන්විතයන් හී නිරත විය හැකි සෙබළුන් පිරිසක් බිහි කිරීමේ අරමුණින් පසුගිය වසර තුළ විශේෂ පාබල ඛණ්ඩ පුහුණු පාඨමාලාවන් 4 ක් සඳහා සංඥා අදියරයන් 4 ක් පවත්වා ඔවුන්ගේ සන්නිවේදන දැනුම වර්ධනය කර දීමට ක්‍රියාකරන ලදි. මෙම රෙජිමේන්තුව සංඥා බළකාය තුළ ඇති අනෙකුත් සංඥා රෙජිමේන්තු සමග මනා සම්බන්ධතාවයෙන් යුතුව රාජකාරීන් කරනු ලබන අතර, ඒකකයේ සුබසාධන හා පාලන රාජකාරීන් විධිමත්ව පවත්වාගෙන යමින් විවිධ ක්‍රීඩා තුළින් ජාතික මට්ටමේ දක්ෂ ක්‍රීඩකයින්ද බිහිකරමින් සංඥා බළකායට ඉමහත් ගෞරවයක් ගෙනදී ඇත.

2020 මාර්තු මස 09 දිනට යෙදුණු මෙම රෙජිමේන්තුවේ අභිමානවත් 31 වන සංවත්සරය ඉතා චාම් අයුරින් පැවැත්වූ අතර, සංවත්සර උළෙලට සමගාමීව පැවැත්වූ වැඩසටහන් මාලාවේ පළමු අදියර ලෙස 2020.03.01 හා 02 යන දිනයන්හිදී අන්තර් බළඝණ ක්‍රීඩා තරගාවලියක් පැවැත්වීමටත් 2020.03.04 දින මෙම රෙජිමේන්තුවේ සේවය කරමින් රට ජාතිය වෙනුවෙන් කාය දානයෙන් හා ප්‍රාණ දානයෙන් තම දිවි කැපකළ රණවිරුවන් සහ සියලු ආබාධිත රණවිරුවන් සිහිපත් කරමින් ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් බෝධිපූජා පිංකමක් නවීකරණය කරන ලද රෙජිමේන්තු බුදුමැදුර අභියස පවත්වා එදිනම හින්දු කෝවිල් පූජාවක් මාවඩ්පුරම් කෝවිලේදී පැවැත්වීමටත් කටයුතු කරන ලදී. තවද යාපනය ප්‍රදේශයේ අසරණ රෝගීන් සඳහා ලේ දන් දීමේ වැඩසටහනක් යාපනය ලේ බැංකුව සමඟ සම්බන්ධතාවයෙන් යුතුව 2020.03.05 වන දින රෙජිමේන්තු මූලස්ථානයේදී ඉතා සාර්ථක ලෙස පැවැත්වූ අතර, රෙජිමේන්තුවේ රාජකාරීන්හි නියුතු නිලධාරීන්, සෙසුනිලයින් හා සිවිල් සේවක මහතුන් මෙන්ම අවට ඒකකයන්හී සාමාජිකයින්ද පින් සිතින් දායකත්වය ලබා දෙන ලදි. 2020.03.09 දින ගෞරව අභිමානය පෙරදැරිව අණදෙන නිලධාරී වෙත සම්මාන මුරය සහ සම්මාන පෙළපාලිය පිරිනමන ලද අතර, සියලු නිල දිවා භෝජන සංග්‍රහයක්ද පවත්වන ලදි. ඉන් අනතුරුව සංවත්සර උළෙලේ අවසාන අංගය ලෙස සියලු නිලයින්ගේ සුහද හමුව 2020.03.13 වන දින කොනොනි සමාජශාලාවේදි අති උත්කර්ෂවත් අන්දමින් පවත්වමින් සංවත්සර වැඩසටහන නිමා කරන ලදී.

තවද 2020 මාර්තු මස මුල් භාගයේදි ශ්‍රී ලංකාව තුළද වර්ධනය වූ Covid -19 හෙවත් කොරෝනා වසංගතය පැතිරයාමේ අවදානම ආරම්භවීමත් සමඟ යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පී ආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී ජ්‍යේෂ්ඨ නිලධාරීගේ මගපෙන්වීම යටතේ ප්‍රථම නිරෝධායන මධ්‍යස්ථානය විඩත්තපලෙයි 52 සේමු පුහුණු පාසල යොදා ගනිමින් 2020.03.22 වන දින නිරෝධායන කටයුතු ආරම්භ කළ අතර, එම මධ්‍යස්ථානයට අවශ්‍ය දුරකථන පහසුකම් අන්තර්ජාල පහසුකම් සැටලයිට් ටීවී පහසුකම් සහ සීඩීඑම්ඒ දුරකථන පහසුකම් කඩිනමින් ස්ථාපනය කිරීමටත් එම මධ්‍යස්ථානයට අවශ්‍ය ජන ඇමතුම් උපකරණද ඉතා කඩිනමින් එම ස්ථානයෙහි ස්ථාපනය කිරීමටත් කටයුතු කරන ලදි.

තවද මේ වසංගතය සීඝ්‍රයෙන් පැතිරයාමත් සමග අයියකච්චි ප්‍රදේශයේ 12 විපාරෙ ඒකකයේද, 1 යාපාරෙ ඒකකයේද, 4 ශ්‍රීලයුපොහේබ නිවාඩු නිකේතනය පලාලි යන ස්ථානයන්හීද තවත් නිරෝධායන මධ්‍යස්ථාන ස්ථාපනය කළ අතර, එම මධ්‍යස්ථාන සඳහාත් දුරකථන පහසුකම් අන්තර්ජාල පහසුකම් සැටලයිට් ටීවී පහසුකම් සහ සීඩීඑම්ඒ දුරකථන පහසුකම් ලබාදිමටත් එම ස්ථානවලට තාක්‍ෂණික සෙනින් රඳවමින් හා අණදෙන නිලධාරී ඇතුළු අනෙකුත් නිලධාරීන්ද එම ස්ථාන වෙත යමින් එම මධ්‍යස්ථානයන් වෙත 3 වන සංඥා රෙජිමේන්තුවට පැවරී ඇති කාර්යයන් සාර්ථකව ඉටුකරන ලදී. තවද 2020.04.21 වන දින වැලිසර නාවික හමුදා භටයින් හට එම වසංගතය වැළදිමත් සමග සියලුම ආරක්‍ෂක අංශයන්හි සාමාජිකයින් කඳවුරුවලට සීමාකිරීමත් සමග 3 වන සංඥා රෙජිමේන්තුව තුළ කොරෝනා මධ්‍යස්ථානයක් ලෙස පුහුණු අංශ ගොඩනැගිල්ලද ඉන් පසුව රෙජිමේන්තු මුලස්ථාන හට නිවාසයද පවත්වා ගනිමින් නිරෝධායන කටයුතු සිදුකරමින් රාජකාරී ඉටු කරන ලදී.

අවසන් වශයෙන් වසර 31 ක කඩඉම පසුකර 32 වන වසරට පා තබා සිටින මෙම ඒකකය ආරම්භයේ සිට මේ දක්වා පැමිණි ගමන් මගෙහි සාර්ථකත්වයට දායක වෙමින් දිවිහිමියෙන් රාජකාරී කළ සියලුම නිලධාරීන් හා සෙසුනිලයින්ද, දැනට රාජකාරියේ යෙදී සිටින සියලුම නිලධාරීන් හා සෙසුනිලයින්ද ඉතාමත් භක්ති ප්‍රණාමයෙන් යුතුව සිහිපත් කරමින් මෙවන් මෙහෙවරක් ඉටුකළ 3 වන සංඥා රෙජිමේන්තුවෙහි නාමය සමස්ත ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ, දිප්තිමත් ඒකකයක් ලෙස, දිනෙන් දින දියුණුවට පත් වේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.



සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම ඒකකය සංචාරය



31 වන සංවත්සරයට සමගාමීව ඒකක අණදෙන නිලධාරී වෙත පිරිනමන ලද සම්මාන පෙළපාලිය



ආසේමු (යා) අඥාපති මේජර් ජෙනරාල් ඩී ඩී යු කේ හෙට්ටිආරච්චි ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී එම තනතුරෙන් නික්මයැමට ප්‍රථම මෙම ඒකක සංචාරය



ආසේමු (යා) ආඥාපති මේජර ජෙනරාල් පී ආර් වනිගසූරිය වීඑස්වී යුඑස්පී එන්ඩීයු යුඑස්ඒසීජීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී එම තනතුර භාරගැනිමෙන් අනතුරුව මෙම ඒකක සංචාරය



ආසේමු යාපනය බලප්‍රදේශය තුළ පැවැත්වු අන්තර් ඒකක නිවේදන තරගාවලියේ ප්‍රථම ස්ථානය හිමිකරගත් සෙ/279223 මා/සැ සෙනරත් ආර්අයිපී ජ්‍යකොනොනි යුද්ධ හමුදාපති වෙතින් ත්‍යාග ලබාගත් අවස්ථාව

# 4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය



ලුතිනන් කර්නල්
එම් ඒ ඩී එස් මුතුගල යූඑස්පී
අණදෙන නිලධාරී

වර්ෂ 1991 ජුනි මස 05 දින ආරම්භ කර වසර 29 ක අභිමානය සමරනු ලබන 4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය මේ වන විට ආසෙමු (වන්නි) බලප්‍රදේශයේ අණ හා පාලනයට අවශ්‍ය සන්නිවේදන සේවාව සැපයීමේ රාජකාරිය නොපිරිහෙලා ඉටුකරනු ලබයි. සමස්ත දිවයිනේ වර්ග කි:මි: 6510 ආවරණය කරන භූමි ප්‍රදේශයක් ආසෙමු (වන්නි) බලප්‍රදේශයට අයත් වන අතර, එය සමස්ත භූමි ප්‍රදේශයෙන් 1/10 ක් වේ. මේ යටතේ සේනාංක 04 ක්, ඉනපෙ(උතුරු මැද), බළසේනා 13 ක්, රෙජිමේන්තු මධ්‍යස්ථාන 02 ක්, ඒකක 27 ක්, පුහුණු පාසැල් 06, යුහ රෝහලක් මෙන්ම අභිමංසල සුවසහන නිකේතනයක් ස්ථානගතව ඇති අතර, මෙම සියලුම ආයතන වල සංඥා අවශ්‍යතාවයන් ඉටුකරනු ලබයි.

රෙජිමේන්තු අධිපති වශයෙන් රාජකාරී කළ මේජර් ජෙනරාල් එන් එම් හෙට්ටිආරච්චි වීඑස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී ස්වකීය තනතුරෙහි රාජකාරී නිමාව සනිටුහන් කරමින් 2020.03.17 වන දින මෙම ඒකක කඳවුරු සංචාරයක් සිදුකරන ලදි. එහිදි හමුදා සාම්ප්‍රදායානුකූල සම්මාන මුරය පවත්වන ලද අතර, පැළ රෝපණය කිරීමද සිදුකරන ලදි. මෙතෙක් මෙම ඒකකයට විශාල අඩුවක්ව පැවති නිලධාරී නිවස්නයේ ප්‍රථම අදියරද එම සංචාරයට සමගාමීව විවෘත කරන ලදි.

පුරා වසර 2 කට අධික කාලයක් මෙම ඒකක අණදෙන නිලධාරී තනතුර හෙබවූ ලුතිනන් කර්නල් පී පී සී පෙරේරා පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ සේවය ඇගයීම වස් 2020.02.21 දින අභිමානවත් සම්මාන මුරය හා සම්මාන පෙළපාලිය පවත්වා පැළ රෝපණය කිරීම සිදුකරන ලදි. ශ්‍රී ලංකා සංඥා බළකායට මෙන්ම සමස්ත යුද්ධ හමුදාවටම කීර්තියක් අත්පත් කර දෙමින් ජාත්‍යන්තර මට්ටමේ මුයිතායි ක්‍රීඩකයන් බිහිකිරීම වස් මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී ශ්‍රී ලංකා යුද්ධ හමුදා මුයිතායි පුහුණු සංචිතයේ විශේෂඥ පුහුණුකරු වශයෙන් රාජකාරී කරනු ලබයි.

ඒකකයේ 19 වැනි අණදෙන නිලධාරී වශයෙන් ලුතිනන් කර්නල් ඒ එම් ටි අමරකෝන් පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී 2020.02.29 වැනි දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කරන ලදි. රාජකාරී ආරම්භ කිරීමට සමගාමීව නව අණදෙන නිලධාරී වෙත සම්ප්‍රදායාණුකූල සම්මාන මුරය පවත්වන ලද අතර, පැළ රෝපණය කිරීම සිදුකරන ලදි. ඉන් අනතුරුව සියලු නිල තේ පැන් සංග්‍රහය පවත්වා භට පිරිස් ඇමතීම සිදුකරන ලදි.

නව රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී සංඥා රෙජිමේන්තු අධිපති තනතුර භාරගැනීමෙන් පසු 4 ශ්‍රීලංසංබ ඒකකයේ සිදුකරන ලද ප්‍රථම කඳවුරු සංචාරය 2020 මාර්තු මස 16 වැනි දින සිදුකරන ලදි. අභිමානවත් සම්මාන මුරය පවත්වා නව රෙජිමේන්තු අධිපතිතුමන් පිළිගැනිමෙන් අනතුරුව, පැළ රෝපණය, භට පිරිස් ඇමතීම, සියලු නිල තේ පැන් සංග්‍රහය හා මෙම ඒකක අණදෙන නිලධාරී ඇතුළු සියලු නිලධාරීන්/ සෙසුනිලයින් විසින් සමරු තිළිණයක්ද ලබා දෙන ලදි.





ප්‍රධාන සංඥා නිලධාරී/ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් එන් එම් හෙට්ටිආරච්චි වීඑස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2020.02.15 දින මෙම ඒකකයේ සිදුකරන ලද සංචාරය





ලුතිනන් කර්නල් පී පී සී පෙරේරා පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී අණදෙන නිලධාරී වශයෙන් රාජකාරී සිදුකර තනතුර අත්හැරීමේ අවස්ථාව





2020.05.30 දින සංඥා බළසේනාධිපති හා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ මෙම ඒකක සංචාරය





ඒකකයේ 19 වැනි අණදෙන නිලධාරී වශයෙන් ලුතිනන් කර්නල් ඒ එම් ටී අමරකෝන් පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2020.02.29 වන දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කරන ලද අවස්ථාව





නව සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම ඒකක සංචාරය







ඒකකයේ 20 වන අණදෙන නිලධාරී ලෙස ලුතිනන් කර්නල් එම් ඒ ඩී එස් මුතුගල යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2020.08.12 වන දින සුබ මොහොතින් රාජකාරි ආරම්භ කළ අවස්ථාව









අතිගරු ජනාධිපතිගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක කරනු ලබන උපාධිධාරීන් 50000 ක් පුහුණු කිරීමේ පළමු අදියර යටතේ මෙම ඒකකය වෙතින් කාන්තා උපාධිධාරිනියන් 44 දෙනෙකු සාර්ථකව නායකත්ව පුහුණුව හදාරූ අතර, 2020.10.03 වන දින පුහුණුව නිමා කර පිටත්ව යන ලද අවස්ථාව

# 5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය



ලුතිනන් කර්නල්
ඩී එම් අයි එස් බණ්ඩාර
අණදෙන නිලධාරී

මෙම ඒකකය දැනට ආසේමු (බටහිර) බලප්‍රදේශයේ දිස්ත්‍රික්ක 9 කට අයත් සේමු/බසේමු/ඒකක හා පුහුණු පාසල් ආවරණය වන පරිදි සංඥා රාජකාරී ඉටුකරමින් සිටි. සංඥා රාජකාරීන් සිදුකිරීමේදී උත්සව අවස්ථාවන් සඳහා ඇවැසි ජන ඇමතුම් සේවාවන්, ගුවන් විදුලි ක්‍රියාකරුවන්ගේ සේවය මෙන්ම දුරකථන මාර්ග නඩත්තු සේවාව දැනට සාර්ථකව සිදුකරමින් පවති.

ඒකකයේ ප්‍රධාන කාර්යභාරය සංඥා රාජකාරීන් වුවද 2019 අප්‍රේල් මස 21 වන දින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය සමගින් යුද්ධ හමුදා මුලස්ථානය මගින් නවතමයෙන් ස්ථාපිත කරන ලද කොට්ඨාශ මුලස්ථාන (කොමු 10) ට අයත් පාදුක්ක, හංවැල්ල, අවිස්සාවේල්ල සහ කොස්ගම ප්‍රදේශයන්හි සිවිල් ජනයාගේ ආරක්ෂක කටයුතු මේ වන විටත් සිදුකරන අතර, මීට අමතරව එම ප්‍රදේශයන්හී ස්ථාපිත රාජ්‍ය ආයතනයන්, පෞද්ගලික ආයතනයන්හී සහ එම ප්‍රදේශයේ සිවිල් ජනයාගේ සියලු ක්‍රියාකාරම් පිළිබද විස්තර මේ වන විට ඉහළ මුලස්ථානය වෙත ඉදිරිපත් කරමින් පවති.

හදිසි ආපදා තත්වයන්වලදී මෙම ඒකකයේ නිලධාරීන් සහ සෙසුනිලයින් සහභාගි කරවා හදිසි ඇමතුම් අංශයේ දුරකථන ක්‍රියාකරුවන් ලෙස රාජකාරීන්හී යොදවා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය සංඥා සම්බන්ධතාවයන්ද, ක්‍රියාන්විත මැදිරි වෙත අවශ්‍ය සංඥා සම්බන්ධතාවයන් හා ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියාකරුවන් ලබාදීමද නිරන්තරයෙන් සිදුකරනු ලබයි.

Covid 19 වෛරසය ව්‍යාප්තිය වැළැක්වීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබු ක්‍රියාවලිය සාර්ථක කරගැනීම සඳහා කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල වෙත පැමිණෙනු ලබන ගුවන් මගීන් පරීක්ෂාවට ලක්කිරීම සඳහා ස්ථාපිත තාපක කැමරා විමර්ශනය කිරීමේ රාජකාරී සඳහා මේ වන විට සෙනින් යොදවා ඇත. තවද, රාජගිරියේ ස්ථාපනය කරනු ලැබු Covid 19 වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මෙහෙයුම් මධ්‍යස්ථානයේ දුරකථන හුවමාරු රාජකාරී සඳහා සෙනින් යොදවා ඇති අතර, පිටිපන ප්‍රදේශයේ ස්ථානගත කර ඇති නිරෝධායන මධ්‍යස්ථානය සඳහා ජන ඇමතුම්, දුරකථන ඇතුළු Wi-Fi පහසුකම් ලබාදෙමින් මේ වන විටත් මෙම ඒකකය Covid 19 වෛරසය ව්‍යාප්තිය වළක්වාගැනීම වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටුකරමින් පවති.

අණදෙන නිලධාරීගේ මගපෙන්වීම යටතේ ඒකකයේ සියලුම නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ කැපකිරීම සහ නොපසුබට උත්සාහය හේතුවෙන් මෙන්ම සංඥා බළකාධිපති, ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළසේනාධිපතිගේ උපදෙස් පරිදි නිසි අයුරින් රාජකාරීන් ඉටුකිරීම තුළින් බලප්‍රදේශයේ සංඥා සම්බන්ධතාවන් නිසි අයුරු පවත්වා ගැනිමට හැකියාව ලැබී ඇත. සංඥා රාජකාරීන්ට අමතරව ප්‍රදේශයේ සිවිල් ජනයාගේ ආරක්ෂාව සහ Covid 19 ව්‍යාප්තිය වළක්වාගැනීම වෙනුවෙන් සිදුකරනු ලබන නිරන්තර කටයුතු හේතුවෙන් මෙම ඒකකය මෙන්ම සංඥා බළකාය හා සමස්තයක් ලෙස යුද්ධ හමුදාවේ ප්‍රතිරූපය, දිනෙන් දින සිවිල් ජනයාගේ නිරන්තර පැසසුමට ලක්ව ඇත.





26 වන සංවත්සරයට සමගාමීව 2020.01.23 වන දින ඒකක අණදෙන නිලධාරී වෙත පිරිනැමු සම්මාන මුරය හා සම්මාන පෙළපාලිය





සංඥා බළකාධිපති විසින් 2020.01.23 වන දින මෙම ඒකකයේ නවතමයෙන් ඉදිකරන ලද නිලධාරී නිවස්නය විවෘත කළ අවස්ථාව





ලුතිනන් කර්නල් ඩී එම් අයි එස් බංඩාර ජ්‍යෙෂ්ඨ නිලධාරී අණදෙන නිලධාරී වශයෙන් 2020.04.30 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අවස්ථාව





අණදෙන නිලධාරීගේ පවුලේ අයවළුන්ගේ ධන පරිත්‍යාගයෙන් සහ ඒකකයේ සියලුම නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඒකකයට අඩුපාඩුවක්ව පැවති බුදු මැදුරක් තනවා බුදු පිළිම වහන්සේ නමක් 2020.06.18 දින තැන්පත් කරන ලදි.



5 ශ්‍රීලංසංබ ඒකකයේ අණදෙන නිලධාරී ඇතුළු සියලුම නිලධාරීන් සහ සෙසුනිලයින් සමූහ ඡායාරූපයකට පෙනිසිටි අවස්ථාව





2020.04.15 වන දින නව සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මෙම ඒකක සංචාරය

# 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය



ලුතිනන් කර්නල්
එස් එච් එල් ඩී ප්‍රනාන්දු
අණදෙන නිලධාරී

ලක් දෙරණෙහි වසර 30 කට අධික කාලසීමාවක් තුළ පැවති යුධමය වාතාවරණයෙන් පසු උදාවී ඇති නව ආශ්චර්යය මධ්‍යයේ 23 වන වියට පා තැබූ මෙම ඒකකය සංඥා බළකායේ 2 වන ආධාරක බළඇණිය ලෙස 1997.01.10 වන දින ආරම්භ කරනු ලැබූ 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය 2014.06.16 වන දින ආධාරක බළඇණි රාජකාරීවලින් මිදී තොරතුරු තාක්ෂණ රාජකාරීන් වෙත අනුවර්තනය වී මේ වන විට එම රාජකාරීන් මනාව ඉටුකරමින් සිටී. තම ගෙවී ගිය කාලපරාසයෙහි අතිතාවර්ජනය "ද සිග්නලර්" සඟරාවෙහි පසුගිය කලාපය තුළින් එළිදැක්වූ බැවින් ගෙවී ගිය පසුගිය වසර තුළ සිදුවූ විශේෂිත සිදුවීම් පමණක් මෙසේ සනිටුහන් කරන්නෙමු.

වත්මන් රාජකාරීන් යටතේ මෙම ඒකකය ආසේමු (යාපනය) බලප්‍රදේශයේ යාපනය නගර මධ්‍යයේ ඉතා අලංකාර භූමි ප්‍රදේශයක අභිනවයෙන් ඉදිකරන ලද කඳවුරු භූමියක ස්ථානගතව ඇති අතර, මෙම ඒකක අණදෙන නිලධාරී වන ලුතිනන් කර්නල් එස් එච් එල් ඩී ප්‍රනාන්දු යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ අණදීම යටතේ ආසේමු (යාපනය), ආසේමු (වන්නි), ආසේමු (කිලිනොච්චි) හා ආසේමු (මුලතිව්) යන ආරක්ෂක සේනා මූලස්ථානයන්හී තොරතුරු තාක්ෂණ රාජකාරී ආවරණය කරමින්ද උසස් මූලස්ථානයන් වෙතින් පැවරෙන රාජකාරීන් හා වගකීම්ද ඉතා උසස් අන්දමින් ඉටුකරමින් යාපනය ආශ්‍රිතව වෙසෙන සිවිල් වැසියන්ගේද නොමද ප්‍රසාදයට ලක්වෙමින් රාජකාරී ඉටුකරනු ලබයි.

එමෙන්ම ආධාරක බළඇණියක් වශයෙන් 1997.01.10 දින ආරම්භ කළ මෙම ඒකක 23 වන සංවත්සරය 2020.01.10 දිනට යෙදී තිබූ අතර, එයට සමගාමීව පළමු අදියර වශයෙන් මෙම ඒකකය යටතේ ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිට තම ජීවිත පුදකල රණවිරුවන් හට නිවන් සුව ප්‍රාර්ථනා කිරීම සඳහාත් තුවාල ලබා ආබාධිත තත්වයට පත්ව සිටින රණවිරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමින් යාපනය ශ්‍රී නාග විහාරස්ථානයේදී ආගමික වතාවත් සිදුකරන ලදී.

ඒකකය තුළ රාජකාරී කරනු ලබන නිලධාරී/ සෙසුනිලයින්ගේ චිත්ත ධෛර්‍යය වර්ධනය කිරීම සඳහා විනෝද ක්‍රීඩා වැඩසටහනක් වශයෙන් සුහද ක්‍රිකට් තරගයක් පවත්වන ලදී. එදිනම සන්ධ්‍යාවේ සියලු නිලයින්ගේ සහභාගීත්වයෙන් බියර් සාදයක්ද පවත්වන ලදී.

එමෙන්ම ඒකක සෙබළුන්ගේ වෘත්තීය නිපුණතාව වර්ධනය කිරීම සඳහා සහ නිල උසස්කිරීම් සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් වෘත්තීය පරීක්ෂණ I, II සහ III පාඨමාලාවන් ඒකකය තුළදීම පවත්වනු ලැබූ අතර, එමගින් ඔවුන්ගේ වෘත්තීය දැනුම වැඩිදියුණු කිරීමටත් ඉදිරි හමුදා දිවිය සාර්ථක කර ගැනීමටත් කටයුතු උදා කරදෙන ලදී. එමෙන්ම මෙම ඒකකය මගින් රාජකාරී ආවරණය කරනු ලබන බලප්‍රදේශයන්හි වෙනත් ඒකකවල සෙනීන් සඳහා මෙම ඒකකයේ අභිනවයෙන් ස්ථාපිත තොරතුරු තාක්ෂණ සම්පත් කේන්ද්‍රය - යාපනය වෙතින් මූලික පරිගණක පාඨමාලාවක් හා පරිගණක මෝස්තර හා වීඩියෝ සංස්කරණ පාඨමාලාවක් පවත්වා ඔවුන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීමටද කටයුතු කළ අතර, රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු පාසැල කොකාවිල් සහ අනුරාධපුරය මගින් යුද්ධ හමුදා සාමාජිකයින්ට මෙන්ම සිවිල් අයවලුන් සඳහාද පරිගණක පාඨමාලාවන් පවත්වා ඔවුනගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කරමින් සිටී.

මෙම ඒකකය තොරතුරු තාක්ෂණ ඒකකයක් වශයෙන් රාජකාරී ආරම්භ කිරීමෙන් පසු එම රාජකාරී ඉටුකිරීමේ පහසුව සඳහා මෙම ඒකකය තුළ ස්ථාපිත පරිගණක වැඩපල තුළින් සහ කොකාවිල් මූලික පරිගණක වැඩපොළ මගින් මෙම ඒකක බලප්‍රදේශ තුළ පරිගණක අළුත්වැඩියා කිරීම සහ පරිගණක ජාල කටයුතු විධිමත් හා ක්‍රමවත් අයුරින් සිදු කරනු ලබයි.

දැනට ඒකකය සංඥා බළකා පවුලට එක්වී වසර 23 කට වැඩි කාලයක් ඉක්මවා ගොස් ඇති අතර, එම කාලපරාසය තුළ ඒකකයේ සාර්ථකත්වයට අණදෙන නිලධාරීවරුන් 17 දෙනකු නායකත්වය ලබා දී ඇති අතර, වත්මන් අණදෙන නිලධාරීගේ නායකත්වය හා මඟපෙන්වීම යටතේ ඒකකයේ පාලන කටයුතු හා සෙබළුන්ගේ සියලුම සුබසාධක කටයුතු ඉතා උසස් මට්ටමින් ඉටුකිරීමේ හැකියාව ලැබී ඇත. එබැවින් එය ඒකකයේ ඉදිරි ගමන් මගෙහි සාර්ථකත්වයට ඉමහත් පිටුවහලකි.

අවසන් වශයෙන් 23 වන කඩයිම පසුකරමින් 24 වන වියට සාර්ථකව පියමනින 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය ආරම්භයේ සිට මේ දක්වා පැමිණි ගමන් මගෙහි සාර්ථකත්වයට දායක වෙමින් දිවිහිමියෙන් හා කාය දානයෙන් රාජකාරී කළ සියලුම නිලධාරී/ සෙසුනිලයින් හටද, දැනට රාජකාරියේ යෙදී සිටින සියලුම නිලධාරී/ සෙසුනිලයින්ද ඉතාමත් භක්ති ප්‍රණාමයෙන් යුතුව සිහිපත් කරමින් මෙවන් වූ මෙහෙවරක් ඉටුකළ 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකා නාමය සංඥා බළකාය තුළ පමණක් නොව සමස්ත ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ දීප්තිමත් ඒකකයක් ලෙස වැජඹෙන්නට ප්‍රාර්ථනා එක්කරමින් පසුගිය වසරෙහි අතිතාවර්ජනය මෙසේ සමාප්ත කරන්නෙමු.





2019.09.07 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ආඥාපතිගේ මෙම ඒකක සංචාරය





නව සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි 2020.03.13 වන දින මෙම ඒකක සංචාරය





2020.04.16 හා 17 යන දිනයන්හි දී යාපනය නගරය, ගුරුනගර්, අච්චාලේ යන ප්‍රදේශ වල සිවිල් ජනතාව කොරෝනා උවදුර නිසා නිවස් වලට සීමාවී සිටි අවධියේ ඔවුන් උදෙසා වියලි සලාක, එළවළු ඇතුළු ආහාර ද්‍රව්‍ය මළු 2000 ක් බෙදා දීම සිදුකිරීම





ලුතිනන් කර්නල් එස් එච් එල් ඩී ප්‍රනාන්දු ජ්‍යෙෂ්ඨ නිලධාරි අණදෙන නිලධාරී වශයෙන් 2020.09.13 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අවස්ථාව

## 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය



**ලුතිනන් කර්නල්**
**එම් ආර් හම්මි යූඑස්පී**
**අණදෙන නිලධාරී**

වර්ෂ 2008.02.08 වන දින 18 X 525 ක හට පිරිසකින් යුතුව ආරම්භ කරනු ලැබූ 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය මේ වන විට ආසේම (මධ්‍යම) යටතේ දිස්ත්‍රික්ක 6ක සන්නිවේදන සේවාව සැපයීමේ රාජකාරිය නොපිරිහෙලා ඉටු කරනු ලබයි. 2014.12.26 වන දින සියලු නිලයන්ගේ අප්‍රතිහත ධෛර්යය මත දියතලාව මැණික්කන්ද ප්‍රදේශයේ දර්ශනීය භූමිභාගයක් තුළ වර්තමානය වන විට අංගසම්පූර්ණ රෙජිමේන්තුවක් වශයෙන් ගොඩ නැගී ඇත.

ඒකක 12 වන සංවත්සරයට සමගාමීව 2020.02.03 වන දින සියලු නිලයන්ගේ සහභාගිත්වයෙන් ඒකකයට බුදුපිළිම වහන්සේ නමක් වැඩමවීම සහ එක් දින භාවනා වැඩසටහනක් පවත්වන ලද අතර 2020.02.08 වන දින ඒකකයේ අණදෙන නිලධාරී වන ලුතිනන් කර්නල් එම් ආර් හම්මි යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී හට සම්මාන මුරය, සම්මාන පෙලපාලිය පිරිනැමීම හා මියගිය 7 වන සංඥා රෙජිමේන්තුවේ රණවිරුවන් 18 දෙනෙකු සිහිපත්වීම වෙනුවෙන් පැළ 18 ක් රෝපණය කිරීම සිදුකරන ලදී.

2020.02.16 වන දින යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරී/ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් එන් එම් හෙට්ටිආරච්චි ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ජේඑස්සී එච්ඩීඑම්සී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ කඳවුරු සංචාරය සිදුකරන ලද අතර යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූල සම්මාන මුරයකින් පිළිගන්නා ලදී.

2020.05.16 වන දින ආසේමු (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව් ඩී සී කේ කොස්තා ආර්එස්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් මෙම කඳවුරු සංචාරය සිදුකරන ලද අතර රටෙහි පවතින කොවිඩ් - 19 වසංගතය වැළැක්වීම සඳහා උපදෙස් ලබා දී ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගයන් එතුමාගේ පැසසුමට ලක්විය. එමෙන්ම මෙම ඒකකයේ රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් 2020.05.20 වන දින සෙ/278475 බනි 1 බිඑඑන් සංජීව ආර්එස්පී පත්වීම් ලබන ලදී. 2020.09.11 වන දින යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් ඩබ්ලිව් පී ඒ කේ තිලකරත්න පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ප්‍රථම කඳවුරු සංචාරය සිදුකරන ලද අතර යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූල සම්මාන මුරයකින් එතුමන්ව පිළිගන්නා ලදී.

දියතලාව - මැණිකන්ද ප්‍රදේශයේ ස්ථානගතව ඇති මෙම ඒකකය වෙතින් ආසේමු (මධ්‍යම) බලප්‍රදේශයට අයත් සේමු, බසේමු, ඒකක සහ පුහුණු පාසල්හී සංඥා සම්බන්ධතාව ආවරණය කරනු ලබන අතර, මෙම ප්‍රදේශය වෙත විශේෂ ප්‍රභූවරුන් නිරන්තරයෙන් පැමිණෙන අවස්ථාවන්වලදී සහ යුද්ධ හමුදාව වෙතින් පවත්වනු ලබන විවිධ උත්සව, සැණකෙළි සහ පුහුණු අභ්‍යාස සඳහා ගුවන් විදුලි යන්ත්‍ර/ ජන ඇමතුම් සේවාව මෙම ඒකකය වෙතින් ලබාදී ඇත. ඒ අතරින් ප්‍රධාන වශයෙන් ඉන්දු ශ්‍රී ලංකා යුද්ධ හමුදා මිත්‍රශක්ති ඒකාබද්ධ යුද අභ්‍යාසය, ත්‍රිපිටකය ලෝක උරුමයක් කිරීමේ උත්සවය, 71 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව යුද්ධ හමුදා ධජයන්ට සෙත් පැතීමේ උත්සවය, මහනුවර දළදා මාළිගාව සඳහා අවශ්‍ය ජන ඇමතුම් සේවාව සහ ගුවන් විදුලි යන්ත්‍ර සේවාව ලබාදීම, "සෞභාග්‍යයේ දැක්ම" මෙහෙවර යටතේ බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බළකා දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කරගන්නා ලද සංවර්ධන නිලධාරීන්ගේ නේවාසික පුහුණුව සඳහා අවශ්‍ය ජන ඇමතුම් සේවාව ලබාදීම යනාදිය දැක්විය හැක.

තවද, මෙම ඒකක බලප්‍රදේශයට අයත් මේ දක්වා සංඥා සම්බන්ධතා පිහිටුවා නොමැති ස්ථාන වෙත අභිනවයෙන් සංඥා සම්බන්ධතාව ලබාදීමට සැලසුම් කර ඇති අතර, එහි පළමු අදියර වශයෙන් LHP 265 DE HF ගුවන් විදුලි යන්ත්‍ර යොදා ගනිමින් ආසේමු (මධ්‍යම) නව ගුවන් විදුලි ජාලයක් ස්ථාපිත කර 11 සේමු, 12 සේමු, 111 බසේමු, 112 බසේමු, කැබිලිත්ත දේවාලය - 23 ගරෙ (ඩී කණ්ඩායම් අනුබණ්ඩය) යන ස්ථානයන් ආවරණය වන පරිදි 2020.05.08 වන දින සිට සංඥා සම්බන්ධතාවය ගොඩනැංවීමට කටයුතු කරන ලදී. තවද ආරක්ෂක අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන උපායමාර්ගික හා ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය (SDCN) යටතේ ඇන්ටනා කුළුණු ස්ථාපනය කර ඇති ස්ථාන අතරින් මඩොල්සිම හා ලග්ගල සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන සඳහා කාර්මික සෙනීන් 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය විසින් යොදවා ඇති අතර එම සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන හා සබැඳි සියලුම කාර්මික කටයුතු මෙම සෙනීන් විසින් සිදුකරනු ලබයි.





ඒකක 12 වන සංවත්සරයට සමගාමීව 2020.02.03 වන දින සියලු නිලයන්ගේ සහභාගිත්වයෙන් ඒකකයට බුදුපිළිම වහන්සේ නමක් වැඩමවීම සහ එක් දින භාවනා වැඩ සටහනක් පැවැත්වීම









ඒකක 12 වන සංවත්සරය සැමරීම වෙනුවෙන් ඒකකයේ අණදෙන නිලධාරී වන ලුතිනන් කර්නල් එම් ආර් හමීම් යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී හට සම්මාන මුරය, සම්මාන පෙළපාලිය පිරිනැමීම, ක්‍රියාන්විතයේදී මියගිය 7 වන සංඥා රෙජිමේන්තුවට අයත් රණවිරුවන් 18 දෙනෙකු සිහිපත් වීම වෙනුවෙන් පැළ 18 ක් රෝපණය කිරීම හා සමූහ ඡායාරූපයකට පෙනී සිටි අවස්ථාව





2020.02.16 වන දින යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරී/ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් එන් එම් හෙට්ටිආරච්චි විඑස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම කඳවුරු සංචාරය





2020.05.16 වන දින ආසේමු (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව් ඩී සී කේ කොස්තා ආර්එස්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් රටෙහි පවතින කොවිඩ් - 19 වසංගතය වැළැක්වීම සඳහා උපදෙස් ලබාදීම හා කඳවුරු නිරීක්ෂණය කිරීම






2020.09.11 වන දින ප්‍රධාන සංඥා නිලධාරිගේ මෙම ඒකක සංචාරය





2020.02.04 වන දින 72 වන නිදහස් උත්සවය නිමිත්තෙන් අණදෙන නිලධාරි සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කළ රුක් රෝපණ වැඩසටහන හා ජාතික කොඩිය එසවූ අවස්ථාව



2020.05.20 වන දින ඒකක රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් බනි 1 බී ඒ එන් සංජීව ආර්එස්පී පත්වීම් ලැබූ අවස්ථාව

# 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය



**ලුතිනන් කර්නල්**
**එම් පී සී බී ජයශාන්ත යූඑස්පී**
**අණදෙන නිලධාරී**

මානුෂීය මෙහෙයුමෙහි තීරණාත්මක සන්ධිස්ථානයන්හී පෙරමුණ ගනිමින් ආධාරක බළඇණි ලෙස සංඥා බළකායේ රෙජිමේන්තු කිහිපයක්ම පාබල බලවේගයන්ට උත්ප්‍රේරණයක් සපයන කාලයක සංඥා සම්බන්ධතාවයන්හි අඛණ්ඩ පැවැත්ම උදෙසා සංඥා රෙජිමේන්තුවක අවශ්‍යතාව සපුරාලමින් වර්ෂ 2008 ක් වු ජුලි මස 15 වන දින පනාගොඩ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය තුළ බිහිවු 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය සිය අභිමානවත් 12 වන සංවත්සරය සපුරාලමින් වඩාත් ගුණාත්මක වු වෘත්තීය හමුදාවක භූමිකාව තහවුරු කරගැනීම සඳහා විප්ලවීය වු ගමන් මගක නියැළෙමින් සිටියි.

4 වන ඊළාම් යුද්ධය පැවති ඒ සමයේ ත්‍රිවිධ හමුදාව මගින් දියත් කරන ලද වන්නි මානුෂීය මෙහෙයුමේ විශාල කාර්යභාර්යක් ඉටු කළ 58 සේනාංකය වෙත සංඥා සම්බන්ධතාවය ලබාදීම උදෙසා 2008.08.07 වන දින මන්නාරම තල්අඩි ප්‍රදේශයේ ඒකකය ස්ථානගත වු අතර, ඉන් පසු 2009.02.05 වන දින පරන්තන් ප්‍රදේශයේද, 2009.04.29 වන දින ඉරණමඩු මංසන්ධියට ආසන්නව එවකට ත්‍රස්තවාදින්ගෙන් අත්පත් කරගන්නා ලද විනාශ වී ගිය ගොඩනැගිලි සහිත ස්ථානයක එනම් වත්මන් කඳවුර පිහිටි සිථානයෙහි ස්ථාපනය කරන ලදි, එවකට සංඥා බළකාය තුළ කනිෂ්ඨ ඒකකයක් වශයෙන් 2010, 2011 සහ 2012 යන වර්ෂයන්හි අඛණ්ඩව තෙවරක් විශිෂ්ටතම ඒකකය ලෙස තේරීපත් වු මෙම ඒකකය මේජර් ඩී එම් පී පී දසනායක, ලුතිනන් කර්නල් කේ ඒ ඩබ්ලිව් එස් රත්නායක, ලුතිනන් කර්නල් ඩබ්ලිව් සී ජයසිංහ පීඑස්සී, ලුතිනන් කර්නල් සී පී අරංගල්ල පීඑස්සී, ලුතිනන් කර්නල් ඒ පී වික්‍රමසේකර පීඑස්සී, ලුතිනන් කර්නල් ජී සී වී ප්‍රනාන්දු, ලුතිනන් කර්නල් පී ඩබ්ලිව් එම් එම් ඩී විජේරත්න ආර්එස්පී යුඑස්පී, ලුතිනන් කර්නල් එම් කේ පී පෙරේරා ආර්එස්පී යුඑස්පී යන අණදෙන නිලධාරින්ගේ අණදීම සහ මගපෙන්වීම යටතේ එදා මෙදා තුළ විශිෂ්ට ගමන් මගක නියැළිනි.

අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එම් කේ පී පෙරේරා ආර්එස්පී යුඑස්පී ජ්‍යේෂ්ඨ නිලධාරිගේ අණදීම සහ මගපෙන්වීම යටතේ පසු ගිය වසරේ සංඥා ඒකක අතරින් විශිෂ්ටතම ඒකකය ලෙස තේරී පත්වු අතර, පසුගිය වසරේ පැවති අන්තර් සංඥා ඒකක ක්‍රීඩා අතරින් ප්‍රථම ස්ථාන විශාල ප්‍රමාණයක් තමා සතු කර ගැනීමට සමත්විය. තවද, අසේමු (කිලි) ප්‍රධානත්වයෙන් පැවති නව නිපැයුම් ප්‍රදර්ශනයේ ප්‍රථම ස්ථානය මෙන්ම ආසේමු (කිලි) යටතේ පැවති ක්‍රිඩා තරගවලද විශිෂ්ට දස්කම් පෑමට 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය සමත්විය.

2020.07.30 දින අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එම් කේ පී පෙරේරා ආර්එස්පී යුඑස්පී ජ්‍යේෂ්ඨ නිලධාරිගේ නික්ම යෑමෙන් පසු 2020.08.08 දින නව අණදෙන නිලධාරී ලෙස ලුතිනන් කර්නල් එම් පී සී බී ජයශාන්ත යුඑස්පී ජ්‍යේෂ්ඨ නිලධාරී රාජකාරී ආරම්භ කරන ලදී.

අතිගරු ජනාධිපතිගේ "සෞභාග්‍යයේ දැක්ම" සංකල්පයට අනුව යුද්ධ හමුදාධිපතිගේ මගපෙන්වීම යටතේ රැකියා විරහිත උපාධිධාරින් 50000 කට 2020 සැප්තැම්බර් මස සිට අදියර 05 ක් යටතේ පුහුණුවක් ලබා දීමට කටයුතු කළ අතර, ආසේමු (කිලි) යටතේ 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ පුහුණු පාසලක් ආරම්භ කරනු ලැබු අතර, 2020.09.14 වන දින 79 දෙනෙකුගෙන් සමන්විත පළමු කණ්ඩායම පුහුණුවීම් ආරම්භ කරනු ලැබු අතර, 2020.10.04 දින පාඨමාලාව අවසන් විය.




2020.02.10 වන දින සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් එන් එම් හෙට්ටිආරච්චි වීඑස්වී යුඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ජ්‍යේෂ්ඨ නිලධාරිගේ අවසන් ඒකක නිල සංචාරය




2020.03.14 දින නව සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩීයු පීඑස්සී ජ්‍යේෂ්ඨ නිලධාරිගේ මෙම ඒකක සංචාරය





2020.06.08 දින ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් ඩබ්ලිව් පී ඒ කේ තිලකරත්න පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම ඒකක සංචාරය





2020.08.08 දින ලුතිනන් කර්නල් එම් පී සී බී ජයශාන්ත යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී අණදෙන නිලධාරී වශයෙන් සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අවස්ථාව





බළඇණි පුහුණු පාඨමාලාවේ අවි පුහුණුව සිදුකරන අවස්ථාව හා උදෑසන පරීක්ෂණ පෙළපාලිය





2020.09.14 දින උපාධිධාරීන් වෙනුවෙන් පවත්වනු ලැබූ නායකත්ව පුහුණු වැඩසටහනේ විශේෂ අවස්ථාවන්

# 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (සන්නිවේදන තාක්ෂණ)

10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ පස්වන අණදෙන නිලධාරී වශයෙන් ලුතිනන් කර්නල් ඒ එම් ටී අමරකෝන් පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී කටයුතු කරන අතර දෙවන අණදෙන නිලධාරී ලෙස මේජර් එන් ඩබ්ලිව් පී පී පී ඉන්ද්‍රජිත් නිලධාරී 2019.04.10 වන දින සිට මේ දක්වා රාජකාරී සිදුකරනු ලබයි.



ලුතිනන් කර්නල්
ඒ එම් ටී අමරකෝන් පීඑස්සී
අණදෙන නිලධාරී

ආරම්භයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සියලු සන්නිවේදන හා තාක්ෂණික අවශ්‍යතාවන් නොපිරිහෙලා ඉටුකරමින් මහගු සේවයක් සැපයු 10 වන ශ්‍රී ලංකා සංඥා බළකාය (CT) පසුගිය වසරේදි නවතමයෙන් ඉදිවු යුද්ධ හමුදා මුලස්ථානයේ සන්නිවේදන ගොඩනැගිල්ලේහි රේඩියෝ රිලේ සම්බන්ධතා ලබා දෙමින් නව දිගුවන් 2000 කින් සමන්විත ස්වයංක්‍රිය විනිමයක් යුද්ධ හමුදා සන්නිවේදන ජාලයට එක් කරන ලදි. මෙවර 72 වන නිදහස් දින උත්සවයට සමගාමීව නිදහස් චතුරස්‍ර පරිශ්‍රයේ පැවති නිදහස් දින පෙළපාලියෙහි ජන ඇමතුම් සේවාව මෙම ඒකකයේ නිලධාරීන් හා සෙසුනිලයිනගේ කැපවීම හා උනන්දුව මත සාර්ථකව ඉටුකරනු ලැබු අතර, එම උත්සවය අවසානයේදි සංඥා බළකාය වෙතින් ලබාදුන් සේවය ඇගයීමටද ලක් විය.



2019.08.29 හා 30 යන දිනයන්හිදී බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වු ආරක්ෂක සමුළුවෙහි ජන ඇමතුම් සේවාව ලබාදුන් අවස්ථාව



2020.05.19 වන දින නිදහස් චතුරස්‍රයේ පැවති රණවිරු සැමරුම් දිනයේදි මෙම ඒකක ජන ඇමතුම් බළඝණය වෙතින් තම රාජකාරී ඉතා මැනවින් ඉටු කරනු ලබන අවස්ථාව





2020.06.17 වන දින 10 ශ්‍රීලංසංබ උපකරණ ගබඩාව නවීකරණය කර අණදෙන නිලධාරීගේ සුරතින් විවෘත වු අවස්ථාව






යුද්ධ හමුදාපතිගේ ප්‍රධානත්වයෙන් ස්ථාපිත Covid 19 වෛරස ව්‍යාප්තිය වැලැක්වීමේ ප්‍රධාන මධ්‍යස්ථානය සඳහා සන්නිවේදන පහසුකම් ලබාදුන් අවස්ථාව



නවතමයෙන් ඉදිකල සුබසාධක වෙළඳසැල සේවා වනිතා සභාපතිණිය අතින් සුබ මොහොතින් විවෘත කිරීම



2020.02.23 වන දින නව රෙජිමේන්තු සැරයන් මේජර් ලෙස බනි 11 අමරසූරිය ඩබ්ලිව් එම් පී විසින් සුබ මොහොතින් අණදෙන නිලධාරී අතින් වැඩ භාරගත් අවස්ථාව



2020.08.08 දින ලුතිනන් කර්නල් එම් ආර් එම් ආර් එල් බී මීගස්තැන්න යුඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී රාජකාරී නිමාවෙන් පසු නික්මන යන අවස්ථාව



2020.08.09 දින ලුතිනන් කර්නල් ඒ එම් ටී අමරකෝන් පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අවස්ථාව





නවතමයෙන් ඉදිකළ යුද්ධ හමුදා මූලස්ථානය වෙත රේඩියෝ රිලේ සම්බන්ධතාව ලබාදීම සඳහා ඇන්ටනා සවි කිරීම

# 11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය



ලුතිනන් කර්නල්
ආර් සී විජේකෝන්
යූඑස්පී පීඑස්සී
අණදෙන නිලධාරී

සංඥා බළකා මාතාවගේ තොරතුරු තාක්ෂණයේ ප්‍රමුඛයා වන මෙම ඒකකය ගතවූ වසරක කාලයක තුළ වත්මන් අණදෙන නිලධාරීගේ මඟපෙන්වීම මත තොරතුරු තාක්ෂණයේ මංපෙත් විවර කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවටත් අනෙකුත් සහෝදර හමුදාවන්ටත් අවශ්‍ය තොරතුරු තාක්ෂණික සහය ලබා දීම සිදුකරන ලදී. ගතවූ 2019 වසර තුළ කොළඹ ආරක්ෂක සම්මන්ත්‍රණය, දියකාවා යුධ අභ්‍යාසය, අන්තර් රෙජිමේන්තු සරඹ තරගාවලිය, යුද්ධ හමුදා නර්තනය, විජයග්‍රාහී සැමරුම් උත්සවය, යුද්ධ හමුදා සංවත්සර උත්සවය, ජාතික නිදහස් දින උත්සවය ආදී ජාතික හා යුද්ධ හමුදා උත්සව සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණික සහය ලබා දෙන ලදී.

එමෙන්ම මෙම ඒකකයේ 10 වන සංවත්සරය 2020 සැප්තැම්බර් මස 21 වන දිනට යෙදී තිබුණු අතර ඊට සමගාමීව අති උත්කර්ෂවත් අන්දමින් වැඩසටහන් මාලාවක් අණදෙන නිලධාරීගේ මඟපෙන්වීම යටතේ පවත්වන ලදී. ඒ අතර ජාතික රුධිර පාරවිලයන මධ්‍යස්ථානය වෙත අවශ්‍ය රුධිර සාම්පල් මෙම ඒකක සියලුම නිලධාරී/ සෙනීන්ගේ දායකත්වයෙන් ලබාදීම, සර්වරාත්‍රික පිරිත් දේශනයක් සහ ඊට පසු දින ස්වාමීන් වහන්සේලා 15 නමක් උදෙසා හීල් දානය පිරිනැමීම, හංවැල්ල ප්‍රදේශයේ පිහිටි සැදෑ සෙවණ වැඩිහිටි නිවාසයෙහි නේවාසික වැඩිහිටියන් වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක් ලබාදී තෑගි බෝග පරිත්‍යාග කරන ලදී. අනතුරුව යුද්ධ හමුදා සම්ප්‍රදායන්ට අනුගත වෙමින් 10 වන ඒකක සංවත්සර දිනය වෙනුවෙන් ගෞරව අභිමානය පෙරදැරිව අණදෙන නිලධාරී වෙත සම්මාන මුරය හා සම්මාන පෙළපාලිය පිරිනමන ලද අතර අණදෙන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් සියලු නිල දිවා භෝජන සංග්‍රහයක්ද පවත්වන ලදී. තවද නිලධාරී/ සෙසුනිලයින්ගේ සුහදතාව වර්ධනය කිරීමේ අරමුණින් සියලු නිල සුහදහමුව රෙජිමේන්තු මධ්‍යස්ථාන එළිමහන් ක්‍රීඩාභූමියෙහිදී සංගීතමය හා විනෝදකාමීත්වයට මුල්තැන දෙමින් පවත්වන ලදී.

කොරෝනා වෛරසයේ සීඝ්‍ර ව්‍යාප්තියත් සමග මුලු මහත් ශ්‍රී ලංකාද්වීපයම පීඩාවට පත් වූ අතර මෙම ඒකකයට අයත් සෙනින් දෙදෙනෙකු එම වසංගත තත්වයට මුහුණ දීමට ඇවැසි නව නිපැයුම් දෙකක් නිර්මාණය කළ අතර එය යුද්ධ හමුදාධිපතිගේ පැසසුමට ලක්වීම මගින් සංඥා බළකා මාතාවට හා මෙම ඒකකයට මහත් කීර්තිනාමයක් ගෙන එන ලදී.

තවද මෙම වසර තුළදී අන්තර් රෙජිමේන්තු සරඹ තරගාවලියේ සිව්වන ස්ථානය මෙම ඒකකය දිනා ගන්නා ලද අතර, ඒකක භටපිරිස් හි නොපසුබට ධෛර්යයහි ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රීඩා කෞශල්‍යයන්ගෙන් හෙබි භට පිරිස් අන්තර්ජාතික, ජාතික සහ යුද්ධ හමුදා තරග සඳහා සංඥා බළකාය නියෝජනය කරමින් ඒකකයට මහත් කීර්තියක් ගෙන එන ලදී.

වර්ෂ 2016 ක් වූ සැප්තැම්බර් මස 21 වන දින හදිසි රිය අනතුරක් හේතුවෙන් අප අතරින් වෙන් වූ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරී සැරයන් කුමාරසිංහ ජේ (මියගිය) මිය යන විට ඔහුටම අයත් නිවසක් නොතිබූ බැවින් ඔහුගේ බිරිඳ සහ දරුවා වෙනුවෙන් සේවා වනිතා ශාඛාව - රෙම ශ්‍රිලංසංබ මූලිකත්වයෙන් නව නිවසක් ඉදිකිරීම සඳහා මුල්ගල තැබීමේ උත්සවය වර්ෂ 2020 ක් වූ ජූලි මස 26 වන දින වත්මන් බළකාධිපති වන මේජර් ජෙනරාල් ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩීයූ පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මඟපෙන්වීම යටතේ එතුමන් නියෝජනය කරමින් ප්‍රධාන ආරාධිතයා ලෙස මධ්‍යස්ථාන සේනාවිධායකව සිටි බ්‍රිගේඩියර් එල් එස් පී පෙරේරා යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ප්‍රධානත්වයෙන් අණදෙන නිලධාරී, 11 ශ්‍රීලංසංබ හා සේනාවිධායක, සංඥා පුහුණු පාසල සහභාගිත්වයෙන් මහනුවර වත්තේගම ප්‍රදේශයේ ඔහුගේ බිරිඳට අයත් ඉඩමේදි සිදුකරන ලදී.

තවද වත්මන් අණදෙන නිලධාරී සියලු නිලයින්ගේ සුබසාධන කටයුතු නැංවීම වෙනුවෙන් ක්‍රියාමාර්ග රාශියක් ගන්නා ලද අතර දීර්ඝ කාලයක් පැවැති නිල උසස්වීමේ ගැටළු නිරාකරණය කර විශාල භටපිරිස් සංඛ්‍යාවක් සංස්ථාවේ පුරප්පාඩු සඳහා නිල උසස් කිරීමට හැකිවීම මෙම ඒකකය ලද විශිෂ්ට ජයග්‍රහණයකි. මීට අමතරව මෙම ඒකකය විසින් 'Refresh Hub' නමින් නැවුම් පලතුරුහලක් සංඥා බළකාධිපතිගේ ප්‍රධානත්වයෙන් සියලු නිලයින්ගේ ප්‍රයෝජනය සඳහා 2020.07.27 වන දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදි විවෘත කරන ලදි.



2020.07.27 වන දින සංඥා බළකාධිපතිගේ ප්‍රධානත්වයෙන් 'Refresh Hub' නමින් නැවුම් පලතුරුහලක් විවෘත කරන ලද අවස්ථාව



සංඥා බළකා නිලධාරී සෙසුනිලයින්ගේ චිත්‍ර අත්කම් හා නිර්මාණ එළිදැක්වීම වෙනුවෙන් මෙම ඒකක සෙසුනිලයින්ගේ දායකත්වය ලබා දීම



2020.05.04 වන දින මෙම ඒකක දෙවන අණදෙන නිලධාරී වශයෙන් මේජර් ඩී එස් එල් කුමාරසිරි යන ජ්‍යෙෂ්ඨ නිලධාරී වැඩ භාරගත් අවස්ථාව



2020.02.06 වන දින මෙම ඒකක පරිගණක වැඩපළ පනාගොඩ නිලධාරී අණදෙන ලෙස කපිතාන් එස් එම් සී ආර් සෙනවිරත්න වැඩ භාරගත් අවස්ථාව



2020.07.06 වන දින විධායක අධිකාරී වශයෙන් ලුතිනන් ඩී ඒ එම් ඩී දලුගම නිලධාරී වැඩ භාරගත් අවස්ථාව



2019.09.19 වන දින රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් බනි I ඩබ්ලිව් එස් ජයන්ත යන බලලත් නිලධාරී වැඩ භාරගත් අවස්ථාව









10 වන සංවත්සරයට සමගාමීව පවත්වන ලද උත්සව මාලාවේ විශේෂ අවස්ථාවන්

# 12 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (සයිබර් ආරක්ෂණ)

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, තාක්ෂණයේ දියුණුවත් සමගම නූතන සයිබර් අභියෝගවලට සාර්ථකව මුහුණදීමේ පරමාර්ථය පෙරදැරි කරගෙන පනාගොඩ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේ 12 වන සංඥා රෙජිමේන්තුව 2017 ජනවාරි මස 25 වන දින ස්ථාපනය කරන ලදී.



ලුතිනන් කර්නල්
ඊ එන් පී ගුණවර්ධන යූඑස්පී
අණදෙන නිලධාරී

මෙම ඒකකයට පුරා වසර 03 ක් සපිරීම නිමිත්තෙන් සංවිධානය කරන ලද වැඩසටහන් මාලාවට අනුව ඒකක සංවත්සරය සැමරීම 2020 ජනවාරි මස 25 වන දින ඒකකයේ අභිමානය විදහා දක්වන අන්දමින් ඉතා උත්කර්ෂවත් ලෙස සිදුකරන ලදී. එහිදී ඒකක අණදෙන නිලධාරී වෙත සම්මාන මුරය හා නිලධාරීන් 14 දෙනෙකුගෙන් ද, සෙසුනිලයින් 108 දෙනෙකුගෙන්ද සමන්විත වූ සම්මාන පෙළපාලිය පිරිනමන ලදී. තවද ඒකක තෙවන සංවත්සරයට සමගාමීව තිස් වසරක යුද්ධයේදී ජීවිත පරිත්‍යාග කරන ලද රණවිරුවන්ට පින් අනුමෝදම් කිරීම, රණඝජිතයට පත්වූ රණවිරුවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීම සහ දැනට සේවයේ නියුතු සියලුම රණවිරුවන්ට, ඔවුන්ගේ පවුල්වල අයවළුන්ට හා සිවිල් සේවක මහත්ම මහත්මීන් හට ආශීර්වාද කිරීම උදෙසා පනාගොඩ යුද්ධ හමුදා බෝධිරාජාරාමයේදී බෝධි පූජා පින්කමක්ද පවත්වන ලදී. ඊට අමතරව 2020 ජනවාරි මස 28 වන දින කුකුලේගඟ "ලායා ලෙෂර්" හිදී ඒකක අණදෙන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් සියලු නිල සුහදහමුවක් පවත්වන ලදී.

"Zero Day of Virtual Battle" සයිබර් ආරක්ෂණ අභ්‍යාසය 2020 වසර තුළ පවත්වන ලද ඉතා වැදගත් වැඩසටහනක් ලෙස හැඳින්විය හැකි අතර, එහිදී යුද්ධ හමුදා දත්ත ජාලය වෙත බාහිරින් එල්ලවිය හැකි විවිධාකාර තර්ජනයන් සජීවී ආදර්ශන උපයෝගී කර ගනිමින් ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලයේ සහ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ මගපෙන්වීම යටතේ යුද්ධ හමුදාධිපති ඇතුළු යුද්ධ හමුදා මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත මෙම ඒකකයේ මූලිකත්වයෙන් ආදර්ශනය කිරීම සිදුකරන ලදී.

තවද සයිබර් ආරක්ෂණය සබැඳිව යුද්ධ හමුදා සාමාජිකයන්ගේ දැනුම වැඩි කරනු වස් සියලු ආරක්ෂක සේනා මූලස්ථාන ආවරණය වන පරිදි දේශන මාලාවක් සහ සයිබර් ආරක්ෂණ විගණන කටයුතු සිදුකරනු ලදී.

වත්මන් අණදෙන නිලධාරී වන ලුතිනන් කර්නල් ඊ එන් පී ගුණවර්ධන යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ නිසි නායකත්වය හා මගපෙන්වීම යටතේ ඒකකයේ සියලුම අංශයන්හි ඉදිරි කටයුතු ඉතා උසස් අන්දමින් ඉටුකිරීමේ හැකියාව ලැබී ඇත. මෙම ඒකකයේ දෙවන අණදෙන නිලධාරී ලෙස මේජර් ටී ඩී ටී විජේසිංහ ජ්‍යෙෂ්ඨ නිලධාරීද, විධායක අධිකාරී ලෙස මේජර් ආර් බී සී එම් ඩබ්ලිව් ටී වී අබේවර්ධන ජ්‍යෙෂ්ඨ නිලධාරීද, රාජකාරී සිදුකරනු ලබන අතර, රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් ඩනි 1 බී ඩබ්ලිව් එස් පී මඩවල රාජකාරී කරමින් සිටී.

ඒකකයෙහි රාජකාරී කරනු ලබන සියලු නිලයන්ගේ සුබසාධන කටයුතු පිළිබඳ සොයා බලා ක්‍රියාකිරීම මගින් සෙබළුන්ගේ චිත්ත ධෛර්යය උසස් අන්දමින් පවත්වාගෙන යාමට පිටුවහලක් වී ඇති අතර, එමගින් ඒකකය වෙත පැවරෙන රාජකාරීන් කැපවීමෙන් හා උනන්දුවෙන් ඉටුකිරීම මෙම ඒකකය ලබා ඇති සාර්ථකත්වයට හේතු වී ඇත.

සංඥා බළකායේ නව සාමාජිකයෙකු වශයෙන් යුද්ධ හමුදාව, සයිබර් ආරක්ෂණය අතින් ඉහළට ඔසවා තැබීමේ මෙහෙවරට උරදෙමින් නවීන පරිගණක තාක්ෂණික දැනුමින් දීප්තිමත් ඉදිරි ගමනක් යාම ඒකකයේ අණදෙන නිලධාරී ඇතුළු සියලු නිලධාරීන්ගේ හා සෙසුනිලයින්ගේ ඒකායන අරමුණ වී ඇත.






"Zero Day of Virtual Battle" සයිබර් ආරක්ෂණ අභ්‍යාසයේ විශේෂ අවස්ථාවන්





ඒකකයේ තෙවන සංවත්සර වැඩසටහනේ විශේෂ අවස්ථාවන්





2020.07.06 දින අණදෙන නිලධාරී වශයෙන් රාජකාරී කරනු ලැබූ කර්නල් කේ සී ප්‍රතාපසිංහ ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ නික්මයාම වෙනුවෙන් පවත්වනු ලැබූ සම්මාන පෙළපාලිය හා වැඩසටහන් මාලාව





2020.07.09 දින ලුතිනන් කර්නල් ඊ එන් පී ගුණවර්ධන යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී අණදෙන නිලධාරී වශයෙන් සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අවස්ථාව



2020.10.03 දින මේජර් ටී ඩී ටී විජේසිංහ ජ්‍යෙෂ්ඨ නිලධාරී දෙවන අණදෙන නිලධාරී වශයෙන් සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අවස්ථාව

# සංඥා පුහුණු පාසල



කර්නල්
එස් ජේ කේ ඩී ජයවර්ධන
යූඑස්පී පීඑස්සී
සේනාවිධායක

සංඥා රෙජිමේන්තුවට අයත් පුහුණු පාසලක් වශයෙන් පාඨමාලාවන්ට හා අධ්‍යයන කටයුතු වලට මුල්තැන දෙමින් සංඥා බළකායට අයත් නිලධාරීන් හා සෙසුනිලයින් මෙන්ම යුද්ධ හමුදාවේ අනෙකුත් ඒකකයන්ට අයත් නිලධාරී/සෙසුනිලයින්ගේ අභිවෘද්ධිය උදෙසා වාර්ෂික පුහුණු සැලැස්මට අනුකූලව මෙම පුහුණු පාසල වෙතින් විවිධ පාඨමාලාවන් පවත්වනු ලබන අතර, මේ දක්වා නිලධාරී 42 දෙනෙකු සඳහා පාඨමාලාවන් 5 ක් හා සංඥා බළකායට අයත් සෙසුනිලයින් 740 දෙනෙකු සඳහා පාඨමාලා 11 ක්ද වෙනත් ඒකක සෙසුනිලයින් 83 දෙනෙකු සඳහා පාඨමාලා 4 ක්ද මෙම වර්ෂය තුළ පවත්වා ඇත. තවද යුද්ධ හමුදා සාමාජිකයින්ට අමතරව පාසල් දරුවන්ට හා විවිධ ආයතනයන්හි කාර්යමණ්ඩලයන් සඳහා මෙම පුහුණු පාසැල වෙතින් න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව තුළින් ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමේ නායකත්ව පුහුණු වැඩමුළු හා පාඨමාලාවන් පවත්වන ලදි.

සංඥා පාසල වෙතින් සිදුකරනු ලබන පුහුණු රාජකාරීන්ට අමතරව 11 සේනාංකය යටතේ ඇති ආගමික ස්ථාන සහ මරමස්ථානයන් වෙත භටපිරිස් යොදවා එම ස්ථානයේ සහ මහජනතාවගේ ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා මෙම පුහුණු පාසල වෙතින් දායකත්වය ලබා දෙන ලදී. එමෙන්ම දැනට දිවයිනෙහි ව්‍යාප්තව පවතින කොවිඩ් 19 වෛරසයේ ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා මහනුවර ප්‍රදේශය ආවරණය වන පරිදි යොදවා ඇති මාර්ග බාධක රාජකාරි හා අභ්‍යන්තර ආරක්ෂක රාජකාරී ඉටුකිරීමට හා නිරෝධායන මධ්‍යස්ථානයන්හි පාලන රාජකාරි සඳහාද භටපිරිස් යොදවා මෙම පාසලේ දායකත්වය ලබාදෙන ලදී. එමෙන්ම කොවිඩ් 19 වෛරසයේ ව්‍යාප්තිය සමග ඇතිවූ හදිසි තත්වය මත ආහාර හිඟයට පිළියමක් වශයෙන් මෙම පුහුණු පාසල් භූමියෙහි ආහාර භෝග හා එළවලු වර්ග වගා කිරීමට කටයුතු කරන ලදී.

සංඥා පුහුණු පාසලෙහි මෙතෙක් අඩුපාඩුවක්ව පැවති තේපැන්හලක් හා නිත්‍ය කාර්ය මණ්ඩලයේ රාජකාරි කරනු ලබන නිලධාරීන් වෙනුවෙන් නව නේවාසිකාගාරයක් සේනාවිධායකගේ හා ප්‍රධාන උපදේශකගේ මගපෙන්වීම යටතේ ඉදිකරන ලදී. එමෙන්ම කඳවුරේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වැසිකිලි පද්ධතියක් අභිනවයෙන් ඉදිකළ අතර, කොනොනි භෝජනාගාරයෙහි අලුත්වැඩියා කටයුතු සිදුකර අවසන් කර ඇත.

තාක්ෂණික දියුණුවත් සමග නවින තොරතුරු තාක්ෂණික උපකරණ ලොව පුරා ඉතා අධික ලෙස භාවිතා කරමින් සිටින අවදියක ඉන් ඇති වියහැකි ත්‍රස්තවාදි ප්‍රහාරයන් සහ අනෙකුත් අක්‍රමිකතා මැඩපැවත්වීම සඳහා භටපිරිස් සූදානම් කිරීමේ අරමුණින් සයිබර් ආරක්ෂාව පිළිබඳව වැඩමුළු මේ වන විටත් මෙම පාසල වෙතින් පවත්වා ඇති අතර, ඉන් නොනැවති සංඥා බළකායේ රාජකාරීන්හි නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් නවීන තාක්ෂණයෙන් පිරිපුන් පිරිසක් බවට පත් කිරීමේ අරමුණින් නුදුරේදි පහත සඳහන් මාතෘකා යටතේ වැඩමුළු පැවැත්වීමට සැලසුම් කර ඇති බැව් ඉතා සතුටින් දන්වා සිටිමි.

සයිබර් ආරක්ෂාව

පරිගණක ජාලගත කිරීම

ග්‍රැෆික් නිර්මාණකරණය සහ වීඩියෝ සංස්කරණ වැඩමුළුව

ජීඅයිඑස් වැඩමුළුව

සිසීටීවී කැමරා වැඩමුළුව

ප්‍රකාශ තන්තු වැඩමුළුව

ඉහත සදහන් කටයුතුවලට අමතරව අතිගරු ජනාධිපතිගේ "සෞභාග්‍යයේ දැක්ම හා මෙහෙවර" යන සංකල්පය යටතේ උපාධිධාරීන් 50000 කට රැකියා ලබාදීමෙහි පළමු අදියර වශයෙන් මෙම පුහුණු පාසල වෙතින් උපාධිධාරීනියන් 90 දෙනෙකු පුහුණු කරවීමේ වැඩසටහන 2020 සැප්තැම්බර් මස 14 දින ආරම්භ කරන ලදී.

මෙම වැඩසටහනට සමගාමීව සංඥා බළකාධිපති විසින් 2020 සැප්තැම්බර් මස 18 දින කඳවුරු සංචාරයක් සඳහා මෙම පුහුණු පාසල වෙත පැමිණි අතර, ඊට සමගාමීව සම්මාන මුරය, පැවැත්වූ අතර භටපිරිස් ඇමතීමෙන් අනතුරුව හා තේපැන් සංග්‍රහයක්ද පවත්වන ලදි.






මෙම පුහුණු පාසලේ සේනාවිධායක විසින් සමගි ජන අවන්හල හා නිලධාරී විවේකාගාරය විවෘත කල අවස්ථාව





කර්නල් බී අයි අස්සලආරච්චි යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි නික්ම යෑම නිමිත්තෙන් ලබා දුන් සම්මාන පෙළපාලිය හා ලබාගත් සමූහ ඡායාරූපය





2019.12.13 වන දින සේනාවිධායක වශයෙන් ලුතිනන් කර්නල් එස් ජේ කේ ඩී ජයවර්ධන යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙත ලබා දුන් සම්මාන මුරය හා සුබ මොහොතින් වැඩ භාරගත් අවස්ථාව



2019.12.18 වන දින ප්‍රධාන උපදේශක වශයෙන් මේජර් කේ වී ඒ කොඩිකාර පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අවස්ථාව



මෙම පුහුණු පාසල සියලු නිලයන්ගේ සහයෝගයෙන් වගා කරන ලද එළවළු භූමිය සකස් කරන අවස්ථාව





මෙම පුහුණු පාසල රෙජිමේන්තු සැරයන් මේජර් විසින් නව රෙජිමේන්තු සැරයන් නිවස්නය ඉදිකිරීම සඳහා මුල්ගල තැබූ අවස්ථාව





2020.09.14 දින උපාධිධාරීන් වෙනුවෙන් පවත්වනු ලබන නායකත්ව පුහුණු වැඩසටහන ආරම්භ කර මෙම පුහුණු පාසලේ සේනාවිධායක විසින් දේශනයක් පවත්වූ අවස්ථාව









2020.09.18 දින සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මෙම පුහුණු පාසල් සංචාරය සිදුකළ අවස්ථාව හා සියලු නිලයින් ඇමතීම



මෙම පුහුණු පාසල මගින් මාරස්සන ප්‍රදේශීය රෝහල ප්‍රතිසංස්කරණය සඳහා දායක වු අවස්ථාව



2020.10.08 වන දින ප්‍රධාන උපදේශක වශයෙන් මේජර් යු එල් සී ඩී පෙරේරා පීඑස්සී ජ්‍යෂ්ඨ නිලධාරි සුබ මොහොතින් රාජකාරි ආරම්භ කළ අවස්ථාව

 

ආගමික ස්ථානයන්හි අභ්‍යන්තර රාජකාරි සඳහා භටපිරිස් යෙදවීම

## පුහුණු පාඨමාලාවන්

| අ/අ | පාඨමාලාව | කාලසීමාව | සහභාගි වූ සිසුන් ගණන | පාඨමාලාවේ විශිෂ්ටතම ශිෂ්‍යයා |
|---|---|---|---|---|
| 1 | සංඥා සේවාස්ථ පාඨමාලාව 06 (MCC) | 2019.11.25 දින සිට 2019.12.31 දක්වා | 8 | මේජර් ටී ටී එන් මෙන්ඩිස් ශ්‍රීලංසංබ |
| 2 | සංඥා සේවාස්ථ පාඨමාලාව 07 (MCC) | 2020.07.01 දින සිට 2020.08.10 දක්වා | 7 | මේජර් කේ බී ජී යු එන් කාරියවසම් පීඑස්සී ශ්‍රීලංසංබ |
| 3 | රෙජිමේන්තු සංඥා නිලධාරීන් පාඨමාලාව 55 (RSO) | 2019.09.02 දින සිට 2019.10.21 දක්වා | 4 | ලුතිතන් එම් බී එල් පතිරගේ ශ්‍රීලපාහ |
| 4 | තරුණ සංඥා නිලධාරී පාඨමාලාව 15 (YOS) | 2019.08.06 දින සිට 2019.10.18 දක්වා | 13 | කපිතන් ජේ ඒ සී එල් සී ජයසුන්දර ශ්‍රීලංසංබ |
| 5 | තරුණ සංඥා නිලධාරී පාඨමාලාව 16 (YOS) | 2020.01.09 දින සිට 2020.03.25 දක්වා | 10 | කපිතන් ඩී ඒ සී පනාගොඩ ශ්‍රීලංසංබ |
| 6 | කෝප්‍රල් සිට සැරයන් දක්වා නිල උසස් කිරීමේ පාඨමාලාව අංක 65 | 2019.10.01 දින සිට 2019.11.08 දක්වා | 74 | කෝප්‍රල් තලගුනේ ඩී එම් සී එල් කේ |
| 7 | කෝප්‍රල් සිට සැරයන් දක්වා නිල උසස් කිරීමේ පාඨමාලාව අංක 66 | 2020.06.15 දින සිට 2020.07.20 දක්වා | 57 | කෝප්‍රල් ජයලත් යු යු |
| 8 | ලා/කෝ සිට කෝප්‍රල් දක්වා නිල උසස් කිරීමේ පාඨමලාව අංක 18 | 2019.09.02 දින සිට 2019.10.21 දක්වා | 80 | ලාන්ස් කෝප්‍රල් බණ්ඩාර ආර් එම් ඩී එස් |
| 9 | ලා/කෝ සිට කෝප්‍රල් දක්වා නිල උසස් කිරීමේ පාඨමලාව අංක 19 | 2020.02.12 දින සිට 2020.03.20 දක්වා | 126 | ලාන්ස් කෝප්‍රල් විජේසූරිය ඩබ්ලිව් එම් ඒ එන් |
| 10 | සංසෙ සිට ලා/කෝ දක්වා නිල උසස් කිරීමේ පාඨමලාව අංක 05 | 2019.11.18 දින සිට 2019.12.20 දක්වා | 22 | සංඥා සෙබළ රොෂාන් ආර් එන් |
| 11 | වෘත්තිය පරීක්ෂණ 1 ශ්‍රේණියේ පාඨමාලාව | 2019.07.31 දින සිට 2019.08.30 දක්වා | 57 | කෝප්‍රල් දසනායක එම් එම් එන් පි කේ |
| 12 | වෘත්තිය පරීක්ෂණ 1 ශ්‍රේණියේ පාඨමාලාව | 2019.08.05 දින සිට 2019.11.17 දක්වා | 8 | කෝප්‍රල් සෙව්වන්දි කේ පී බී |
| 13 | මූලික සංඥා පාඨමාලාව අංක 116 | 2019.08.05 දින සිට 2019.10.11 දක්වා | 97 | සංඥා සෙබළ ජයතිලක එස් එච් ටී එල් |
| 14 | මූලික සංඥා පාඨමාලාව අංක 117 | 2019.11.04 දින සිට 2020.01.13 දක්වා | 85 | ආධුනික කාන්තා සෙබළ කුමාරි ආර්එම්ඩීපී |
| 15 | මූලික සංඥා පාඨමාලාව අංක 118 | 2020.01.20 දින සිට 2020.03.20 දක්වා | 79 | ආධුනික කාන්තා සෙබළ තක්ෂිලා කේ ඒ එස් |
| 16 | මූලික සංඥා පාඨමාලාව අංක 119 | 2020.02.17 දින සිට 2020.05.04 දක්වා | 55 | ආධුනික සෙබල ජයසිංහ ජේ එන් අයි |
| 17 | මූලික පරිගණක පාඨමාලාව අංක 47 | 2019.08.13 දින සිට 2019.09.25 දක්වා | 25 | ලාන්ස් කෝප්‍රල් ජයරත්න කේ පී ඊ ආර් |
| 18 | මූලික පරිගණක පාඨමාලාව අංක 48 | 2019.11.07 දින සිට 2019.12.20 දක්වා | 8 | ලාන්ස් කෝප්‍රල් කුලරත්න පී ආර් පී |
| 19 | මූලික පරිගණක පාඨමාලාව අංක 49 | 2020.01.06 දින සිට 2020.01.27 දක්වා | 28 | කෝප්‍රල් ජයතිලක එන් පී එන් |
| 20 | වෙනත් ඒකක සංඥා පාඨමාලාව අංක 170 | 2020.01.06 දින සිට 2020.02.18 දක්වා | 22 | ලාන්ස් කෝප්‍රල් කරුණාරත්න පී ඒ |

# පුහුණු පාඨමාලාවන් අතරතුර විශේෂ අවස්ථා



සංඥා සේවාස්ථ නිලධාරී පාඨමාලාව අංක 06 අවසානයේ සහතිකපත් ලබාදුන් අවස්ථාව




සංඥා සේවාස්ථ නිලධාරී පාඨමාලාව අංක 07 අවසානයේ සහතිකපත් ලබාදුන් අවස්ථාව



මෙම පුහුණු පාසල මගින් කෝප්‍රල් සිට සැරයන් දක්වා නිල උසස් කිරීමේ පාඨමාලාව අවසානයේ සහතිකපත් ලබාදුන් අවස්ථාව



කෝප්‍රල් සිට සැරයන් දක්වා නිල උසස් කිරීමේ පාඨමාලාව අතරතුර පුහුණු කටයුතු සිදුකරන අවස්ථාව





මෙම පුහුණු පාසල මගින් වෙනත් ඒකක පාඨමාලාව හා පරිගණක පාඨමාලාව අවසානයේ සහතිකපත් ලබාදුන් අවස්ථාව





මෙම පුහුණු පාසල මගින් රණවිරු දරුවන් සඳහා පවත්වනු ලබන මූලික පරිගණක පාඨමාලාව අවසානයේ සහතිකපත් ලබාදුන් අවස්ථාව

# 2 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (ස්වේච්ඡා)



**ලුතිනන් කර්නල්**
**ඒ ඒ වී සෝමරත්න යූඑස්පී**
**අණදෙන නිලධාරී**

2020 වර්ෂය ආරම්භවීමත් සමගම ගතවී ඇති කාලසීමාව දෙස හැරී බැලීමේදී සංඥා බළකා මාතාවගේ එකම ස්වේච්ඡා සාමාජිකයා වන මෙම ඒකකය සංඥා බළකායේ ඒකකයක් ලෙස ඉහළට රැගෙන යාමේ මහගු අභියෝගයට මුහුණ දීමට හැකිවන පරිදි වත්මන් අණදෙන නිලධාරීගේ මඟපෙන්වීම මත යන අභිමානවත් ගමනේ මතක සටහන් අතර, 2020 වර්ෂයට අදාළව සංඥා රෙජිමේන්තුව විසින් සංවිධානය කරන ලද අන්තර් සංඥා ඒකක සරඹ තරගාවලිය තුළදී අනෙකුත් සියලුම සංඥා ඒකක අභිබවා ප්‍රථම ස්ථානය දිනාගැනීමත් දක්ෂතම බණ්ඩාගාර නිලධාරී සහ දක්ෂතම සරඹ උපදේශක යන ස්ථානයන් මෙම ඒකකය වෙත හිමිවීම විශේෂ ජයග්‍රහණයන් ලෙස පෙන්වා දිය හැකිය. තවද ඒකක භටපිරිස් තවත් ධෛර්යමත් කරමින් එක් දෙයකට විශේෂීකරණය නොවී ක්‍රීඩා කුසලතාවයන්ගෙන් හෙබි භටපිරිස් ක්‍රීඩාව වෙත යොමු කරමින් 2019 වර්ෂයේ නේපාලයේ කත්මන්ඩු නුවර පැවති 13 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේ මලල ක්‍රීඩා ඉසව් සඳහා සහභාගිවූ මෙම ඒකකයට අයත් ක්‍රීඩිකාවන් ලක්මාතාව රනින් හා රිදියෙන් බබළවමින් සමස්ත යුද්ධ හමුදාවටත් සංඥා බළකායටත් අභිමානයක් එක්කරන ලදි. එමෙන්ම සංඥා බළකා අන්තර් රෙජිමේන්තු ක්‍රීඩා තරගාවලිය තුළ කැපී පෙනෙන ක්‍රීඩා කෞශල්‍යක් විදහා පෙන්වමින් මළල ක්‍රීඩා, බැට්මින්ටන්, රගර්, කඹ ඇදීම, කැරම්, ක්‍රිකට්, වුෂු, වෙරළ වොලිබෝල්, චෙස්, එල්ලේ, වොලිබෝල් සහ බර ඉසිලීම යන ක්‍රීඩා තරග තුළදී ද ඒකකය ලත් ජයග්‍රහණයන් 2019 වර්ෂයේ අප ඒකකය ලද ජයග්‍රහණයන් ලෙස පෙන්වාදිය හැකිය.

2019 අභ්‍යාස අධ්‍යක්ෂකගේ අධීක්ෂණය යටතේ ආරක්ෂක සේනා නැගෙනහිර බලප්‍රදේශයේ මින්නේරිය, ත්‍රිකුණාමලය සහ ලංකා පටුන ප්‍රදේශය කේන්ද්‍ර කොටගෙන 2019 සැප්තැම්බර් මස 03 දින සිට 27 දින දක්වා දෙස් විදෙස් හමුදා සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලද දියකාවා යුද අභ්‍යාසයට අවශ්‍ය තාක්ෂණ උපකරණ, රේඩියෝ සම්බන්ධතාවන් හා උපකරණ, දුරකථන සම්බන්ධතා උපකරණ, විදුලි ජනක උපකරණ හා විදුලි බල සැපයුම්, ක්‍රියාන්විත මැදිරි ඉදිකිරීම ආදි අභ්‍යාසයේ සියලුම සංඥා සම්බන්ධතාවයන් මෙම ඒකකය වෙතින් ඉටුකරන ලදි.

රට තුළ පැතිරෙමින් පවතින අනපේක්ෂිත කොවිඩ් 19 වෛරස් තත්වය ව්‍යාප්තවීම මැඩපැවැත්වීමේ අරමුණින් නැගෙනහිර ප්‍රදේශයේ පුනානි, දම්මින්න, ගල්කන්ද, කන්දකාඩු, වැලිකන්ද රෝහල සහ කටුකැලියාව යන ස්ථානයන්හි ස්ථාපිත නිරෝධායන මධ්‍යස්ථානයන්හී සංඥා රාජකාරීන් සඳහා අවැසි සංඥා උපකරණ සමගින් නිලධාරීන්/ සෙසුනිලයින් යෙදවීම මෙන්ම අභ්‍යන්තර ආරක්ෂක රාජකාරී සඳහා භටපිරිස් යෙදවීම මගින් රට තුළ ඇතිවූ ව්‍යසනකාරී තත්වය මැඩපැවැත්වීමට සක්‍රීය දායකත්වයක් ලබාදෙන ලදි

ඒකක ක්‍රියාකාරකම් දෙස හැරී බැලීමේදී 2020.04.25 දිනට යෙදී තිබූ මෙම ඒකක 40 වන සංවත්සර උත්සවය රට තුළ පැතිරෙමින් පවතින අනපේක්ෂිත වසංගත තත්වය හේතුවෙන් චාම් අන්දමින් සමරන ලද අතර, ඒකක සංවත්සර උත්සවයට සමගාමීව සතුරා සමග උරෙන් උර ගැටී යුද්ධයේදී මියගිය/ රණකෂිතයට පත්ව ඇති සහ දැනට රාජකාරියේ නියුතු මෙම ඒකක සියලුම රණවිරුවන් මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත් වසංගත තත්වයට ගොදුරුවී රෝහල් ගතවී ඇති සියලු දෙනාටත් රටවැසියන්ට මෙන්ම ලෝකවාසී ජනතාවට සෙත් ප්‍රාර්ථනා කරමින් නිරෝධායන නීති රීතිවලට යටත්ව නිලධාරීන් සහ සෙසුනිලයින් සහභාගි වී බෝධිපූජා පිංකමක්ද පවත්වන ලදි.

පසුගිය කාලවකවානුව දෙස ආපසු හැරී බැලීමේදී ඉතා කෙටි කලක් තුළ ඒකකය ලබා ඇති ප්‍රගතිය සහ සීඝ්‍ර දියුණුවක් කරා ගෙන යාමට ඇවැසි මංපෙත් විවර කිරීම සඳහා ඒකක නිලධාරී/ සෙසුනිලයින්ගෙන් ලැබුණු සහයෝගය ඉතා අගනේය.






2020.03.04 දින සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම ඒකක සංචාරය




2020.05.25 දින ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් ඩබ්ලිව් පී ඒ කේ තිලකරත්න පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මෙම ඒකක සංචාරය




2020.05.28 දින සංඥා බළසේනාධිපති සහ රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ මෙම ඒකක සංචාරය




2020.06.23 වන දින සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩීයු පීඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් මිරිදිය පවන නිවාඩු නිකේතනය නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාව




වැලිකන්ද රෝහල් පරිශ්‍රය සුද්ධ පවිත්‍ර කර කොවිඩ් 19 ආසාධිතයින් හට නේවාසික ප්‍රතිකාර කිරීමට සුදුසු පරිදි ප්‍රතිසංස්කරණය කිරීම

## විද්‍යුත් සංග්‍රාමික බළඝණය

සංඥා බළසේනා මූලස්ථානය පනාගොඩ යටතේ ස්ථාපනය කර ඇති විද්‍යුත් සංග්‍රාමික බළඝණය වර්තමාන නිලධාරී අණදෙන විද්සංබ වශයෙන් මේජර් පී ඒ ආර් ඇන්තනිස් පීඑස්සී යටතේ දැනට සෙනින් 38 දෙනෙකුගෙන් සමන්විතව රේඩාර් අනුබණ්ඩ 07 ක් හා දිසා සොයා ගැනිමේ අනුබණ්ඩ 11 ක්  දිවයිනේ උතුරු නැගෙනහිර ආවරණය වන පරිදි ස්ථානගත කර ඇත.

විද්‍යුත් සංග්‍රාමික බළඝණය මගින් ස්ථානගත කර ඇති රේඩාර් අනුබණ්ඩ අතරින් 2 ශ්‍රිලංජාඅබමු ඒකකය යටතේ ස්ථානගත කර ඇති ඩෙවිල්පොයින්ට් රේඩාර් අනුබණ්ඩය වෙතින් 2020 ජුලි මස තුළ අවස්ථා කිහිපයකදීම ඉන්දියන් මුහුදු සීමාවේ සිට ශ්‍රී ලංකා මුහුදු සීමාවට ඉන්දිය ධීවරයන් සහ සංක්‍රමිකයන් ඇතුළුවීමට උත්සාහ කරනු ලබන බැව් නිරීක්ෂණය කළ අතර ඒ අනුව ප්‍රදේශය භාර බසේමු හා සේමු දැනුවත් කර නාවික හමුදා කඳවුර වෙත දන්වා ඔවුන් නැවත ඉන්දීය මුහුදු සීමාවටම පළවා හැරීමට කටයුතු සිදුකර ඇත. එවැනි වූ නිරීක්ෂණයන් තුළින් ගොඩබිම දෙසට මත්ද්‍රව්‍ය හා අනවසරයෙන් ඇතුළුවන පුද්ගලයින් පිළිබද තොරතුරු ලබා දිමෙන් ජාතික ආරක්ෂාවට මහත් දායකත්වයක් ලබා දෙන බව මෙහිදි සදහන් කළ යුතුය.

එමෙන්ම නිරීක්ෂණ චාරිකාවන් සඳහා පැමිණෙන කෙඩෙට් නිලධාරීන්, වෙනත් ඒකක සෙනින් හා නාවික සෙබලුන් සඳහා ක්‍රියාන්විත කාලසීමාව තුළ භාවිතා කරන ලද විද්‍යුත් සංග්‍රාමික උපකරණයන් පිළිබදව දැනුවත් කිරීම සහ තාක්ෂණ හා නවෝත්පාදන සබැදි රජයේ ආයතන වෙතින් සංවිධානය කරනු ලබන ප්‍රදර්ශන සඳහා මෙන්ම යුද්ධ හමුදා මූලස්ථානය වෙතින් පවත්වනු ලබන ප්‍රදර්ශනයන් සඳහාද මෙම බළඝණය සහභාගි වන බව කිව යුතුය.





INNOTECH 2020 ප්‍රදර්ශනයේදී විද්‍යුත් සංග්‍රාමික උපකරණ පාසල් ළමුන් සහ සිවිල් ජනතාව වෙත ප්‍රදර්ශනය කරනු ලැබූ අවස්ථාව





2020.05.27 දින ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් ඩබ්ලිව් පී ඒ කේ තිලකරත්න පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් මඩුකන්ද දිසා සොයාගැනීමේ අනුබණ්ඩය වෙත සංචාරය කළ අවස්ථාව



භූමිය නිරීක්ෂණය කිරීම සඳහා යොදා ගනු ලබන BFSR රේඩාර් යන්ත්‍රය





වෙරළාශ්‍රිත රේඩාර් නිරීක්ෂණ රාජකාරීන්හි නියැලෙන අතරතුර

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා සංගමය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 1976 වසරේ 8 වන පනතට අනුව ස්ථාපිත ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ අනුබද්ධ සංගම් 47 න් 4 වන ස්ථානයේ සිටින 1955 දෙසැම්බර් මස 15 වන දින ආරම්භ කරන්නට යෙදුණු යුද්ධ හමුදා සංඥා සංගමය ස්වෙච්ඡා නිලධාරීන් හා සාමාජිකයින් 25 දෙනෙකුගෙන් පමණ සමන්විත වුනු අතර, ඔවුන්ගේ මූලික අරමුණ වූයේ විශ්‍රාමයාමෙන් පසු සියලු දෙනා එකමුතුව සාමාජිකයින් අතර සුහදතාව, සහජීවනය, සාමූහිකත්වය හා සුබසාධනය වර්ධනය කිරීමයි.

අභිමානවත් ලෙස වසර 65 ක කාලයක් ඉදිරියට පැමිණ ඇති යුද්ධ හමුදා සංඥා සංගමය 2012 වසර වන විට ස්වෙච්ඡා හා නිත්‍ය සාමාජිකයින් 824 දෙනෙකුගෙන් සමන්විත විය. එම 824 තුළින් වැඩි කොටසක් විදේශගතව සිටි අතර ලක්දෙරණ තුළ ජීවත් වූයේ ඉතාමත් ස්වල්ප දෙනෙකි. එම පිරිස 150 දෙනෙකුගෙන් අඩු පිරිසක් වූ අතර, මහ සභා රැස්වීමකට සහභාගි වූයේ 50 දෙනෙකු හෝ 25 දෙනෙකු පමණි.

2012 අප්‍රේල් 04 දින වන විට එවකට සංඥා බළකාධිපති වූ මේජර් ජෙනරාල් ඊ පී ද ඉසෙඩ් අබේසේකර (විශ්‍රාමික) වීඑස්වී යූඑස්පී උපදෙස් මත සංඥා ඒකකයන්ගෙන් විශ්‍රාම ලබන සියලු සාමාජිකයින් යුද්ධ හමුදා සංඥා සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා යොමු කරන ලදි. මේජර් ජෙනරාල් එස් ඒ පී පී සමරසිංහ (විශ්‍රාමික) ආර්එස්පී වීඑස්වී පීඑස්සී, මේජර් ජෙනරාල් කේ ආර් පී රොවෙල් (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී හා මේජර් ජෙනරාල් බී එච් එම් ඒ විජේසිංහ (විශ්‍රාමික) වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී යන බළකාධිපතිවරුන්ගේ උපදෙස් යටතේ අද වන විට සාමාජික සංඛ්‍යාව 2540 දක්වා වැඩිවී ඇත.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා සංගමයට බැඳෙන සියලු සාමාජිකයින්හට ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ සාමාජිකත්වය ලබාදෙන අතර, අනුබද්ධ සංගම් 47 කින් සමන්විත වන සාමාජිකයින් 600,000ක් පමණ ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගෙන් සමන්විත සාමාජිකත්වය සඳහා යුද්ධ හමුදා සංඥා සංගමය වෙතින් එම සාමාජිකයින්ට ලැබෙන සුබසාධක වරප්‍රසාද පහත පරිදි වේ.

සේවයෙන් විශ්‍රාමගත් පසුවත් සංඥා සහෝදරත්වය, එකමුතුව හා බළකා බැඳීම (Espirit de Corps) පවත්වාගෙන යෑම

සංඥා සංගමයේ පවුල් සුහදතාවය වර්ධනය කිරීම සඳහා වාර්ෂික සංඥා පවුල් සුහද හමුව පැවැත්වීම හා තරඟ පවත්වා වටිනා ත්‍යාගයන් පිරිනැමීම

සාමාජිකයෙකුගේ අවමංගල්‍යයකදී මුදලින් රුපියල් 15,000.00ක් කලත්‍රයා වෙනුවෙන් රුපියල් 10,000.00ක් ද (සාමාන්‍ය මරණාධාර අරමුදල සාමාජිකත්වය වෙනුවෙන්) ප්‍රදානය කෙරේ

විශ්‍රාම වැටුපෙන් රුපියල් 100.00 අවකරණය වන සාමාජිකයන් උදෙසා සාමාජිකයාගේ අභාවය වෙනුවෙන් රුපියල් 50,000.00ක් ද කාලත්‍රයා වෙනුවෙන් 35,000.00ක් ද පිරිනැමේ. මරණාධාර අරමුදලේ සාමාජිකත්වය දැනට 625 දෙනෙකු දරණ අතර, සාමාජිකයින් වැඩිවීමේ ප්‍රවණතාව මත සාමාජිකයාගේ අභාවයේදී රුපියල් 100,000.00ක් ද කාලත්‍රයා වෙනුවෙන් රුපියල් 50,000.00ක් ද ඉදිරියේදී පිරිනැමීමට බලාපොරොත්තු වෙමු.

සංගමයේ සුවසහන පදනම 2012 අප්‍රේල් මස 04 වන දින ආරම්භ වූ අතර, එම අරමුදල මගින් අසාධ්‍ය රෝගී තත්වයේ සිටින මුදල් අවශ්‍යතාවය ඇති සාමාජිකයින්ට මුදලින් ආධාර කරනු ලබයි (පවතින තත්වය හා අදාළ නිරීක්ෂණයන්ට අනුව).

2018 වසරේ සිට සංඥා ශාඛා සංගම් දිස්ත්‍රික් මට්ටමේ 16ක් ක්‍රියාත්මක වන අතර, එම සංගමයන්ගේ නිර්දේශ මත හා සංඥා සංගමය පූර්ව නිර්දේශය මත ශ්‍රී ලංකා සේවාමුක්ත භට සංගමය මගින්

රුපියල් 300,000.00 ක ණය පහසුකම් සාධාරණ අඩු පොලිය යටතේ ලබාදීම

රණවිරු නිවාස පහසුකම්, නවාතැන් පහසුකම්, ප්‍රවීණයන් සඳහා වැඩිහිටි පහසුකම්

ඇස් කණ්නාඩි සඳහා රු 5,000.00 ක් ද

ඇස් කාච සඳහා රු 8,000.00 ක් ද

ශ්‍රවණාධාර සඳහා රු 10,000.00 ක් ද

වකුගඩු හා අනෙකුත් ශල්‍යකර්ම වෙනුවෙන් රු 75,000.00 ක් ද

හදවත් ශල්‍යකර්ම වෙනුවෙන් රු 100,000.00 ක් ද

සාමාන්‍ය ශල්‍යකර්ම සඳහා රු 4,000.00 සිට 20,000.00 දක්වා ද (මෙම ඉහත සියලු වෛද්‍යාධාර වෛද්‍ය නිර්දේශය අනුව ගෙවනු ඇත)

සාමාජිකයින්ගේ විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ දරුවන්හට මසකට රුපියල් 1,500.00 ක් බැගින් වර්ෂ 4 කට ගෙවනු ලැබේ

## වාර්ෂික මහා සභා රැස්වීම 2019

ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා සංගමයේ 63 වන සංවත්සර මහා සභා රැස්වීම 2019 මාර්තු 31 දින පවත්වන්නට යෙදුණු අතර, නව නිල මඩුල්ල තෝරා පත්කර ගැනීම, ප්‍රගති වාර්තා සමාලෝචන ඉදිරිපත් කිරීම හා සංගමයේ මූල්‍ය වාර්තාව ඉදිරිපත් කිරීම මෙදින පවත්වන්නට යෙදුණු අතර මහ සභා රැස්වීමේදී නව නිලධාරී මඩුල්ලක් ද තේරී පත්විය.

ගරු සභාපති ලෙස මේජර් ජෙනරාල් කේ ආර් පී රොවෙල් (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී, ගරු උප සභාපති ලෙස කපිතන් ජේ ආර් මෙන්ඩිස් (විශ්‍රාමික), ගරු ලේකම් ලෙස පී එල් ටී පෙරේරා මහතා සහ ගරු උප ලේකම් ලෙස එච් ඒ පී රම්‍යකුමාර මහතා, ගරු භාණ්ඩාගාරික ලෙස ලුතිනන් ඩබ්ලිව් එම් එස් වීරකෝන් (විශ්‍රාමික) තේරී පත්වූ අතර සෙසු කමිටු සභිකයින් 19 දෙනෙකු ද තේරී පත්විය. නව නිල මඩුල්ල තේරී පත්වීමෙන් පසුව යුද්ධ හමුදා සංඥා සංගමයේ සාමාජිකයින්ගේ උන්නතිය හා සුබසාධනය වෙනුවෙන් විවිධ වූ යෝජනා ක්‍රියාත්මක කොට සාමාජිකයින් උදෙසා අවශ්‍ය වන පියවරයන් ගෙන ඇති අතර සාමාජිකයින්ට එම වරප්‍රසාද ලබා දී ඇත.

## හමුදා සංඥා සංගමයේ ආරම්භයේ සිට මේ දක්වා තනතුරු දැරූ සාමාජිකයින්

### සභාපතිවරු

| | | | | |
|---|---|---|---|---|
| කර්නල් | වී සී කලාර්ට් | 1955 | - | 1957 |
| කර්නල් | සී ආර් සී ද | 1958 | - | 1966 |
| ලුතිනන් කර්නල් | ඩබ්ලිව් ඊ එම් ප්‍රනාන්ද | 1967 | - | 1976 |
| මේජර් | එම් ජේ එෆ් ආර් පෙරේරා | 1977 | - | 1982 |
| කර්නල් | ඒ එම් එම් ෆරීඩ් | 1983 | - | 1988 |
| මේජර් | එම් ආර් ඒ ටි පෙරේරා | 1988 | - | 1989 |
| මේජර් ජෙනරාල් | සි ජේ අබේරත්න | 1994 | - | 2007 |
| බ්‍රිගේඩියර් | කේ ඒ ඥානවීර | 2008 | - | 2017 |
| මේජර් ජෙනරාල් | වයි එස් ඒ ද සිල්වා | 2017 | - | 2018 |
| මේජර් ජෙනරාල් | එස් ඒ පී පී සමරසිංහ | 2018 | - | 2019 |
| මේජර් ජෙනරාල් | කේ ආර් පී රෝවෙල් | 2019 | - | මේ දක්වා |

### ලේකම්වරු

| | | | | |
|---|---|---|---|---|
| කර්නල් | ඩි වී බ්‍රොහියර් | 1955 | - | 1957 |
| | කේ අයි ප්‍රනාන්දු | 1958 | - | 1963 |
| | ඒ ජෝෂප් | 1964 | - | 1966 |
| කපිතන් | එස් එල් වි ඒ පෙරේරා | 1967 | - | 1968 |
| කපිතන් | ඒ අයි මාර්ටිල් | 1969 | - | |
| | එස් ඒ ජේ සැමුවෙල් | 1970 | - | |
| | ජේ නිකොලොස් | 1971 | - | 1978 |
| | එච් එන් ඒ වී ජේ ධර්මසේන | 1979 | - | 1980 |
| | ඩබ්ලිව් පී කෲස් | 1980 | - | 1982 |
| | ඩි සි පෙරේරා | 1984 | - | 1998 |
| | එම් අයි එම් ෆවුසි | 1999 | - | 2012 |
| | පි එල් ටි පෙරේරා | 2012 | - | මේ දක්වා |

### භාණ්ඩාගාරිකවරු

| | | | | |
|---|---|---|---|---|
| ලුතිනන් කර්නල් | ඊ එම් ප්‍රනාන්දු | 1955 | - | 1957 |
| කපිතන් | ජේ ඒ ප්‍රනාන්දු | 1958 | - | 1959 |
| මේජර් | ටි කේ පසේරා | 1959 | - | 1968 |
| කපිතන් | ජේ ඊ ප්‍රනාන්දු | 1969 | - | 1970 |
| | බි ජේ එස් ප්‍රනාන්දු | 1970 | - | 1975 |
| | වි කේ කුරේ | 1976 | - | 1977 |
| | එස් බි සී ද සිල්වා | 1977 | - | 1978 |
| | බි කේ කුරේ | 1978 | - | 1979 |
| | සි ඊ කුරේ | 1979 | - | 1980 |
| ලුතිනන් | කේ ටි පී ද සිල්වා | 1980 | - | 1982 |
| මේජර් | එම් ආර් ඒ ටි පෙරේරා | 1983 | - | 1987 |
| | ටෝනි වසීර් | 1988 | - | 2006 |
| කපිතන් | ඩබ්ලිව් ඒ පෙරේරා | 2007 | - | 2017 |
| මේජර් | ඩබ්ලිව් පී ද සිල්වා | 2017 | - | 2019 |
| ලුතිනන් | ඩබ්ලිව් එම් එස් වීරකෝන් | 2019 | - | මේ දක්වා |

# සංඥා බළකා සේවා වනිතා ශාඛාව

## නව සභාපති තුමිය රාජකාරී ආරම්භ කිරීම

ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය ලෙස රමනී දෙමටන්පිටිය මැතිණිය 2020 මාර්තු මස 01 වන දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කරන ලදී.









## මිහිදු සෙත් මැදුර රෝහල් සංචාරය

සංඥ බළකා සේවා වනිතා ශාඛාව විසින් සිදුකරනු ලබන මිහිදු සෙත් මැදුර අත්තිඩියහි වාර්ෂික සංචාරය 2020.08.16 වන දින සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය රමනී දෙමටන්පිටිය මැතිණිය ඇතුළු සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින්ගේ සහ සංඥා බළකාධිපති හා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී ඒ පී එන් දෙමටන්පිටිය එන්ඩීයු පීඑස්සී ඇතුළු සංඥා බළකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.













<u>ගැබිණී මව්වරුන්ට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා වියළි සලාක බෙදා දීම.</u>

ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය රමනී දෙමටන්පිටිය මැතිණියගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ අනුරාධපුර තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් එප්පාවල ග්‍රාමීය ප්‍රදේශයේ ජීවත් වන ගැබිණී මව්වරුන් 10 දෙනෙකුට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සහ අඩු ආදායම්ලාභී පවුල් 30 ක් සඳහා වියළි සලාක බෙදා දීමේ වැඩසටහනක් 2020 අගෝස්තු 23 වන දින එම ප්‍රදේශයේදී පැවැත්විණි. මෙම මාහැගි සත්කාරය සඳහා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ සභාපතිණිය ඇතුළු ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් පිරිසක් එක් වූහ. 4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ අණදෙන නිලධාරී ඇතුළු සෙසුනිලයින්ගේ පූර්ණ සහයෝගයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක විය.









## 2020 අගෝස්තු මස මාසික සභා රැස්වීම

ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ 2020 අගෝස්තු මස මාසික සභා රැස්වීම එම මස 23 දින 4 වන සංඥා බළකා රෙජිමේන්තුවේදී ගරු සභාපතිනිය රමනී දෙමටන්පිටිය මැතිණියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. සභාවාරය අතරතුරේදී සේවා වනිතා ශාඛාව විසින් මෙතෙක් සිදුකර ඇති වැඩසටහන් සඳහා උදව් උපකාර කළ සියලු දෙනාට ස්තූතිය පුදකළ අතර ඉදිරි මාසයන් තුළ සිදුකිරීමට අපේක්‍ෂා කරන වැඩසටහන් පිළිබද සාකච්ජා කෙරුණි. එම අවස්ථාවට සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් 24 දෙනෙකුගෙන් යුත් පිරිසක් සහභාගී වූහ.










## අනුරාධපුර පූජා නගර සංචාරය

ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය රමනී දෙමටන්පිටිය මැතිණිය ඇතුළුව ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් 2020 අගෝස්තු මස 23 දින අනුරාධපුර පූජා නගරයේ සංචාරයක නිරත වූහ. එහිදි පළමුව ශ්‍රී මහා බෝධීන් වහන්සේ වන්දනා කරනු ලැබූ අතර ඉන් පසුව පූජනීය රුවන්වැලි මහා සෑය වන්දනා කරන ලදී.









## වාර්ෂික රෝහල් සංචාරය 2020 - මුල්ලේරියාව මානසික රෝහල

ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික රෝහල් සංචාරය 2020 සැප්තැම්බර් 12 වන දින සිදුකෙරුණි. මෙම සංචාරය සඳහා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය රමනී දෙමටන්පිටිය මැතිණිය ඇතුළු ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් පිරිසක් එක් වූහ. මුල්ලේරියාව මානසික රෝහලේ කාන්තා වාට්ටු අංක 05 නේවාසික රැදවියන් සඳහා තෑගි පාර්සල් සහ සුලු දිවා ආහාරයක් ලබා දුන් අතරම ඔවුන්ගේ යහපැවැත්ම පිළිබඳව සේවා වනිතා සාමාජික මහත්මීන් විසින් විමසන ලදී. තවද එම වාට්ටුව වෙනුවෙන් බුදු පිළිමයක් තැන්පත් කිරීම සඳහා දැවයෙන් නිමවන ලද ආසනයක් සේවා වනිතා ශාඛාව විසින් පරිත්‍යාග කරන ලදි.









## 2020 සැප්තැම්බර් මස මාසික සභා රැස්වීම

ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ 2020 සැප්තැම්බර් මස මාසික සභා රැස්වීම එම මස 20 වන දින සංඥා බළකා රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරී නිවසනයේදී ගරු සභාපතිනිය රමනී දෙමටන්පිටිය මැතිණියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. සභාවාරය අතරතුරේදී සේවා වනිතා ශාඛාව විසින් ඉදිරි මාසයක් තුළ සිදුකිරීමට අපේක්ෂා කරන වැඩසටහන් පිළිබඳව සාකච්ඡා කෙරුණි. එම අවස්ථාවට සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් 35 දෙනෙකුගෙන් යුත් පිරිසක් සහභාගී වූහ.





## ලෝක ළමා දිනයට සමගාමීව පැවැත්වූ පොත් බෙදා දීමේ උත්සව මාලාවේ පළමු අදියර

ඔක්තෝම්බර් මස 01 වන දිනට යෙදී ඇති ලෝක ළමා දිනය සහ සැප්තැම්බර් 16 වන දිනට යෙදී ඇති ලෝක සාහිත්‍ය දිනයට සමගාමීව ශ්‍රී ලංකා සංඥා බළකායේ සේවයේ යෙදී සිටින සෙසුනිලයින්ගේ හා සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ දුවා දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය උදෙසා අවශ්‍ය දැනුම ලබාදීමේ අරමුණ පෙරදැරිව ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාව විසින් පොත් බෙදාදීමේ උත්සවයක් 2020 ඔක්තෝබර් 04 දින ශ්‍රී ලංකා සංඥා බළකා රෙජිමේන්තු මුලස්ථාන පරිශ්‍රයේදි පැවැත්විණි. ශ්‍රී ලංකා සංඥා බළකායෙහි බළකාධිපතිගේ මගපෙන්වීමෙන් හා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ සභාපතිණියගේ සංකල්පයකට අනුව සංවිධානය කරන ලද උත්සව මාලාවේ පළමු අදියර යටතේ 5, 10, 11, 12 ශ්‍රිලංසංබ ඒකකයන්ට අයත් සෙසුනිලයින්ගේ හා සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ දුවා දරුවන්හට පොත් බෙදාදිම සිදු කළ අතර, ඒ සඳහා එම ඒකක අණදෙන නිලධාරිවරුන් ඇතුළු සෙසුනිලයින්ගේ සහයෝගය ලැබුණී. මෙම උත්සව අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ වත්මන් සභාපතිතුමිය වන රමනී දෙමටන්පිටිය මැතිණිය සහභාගි වු අතර ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවෙහි ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් පිරිසක්ද ඒ සඳහා සහභාගි වූහ.







Children's Day
2020




Children's Day
2020






හදිසි අනතුරකින් මියගිය සැරයන් බණ්ඩාරගේ පවුලේ සාමාජිකයින් වෙනුවෙන් ඉදිකරන ලද නව නිවස 2019.11.01 වන දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිණිය වන සුජීවා නෙල්සන් මහත්මිය විසින් විවෘත කළ අවස්ථාව





2020.01.12 වන දින ජේ ඩී ඒ පෙරේරා කලාගාරයේදී පැවැත්වූ "සෙබල සිතුවම්" චිත්‍ර ප්‍රදර්ශණය සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිණිය වන සුජීවා නෙල්සන් මහත්මිය සහභාගී වූ අවස්ථාව





2020.01.11 වන දින සංඥා සේවා වනිතා ශාඛාවේ සභාපතිණියව සිටි කේෂිණි හෙට්ටිආරච්චි මහත්මිය හා එහි සාමාජිකාවන් අභිමන්සල 1 හි සිදුකළ සංචාරය

# ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විශ්‍රාම ගැනීම

## සංඥා බළකාධිපති පත්වීම හෙබවූ මේජර් ජෙනරාල් එන් එම් හෙට්ටිආරච්චි වීඑස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම ගැනීම

ශ්‍රී ලංකා සංඥා බළකායේ බළකාධිපති ලෙස රාජකාරී කළ මේජර් ජෙනරාල් එන් එම් හෙට්ටිආරච්චි වීඑස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී යුද්ධ හමුදාවෙන් විශ්‍රාම ගැනීම නිමිත්තෙන් 2020 පෙබරවාරි මස 24 වන දින උත්සව මාලාවක් පනාගොඩ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදි.

වැඩසටහනේ සමාරම්භය සනිටුහන් කරමින් සංඥා බළකායේ අභිමානය විදහාපාන කඳවුරු සම්මාන මුරය හා සම්මාන පෙළපාලිය පැවැත්වූ අතර, සියලුම නිලයින්ගේ සහභාගීත්වයෙන් කඳවුරු ක්‍රීඩා භූමියේ සමූහ ඡායාරූපයකට පෙනී සිටින ලදී. බලලත් නිලධාරී හා සැරයන් නිවස්නයේදී තේපැන් සංග්‍රහය ලබා දුන් අතර, සියලු නිලධාරීන් හා සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් දිවා භෝජන සංග්‍රහයක්ද පවත්වන ලදි. පසුව රෙජිමේන්තු නිලධාරී නිවස්නයේදී රාත්‍රී භෝජන සංග්‍රහය පවත්වා වැඩසටහනේ අවසානය සනිටුහන් කරන ලදි.

මේජර් ජෙනරාල් එන් එම් හෙට්ටිආරච්චි වීඑස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික නිලධාරී වර්ෂ 1965 පෙබරවාරි මස 25 වන දින උපත ලැබීය. කොළඹ ආනන්ද විද්‍යාලයෙන් ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය ලබා 1985 ජුනි මස 06 වන දින යුද්ධ හමුදා විද්‍යාපීඨය දියතලාව වෙතින් පාඨමාලා අංක 21 යටතේ නිලධාරී ශිෂ්‍යභටයෙකු ලෙස පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර 1986 ජනවාරි මස 25 වන දින දෙවන ලුතිනන්වරයෙකු ලෙස අධිකාරියට පත්ව ශ්‍රී ලංකා සංඥා බළකායට ඇතුළත් කරන ලදී.

මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී සිය සේවා කාලය තුළදී දේශීය හා විදේශීය පාඨමාලාවන් ඉතා සාර්ථකව හදාරා ඇති අතර යුද්ධ හමුදාවේ උසස් තනතුරු රැසක්ද හෙබවනු ලැබීය. වසර තිස්හතරකට අධික කාලයක් රටේ විවිධ ප්‍රදේශවල අණ, මාණ්ඩලික හා උපදේශක රාජකාරීන් හා වගකීම් ඉටුකරමින් යුද්ධ හමුදාවට මෙන්ම සංඥා බළකායටද ඉමහත් ගෞරවයක් ලබා දුන් අතර, උතුරු මැද ඉදිරි නඩත්තු පෙදෙස අණදෙන නිලධාරී වශයෙන් විශාල මෙහෙයක් ඉටුකරන ලදි.









## මේජර් ජෙනරාල් ඩී ආර් ධර්මසිරි යූඑස්පී එච්ඩීඑම්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම ගැනීම

මේජර් ජෙනරාල් ඩී ආර් ධර්මසිරි යූඑස්පී එච්ඩීඑම්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී යුද්ධ හමුදාවෙන් 2019.10.19 වන දින විශ්‍රාම යන ලද අතර, ඒ සඳහා සංඥා බළකා රෙජිමේන්තු පරිශ්‍රයේදී සම්මාන මුරය, සම්මාන පෙළපාලිය පිරිනැමීම, සියලු නිල ඇමතීම හා නිලධාරී නිවස්න සාදය පැවැත්වූ අතර, එම උත්සවය සංඥා බළකායේ රාජකාරී නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සෙසුනිලයින් රැසකගේ දායකත්වයෙන් 2019.10.19 වන දින පැවැත්විය.





## මේජර් ජෙනරාල් කේ එම් ආර් පී කරුණාතිලක පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම ගැනීම

මේජර් ජෙනරාල් කේ එම් ආර් පී කරුණාතිලක පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී යුද්ධ හමුදාවෙන් 2019.12.27 වන දින විශ්‍රාම යන ලද අතර, ඒ සඳහා සංඥා බළකා රෙජිමේන්තු පරිශ්‍රයේදී සම්මාන මුරය, සම්මාන පෙළපාලිය පිරිනැමීම, සියලු නිල ඇමතීම හා නිලධාරී නිවස්න සාදය පැවැත්වූ අතර, එම උත්සවය සංඥා බළකායේ රාජකාරී නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සෙසුනිලයින් රැසකගේ දායකත්වයෙන් 2019.12.27 වන දින පැවැත්විය.





## මේජර් ජෙනරාල් එච් පී සෙනෙවිරත්න වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම ගැනීම

ශ්‍රී ලංකා සංඥා බළකායට අයත් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී වශයෙන් රාජකාරී කළ මේජර් ජෙනරාල් එච් පී සෙනෙවිරත්න වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ජ්‍යෙෂ්ඨ නිලධාරී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් 2020.09.05 වන දින විශ්‍රාම යන ලදී. ඒ සඳහා සංඥා බළකා රෙජිමේන්තු පරිශ්‍රයේදී සම්මාන මුරය, සම්මාන පෙළපාලිය පිරිනැමීම, සියලු නිල ඇමතීම හා නිලධාරී නිවස්න සාදය පැවැත්වූ අතර, එම උත්සවය සංඥා බළකායේ රාජකාරී නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සෙසුනිලයින් රැසකගේ දායකත්වයෙන් 2020.09.05 වන දින පැවැත්විය.





## මේජර් ජෙනරාල් සී එම් ඩී පී චන්ද්‍රසේකර එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම ගැනීම

ශ්‍රී ලංකා සංඥා බළකායට අයත් මාස්ටර් ජෙනරාල් යුධ උපකරණ හා ශ්‍රී ලංකා කාන්තා බළකායේ බළකාධිපති වශයෙන් රාජකාරී කළ මේජර් ජෙනරාල් සී එම් ඩී පී චන්ද්‍රසේකර එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් 2020.09.09 වන දින විශ්‍රාම යන ලදී. ඒ සඳහා සංඥා බළකා රෙජිමේන්තු පරිශ්‍රයේදී සම්මාන මුරය, සම්මාන පෙළපාලිය පිරිනැමීම, සියලු නිල ඇමතීම හා නිලධාරී නිවස්න සාදය පැවැත්වූ අතර, එම උත්සවය සංඥා බළකායේ රාජකාරී නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සෙසුනිලයින් රැසකගේ දායකත්වයෙන් 2020.09.09 වන දින පැවැත්විය.




## බ්‍රිගේඩියර් එල් එස් පී පෙරේරා යුඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම ගැනීම

සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් රාජකාරි කළ බ්‍රිගේඩියර් එල් එස් පී පෙරේරා යුඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2020.09.26 වන දින යුද්ධ හමුදාවෙන් විශ්‍රාම යන ලදී. ඒ සඳහා සංඥා බළකා රෙජිමේන්තු පරිශ්‍රයේදී සම්මාන මුරය, සම්මාන පෙළපාලිය පිරිනැමීම, සියලු නිල ඇමතීම හා නිලධාරී නිවස්න සාදය පැවැත්වූ අතර, එම උත්සවය සංඥා බළකායේ රාජකාරී නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සෙසුනිලයින් රැසකගේ දායකත්වයෙන් 2020.09.26 වන දින පැවැත්විය.




## බ්‍රිගේඩියර් ඩබ්ලිව් පී ඩී වන්නිආරච්චි පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම ගැනීම

සංඥා බළකායේ රාජකාරි කළ බ්‍රිගේඩියර් ඩබ්ලිව් පී ඩී වන්නිආරච්චි පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි 2020.10.10 වන දින යුද්ධ හමුදාවෙන් විශ්‍රාම යන ලදී. ඒ සඳහා සංඥා බළකා රෙජිමේන්තු පරිශ්‍රයේදී සම්මාන මුරය හා නිලධාරී නිවස්න තේපැන් සංග්‍රහය පැවැත්වූ අතර, එම උත්සවය සංඥා බළකායේ රාජකාරී නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සෙසුනිලයින් රැසකගේ දායකත්වයෙන් 2020.10.10 වන දින පවත්වන ලදි.




## යුද්ධ හමුදාවේ නිවුන් සහෝදරයින් ගිනස් ලෝක වාර්තාවට

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත දායාද කරන ලද නිවුන් දරුවන් දෙදෙනකු වන මේජර් ජෙනරාල් පුරක සෙනෙවිරත්න සහ මේජර් ජෙනරාල් ජයන්ත සෙනෙවිරත්න යන දෙදෙනා ගිනස් ලෝක වාර්තාවට ඇතුළත් කිරීමේ සමාරම්භක උත්සවය 2020.07.30 වන දින යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී සිදුවිය.



ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා සහ ගිනස් වාර්තා සඳහා ශ්‍රී ලංකාවේ බලයලත් නියෝජිත, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ගිනස් ලෝක වාර්තා ජාතික මෙහෙයුම් කවුන්සිලයේ සභාපති සමන් අමරසිංහ මහතා සහ යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රාශියක් මෙම උත්සවය සඳහා සහභාගී වූහ.

මෙම නිවුන් සහෝදරයන් වන ශ්‍රී ලංකා සංඥා බළකායේ මේජර් ජෙනරාල් පුරක සෙනෙවිරත්න, මාණ්ඩලික ප්‍රධාන, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන කාර්යාලය සහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ මේජර් ජෙනරාල් ජයන්ත සෙනෙවිරත්න, ආඥාපති ආරක්ෂක සේනා මූලස්ථානය බටහිර හා බළකාධිපති සිංහ රෙජිමේන්තුව ලෙස රාජකාරී සිදුකරන ලදී.

1965 වර්ෂයේ සැප්තැම්බර් මස 06 වන දින ශ්‍රී ලංකාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ හිදෙල්ලන පුරක සෙනවිරත්න හා හිදෙල්ලන ජයන්ත සෙනවිරත්න උපත ලැබීය. ඔවුන්ගේ පියා හිදෙල්ලන සෙනවිරත්න සහ මව සිංවත්තේ ලීලා සෙනෙවිරත්නය. ඔවුන් රත්නපුර සීවලී මධ්‍ය විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ අතර, එකම දින පාසලට ඇතුළත් වූහ. 1980 දී ඔවුන් අපොස (සාපෙළ) විභාගය ඉහළින්ම සමත් වූ අතර, ඔවුන් දෙදෙනාම ගණිත අංශයෙන් අපොස උසස් පෙළ හදාරන ලදී. මොවුන් දෙදෙනා කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායකයින්ගේ සංගමයේ සාමාජිකයින් වූ අතර, පාසල් ක්‍රියාකාරකම් මෙන්ම විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහාද ප්‍රමුඛත්වය ගෙන කටයුතු සිදුකරන ලදී.

මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනා ද්විතියික අධ්‍යාපන කටයුතු නිමාකිරීමෙන් පසු 1985 ඔක්තෝබර් මස 31 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය බළකායට නිලධාරී ශිෂ්‍යභටයින් ලෙස කෙඩෙට් නිලධාරී බඳවාගැනීම් පාඨමාලා අංක 22 යටතේ බැඳී යුද්ධ හමුදා විද්‍යා පීඨය දියතලාව වෙතින් සහ නිලධාරී පුහුණු කිරීමේ පාසල මංගලා, පකිස්ථානය හිදී මූලික පුහුණුව ලබා 1986 ජූලි මස 24 වන දින දෙවන ලුතිනන් වරයන් ලෙස පකිස්ථානයේදී අධිකාරියට පත්වන ලදී. ඉන්පසු පාබල තරුණ නිලධාරී පාඨමාලාව කුවෙට් හිදී හදාරා අවසන් කිරීමෙන් පසු නැවතත් සිය රට බලා පැමිණියහ.

දෙවන ලුතිනන් පුරක සෙනෙවිරත්න ශ්‍රී ලංකා සංඥා බළකායටත්, දෙවන ලුතිනන් ජයන්ත සෙනෙවිරත්න ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවටත් ඇතුළත් වන ලදී. යුද්ධ හමුදාවේ රෙජිමේන්තු දෙකකට ඔවුන් පත් කරනු ලැබුවද, ඔවුන් විවිධ තනතුරු හා මූලස්ථානවල විවිධ හැකියාවන් යටතේ එකට සේවය කළ අතර, පුදුමයකට කරුණක් වන්නේ ඔවුන් දෙවන ලුතිනන් තනතුරේ සිට මේජර් ජෙනරාල් තනතුර දක්වා උස්වීම් ලද සෑම තනතුරක්ම එකම දිනයක සිදුවීමයි. ලෝක ඉතිහාසයේ නව පරිච්ඡේදයක් තබමින් 2018 සැප්තැම්බර් මස 06 වන දිනට යෙදුණු 53 වන උපන්දිනය වෙනුවෙන් මේජර් ජෙනරාල් තනතුරට උසස්වීම් ලබන ලදී.

මෙම මේජර් ජෙනරාල්වරුන් දෙදෙනා වසර 35 ක අද්විතීය සේවා කාලයක් නිමකර 2020 සැප්තැම්බර් මස 06 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් විශ්‍රාම ගන්නා ලදහ.







# සංඥා ක්ෂිතිජයෙන් ඔබ්බට



බ්‍රිගේඩියර් එන් පී අකුරන්තිලක ජ්‍යෙෂ්ඨ නිලධාරී 2020.01.02 වන දින යුද්ධ හමුදා පර්යේෂණ, විශ්ලේෂණ හා සංවර්ධන ශාඛාවේ අධ්‍යක්ෂ වශයෙන් පත්වීම් භාරගත් අවස්ථාව



බ්‍රිගේඩියර් කේ ඒ ඩබ්ලිව් එස් රත්නායක එන්ඩීයූ ජ්‍යෙෂ්ඨ නිලධාරී 2020.07.23 වන දින ආසේමු (මුලතිව්) බ්‍රිගේඩියර් ප්‍රමාන් වශයෙන් පත්වීම් භාරගත් අවස්ථාව

# උසස්වීම් / ජයග්‍රහණ / පාඨමාලා

## මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන්



මේජර් ජෙනරාල්
ඩබ්ලිව් පී ඒ කේ තිලකරත්න
පීඑස්සී



මේජර් ජෙනරාල්
පී ඒ ජේ පීරිස් එන්ඩීයූ

## බ්‍රිගේඩියර් නිලයට උසස්වීම් ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන්



බ්‍රිගේඩියර්
ඩබ්ලිව් එල් ප්‍රේමසිරි යූඑස්පී



බ්‍රිගේඩියර්
ඩී එම් පී පී දසනායක



බ්‍රිගේඩියර්
ආර් ඇල්විටිගල යූඑස්පී



බ්‍රිගේඩියර්
අයි එච් එම් ආර් කේ
හේරත් යූඑස්පී පීඑස්සී



බ්‍රිගේඩියර්
ඒ පී වික්‍රමසේකර යූඑස්පී
පීඑස්සී



බ්‍රිගේඩියර්
ආර් එම් පී එස් බී රත්නායක



බ්‍රිගේඩියර්
පී එල් එස් ඩබ්ලිව් ලියනගේ
යූඑස්පී පීඑස්සී



බ්‍රිගේඩියර්
සී පී අරංගල්ල පීඑස්සී



බ්‍රිගේඩියර්
බී අයි අස්සලාරච්චි
යූඑස්පී පීඑස්සී

# ජයග්‍රහණයන්



මේජර් ටී එම් එන් ඩී තෙන්නකෝන් පීඑස්සී
Officers Advance Electronics Engineering (Communication) Course - 44 (Part I & II) India
පාඨමාලාවේ හොඳම ව්‍යාපෘතියට හිමි සම්මානය හිමිකර ගැනීම



මේජර් එච් සී පාගොඩආරච්චි පීඑස්සී
අණ හා මාණ්ඩලික පාඨමාලා අංක 13 හි
"Golden Pen" සම්මානය හිමිකර ගැනීම



සෙ/281209 සැරයන් කුමාරසිරි එස් ජී එල්
Junior Leader Course – No 124
Junior Leadership Academy - India
2020.02.21 - 2020.04.09
ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම

## නිලධාරී ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලාවලදී සනිටුහන් කළ ජයග්‍රහණ

නිලධාරී ප්‍රගමන ප්‍රවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වන ලද ඒකක අණදෙන්නන්ගේ පාඨමාලාව - 7, කණිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව - 19 සහ කණිෂ්ඨ මාණ්ඩලික පාඨමාලාව - 19 යන පාඨමාලා ත්‍රිත්වයේම ප්‍රථම ස්ථානයන් අනුපිළිවෙලින් මේජර් ඩබ්ලිව් පී ඩී එන් අබේරත්න, මේජර් ටී එස් එන් කේ පීරිස්, කපිතන් ටී කේ රාමසිංහ විසින් දිනාගනිමින් සංඥා බළකාය වෙත අභිමානයක් ගෙන එන ලදී.

තවද, කපිතන් ටී එන් පී විතානගේ සහ මේජර් ටී එස් ඊ ප්‍රනාන්දු විසින් කණිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව - 19 හි අනුපිළිවෙලින් දෙවන සහ හයවන ස්ථානයන් ලබා ගන්නා ලදි.



මේජර් ඩබ්ලිව් පී ඩී එන් අබේරත්න
ඒකක අණදෙන්නන්ගේ පාඨමාලාව - 7
ප්‍රථම ස්ථානය



මේජර් ටී එස් එන් කේ පීරිස්
කණිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව - 19
ප්‍රථම ස්ථානය



කපිතන් ටී කේ රාමසිංහ
කණිෂ්ඨ මාණ්ඩලික පාඨමාලාව - 19
ප්‍රථම ස්ථානය



කපිතන් ටී එන් පී විතානගේ
කණිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව - 19
දෙවන ස්ථානය



මේජර් ටී එස් ඊ ප්‍රනාන්දු
කණිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව - 19
හයවන ස්ථානය

# පාඨමාලා



බ්‍රිගේඩියර් කේ ඒ ඩබ්ලිව් එස් රත්නායක එන්ඩීයු
National Security & War Course (NSWC)
2019/2020 - Pakistan



සෙ/279606 බනි 1 එච් එම් පී ඒ හේරත් ඉන්දියාවේදි පැවති
විදේශිය යුද්ධ හමුදා සරඹ උපදේශක පාඨමාලාව - අංක 108
2020.01.13 - 2020.02.29



සෙ/279263 බනි 11 කරුණාරත්න කේ ඒ එන් ඩී
Drill Instructor Course - England



සෙ/279265 බනි 11 රත්නායක අයි එම් කේ බී
Drill Instructor Course - Bangladesh

## 13 වන අණ හා මාණ්ඩලික පාඨමාලාව සාර්ථකව හැදෑරූ නිලධාරීන්



මේජර් කේ බී පී යු එන්
කාරියවසම් පීඑස්සී



මේජර් එන් බී
සංජීව පීඑස්සී



මේජර් ඒ ජේ එන් එස්
වීරසේන පීඑස්සී



මේජර් එච් පී එස් මුනසිංහ
පීඑස්සී



මේජර් එච් සී
පාගොඩආරච්චි පීඑස්සී



මේජර් බී එල් ඒ පී
ද සිල්වා පීඑස්සී



කපිතන් ඩී ආර් එස් ජේ
දසානායක පීඑස්සී

# FOREIGN COURSE PARTICIPANTS OFFICERS

| | | | |
|---|---|---|---|
| Brig | K A W S Rathnayake | National Security & War Course (NSWC) 2019 - 2020 | Pakistan |
| Lt Col | T S Liyanagunawardana | Unit Command Course (Sig) | Pakistan |
| Lt Col | M A K Jayawardena psc | Unit Command Course (Sig) | Pakistan |
| Lt Col | P P C Perera psc | Unit Command Course (Sig) | Pakistan |
| Lt Col | M R M R L B Meegasthanna USP | Unit Command Course (Sig) | Pakistan |
| Lt Col | P H N Chandrasekara | Unit Command Course (Sig) | Pakistan |
| Lt Col | N P A Mendis psc | Unit Command Course (Sig) | Pakistan |
| Lt Col | M K G Perera RSP USP | Unit Command Course (Sig) | Pakistan |
| Lt Col | M R Hameem USP | Unit Command Course (Sig) | Pakistan |
| Lt Col | A A T Somarathne USP | Unit Command Course (Sig) | Pakistan |
| Lt Col | D M I S Bandara | Unit Command Course (Sig) | Pakistan |
| Lt Col | L U I Lokusooriya | Communication Equipment, Maintenance and Management Programme | China |
| Maj | S H L D Fernando | Unit Command Course (Sig) | Pakistan |
| Maj | T V M Rathnajeewa USP | Computer and Network Technology Programme | China |
| Maj | M P C B Jayashantha USP | Unit Command Course (Sig) | Pakistan |
| Maj | S A D Gamagedara USP | Communication Equipment, Maintenance and Management Programme | China |
| Maj | H A D W Hettiarachchi psc | Unit Command Course (Sig) | Pakistan |
| Maj | H M B M B Herath USP | JSC (SIG) 61 Linked With MCC(SIG) 61 | Pakistan |
| Maj | B P Udage USP | Unit Command Course (Sig) | Pakistan |
| Maj | K A Ariyawansha psc | Unit Command Course (Sig) | Pakistan |
| Maj | I P K Priyankarage USP | Unit Command Course (Sig) | Pakistan |
| Maj | A M C K Atapattu USP | Unit Command Course (Sig) | Pakistan |
| Maj | S A L I Jayasena psc | Unit Command Course (Sig) | Pakistan |
| Maj | R D R M Fernando RSP psc | Unit Command Course (Sig) | Pakistan |
| Maj | B M M B Herath RSP | Unit Command Course (Sig) | Pakistan |
| Maj | L N P Liyanage | JSC (SIG) 61 Linked With MCC(SIG) 61 | Pakistan |
| Maj | J S P K Jayalath RSP psc | JSC (SIG) 61 Linked With MCC(SIG) 61 | Pakistan |
| Maj | N W P G P Indrajith | UN Military Observer Course 22 | Pakistan |
| Maj | W C S Nanayakkara | JSC (SIG) 61 Linked With MCC(SIG) 61 | Pakistan |
| Maj | D H S L Kumarasiri psc | JSC (SIG) 61 Linked With MCC(SIG) 61 | Pakistan |

| | | | |
|---|---|---|---|
| Maj | K V A Kodikara psc | JSC (SIG) 61 Linked With MCC(SIG) 61 | Pakistan |
| Maj | M M Kaluarachchi | Signal Company Commander Course - 123 | India |
| Maj | N G Widanagamage Lsc | Signal Company Commander Course - 123 | India |
| Maj | H M G I U B Herath psc | JSC (SIG) Linked With MCC(SIG) 62 | Pakistan |
| Maj | G T K De Silva RSP Lsc | JSC (SIG) Linked With MCC(SIG) 62 | Pakistan |
| Maj | W H M J Wijerathna psc | Signal Company Commander Course - 123 | India |
| Maj | K M I P Hemapala psc | JSC (SIG) Linked With MCC(SIG) 62 | Pakistan |
| Maj | B S Dissanayake | Advanced Cyber Security Course - 07 | India |
| Maj | S P Gallage | JSC (SIG) Linked With MCC(SIG) 62 | Pakistan |
| Maj | M A S S Muthugoda psc | JSC (SIG) Linked With MCC(SIG) 62 | Pakistan |
| Maj | M R R J S Peiris | JSC (SIG) Linked With MCC(SIG) 62 | Pakistan |
| Maj | T M N D Tennakoon psc | Officers Advance Electronics Engineering (Communication) Course - 44 (Part I & II) | India |
| Maj | S Pradeep | Advance Computing (O) - 09 | India |
| Maj | M P C N Senadeera | Middle Level IT (Officers) Course - 40 | India |
| Capt | G S P N Tushara | Officers Basic Course (Signal) - 40 | Bangladesh |
| Capt | A P Kariyawasam psc | Young Officer Course | India |
| Capt | R B C M W T V Abeywardana | Young Officer's Course (SIG) 62 | Pakistan |
| Capt | R M C P Ranasinghe | Young Officer's Course (SIG) 62 | Pakistan |
| Capt | A N S Amaraweera | Young Officer's Course (SIG) 62 | Pakistan |
| Capt | H N P Hettiarachchige | Young Officer's Course (SIG) 62 | Pakistan |
| Capt | P K P Marindagoda | Middle Level IT (Officers) Course - 40 | India |
| Capt | N P T Kumarasingha | Young Officer Course | India |

## LOCAL COURSE PARTICIPANTS OTHER RANKS

| | | | | |
|---|---|---|---|---|
| S/281877 | Cpl | Ariyasinghe W H R K | 7 SLSC 2019.01.10 - 2019.02.30 | Cooking Course - First Place |
| S/283654 | Cpl | Pushpa kumara W M L | 3SLSC 2019.10.16 - 2019.10.24 | MOI Course - Second Place |
| S/286009 | L/Cpl | Jayasinghe R M D L | 9 SLSC 2019.07.17 - 2019.09.06 | Clerk Course - First Place |
| S/286201 | L/Cpl | Rukmal W H | 9 SLSC 2019.07.23 - 2019.09.23 | Clerk Course - Second Place |
| S/286988 | Sgm | Rodrigo R V R C | 9 SLSC 2019.11.28 - 2019.12.30 | Basic Accounting Course -Second Place |

# ක්‍රීඩා දක්ෂතාවයන්

## ශ්‍රී ලංකා කණ්ඩායම නියෝජනය කර ජාත්‍යන්තර තරඟ ජයග්‍රහණ හා සහභාගීවීම්



**සෙ/280496 කෝප්‍රල් ප්‍රභාත් කුමාර ටී පී එස්**
**සෙ/285913 සංසෙ බණ්ඩාර කේ පී ඒ පී**

තායිවානයේ පැවැති රගර් තරඟාවලියට සහභාගි වී එහි තෙවන ස්ථානය දිනා ගැනීම සහ මාලදිවයින පැවැති රගර් තරඟ සඳහා සහභාගි වීම



**සෙ/2748373 ලා/කෝ විමලසිරි ඩී පී ඒ අයි**

2019 චීනයේ වුහාන් නගරයේ පැවැති ලෝක ආරක්ෂක සේවා මළල ක්‍රීඩා තරඟාවලියේ දුර පැනීමේ ඉසව්ව 10 වන ස්ථානය දිනා ගැනීම

## දකුණු ආසියාතික මළල ක්‍රීඩා තරඟාවලියේ ලබාගත් ජයග්‍රහණ






**සෙ/282897 ලා/කෝ පෙරේරා ජේ ඒ එල්**

2019 දෙසැම්බර් මස 05 වන දින නේපාලයේ පැවති දකුණු ආසියාතික තුන් ප්‍රයාම තරඟාවලියේ තුන්වන ස්ථානය ලබා ගැනිම



**කෝප්‍රල් ජයතිලක කේ ඒ කේ අයි ටී**

13 වන ආසියානු වෙරළ අත්පන්දු තරඟාවලිය 2 වන ස්ථානය ලබා ගැනිම



**සෙ/101357 සංසෙ (කා) කුමාරසිංහ කේ පී ඩී එම් එස්**

නේපාලයේ කත්මන්ඩු නුවර පැවති 13 වන දකුණු ආසියානු තරඟාවලියේ මීටර් 400, මීටර් 800 සහ මීටර් 400x4 සහය දිවීමේ තරඟයෙන් රන් පදක්කම් දිනාගන්නා ලදි



**සෙ/101422 සංසෙ (කා) ද සිල්වා ඩී ටී ඒ**

නේපාලයේ කත්මන්ඩු නුවර පැවති 13 වන දකුණු ආසියානු තරඟාවලියේ මීටර් 100 රිදී පදක්කම හා මීටර් 400x4 සහය දිවීමේ තරඟයෙන් රන් පදක්කම් දිනාගන්නා ලදි

## 45 වන ජාතික මහා ක්‍රීඩා උළෙලේ ජයග්‍රහණ



45 වන ජාතික මහ ක්‍රීඩා උළෙලේ කපිතන් එල් එස් කාවින්ද ටේබල් ටෙනිස් ක්‍රීඩාවේ කේවල හා යුගල ඉසව්හී තුන්වන ස්ථානය ජයග්‍රහණය කරන ලද අවස්ථාව

## ආසේමු (නැ) ක්‍රීඩා උළෙලේ ජයග්‍රහණ



2019 වර්ෂයේ ආසේමු (නැ) බල ප්‍රදේශයෙහි පැවති ක්‍රීඩා තරගාවලියේ 2(සෙව්) ශ්‍රීලංසංබ ඒකකයේ ආසෙ සේනාරත්න ඊ පී එස් එච් දක්ෂතම මලල ක්‍රීඩිකාව ලෙස ජයග්‍රහණය කරන ලද අවස්ථාව

## අන්තර් රෙජිමේන්තු ස්කොෂ් තරගාවලිය කාන්තා - 2019



2019.10.23 වන දින අන්තර් රෙජිමේන්තු ස්කොෂ් තරගාවලියෙන් දෙවන ස්ථානය හිමිකර ගත් ශ්‍රී ලංකා සංඥා බළකා කාන්තා ස්කොෂ් කණ්ඩායම සංඥා බළකාධිපති සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටි අවස්ථාව

## අන්තර් රෙජිමේන්තු නෙට්බෝල් තරගාවලිය - 2020




2020.03.06 වන දින අන්තර් රෙජිමේන්තු නෙට්බෝල් තරගාවලියෙන් දෙවන ස්ථානය හිමිකර ගත් ශ්‍රී ලංකා සංඥා බළකා කාන්තා නෙට්බෝල් කණ්ඩායම සංඥා බළකාධිපති සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටි අවස්ථාව

## ශ්‍රී ලංකා සංඥා බළකාය අන්තර් ක්‍රීඩා ශූරතාවයන් - 2019



10 ශ්‍රීලංසංබ ඒකකය වෙතින් සංවිධානය කළ අන්තර් ඒකක පැසිපන්දු තරගාවලියෙන් ප්‍රථම ස්ථානය දිනා ගත් 10 ශ්‍රීලංසංබ කණ්ඩායම




2019 වර්ෂයේ අන්තර් සංඥා ඒකක බැට්මිටන් තරඟාවලියේ ප්‍රථම ස්ථානය හිමි කරගත් 2(සේවි) ශ්‍රීලංසංබ කණ්ඩායම



2019 වර්ෂයේ අන්තර් සංඥා ඒකක කැරම් තරඟාවලියේ ප්‍රථම ස්ථානය හිමි කරගත් 2(සේවි) ශ්‍රීලංසංබ කණ්ඩායම



2019 වර්ෂයේ අන්තර් සංඥා ඒකක වුෂු තරඟාවලියේ 48 kg බර පංතියේ ප්‍රථම ස්ථානය හිමි කරගත් 2(සේවි) ශ්‍රීලංසංබ ඒකකයේ කෝප්‍රල් ප්‍රේමරත්න ඒ ජී ඩී පී



2019 වර්ෂයේ අන්තර් සංඥා ඒකක රගර් තරඟාවලිය ප්‍රථම ස්ථානය හිමි කරගත් 2(සේවි) ශ්‍රීලංසංබ කණ්ඩායම



2019 වර්ෂයේ අන්තර් සංඥා ඒකක ක්‍රිකට් තරඟාවලිය ප්‍රථම ස්ථානය හිමි කරගත් 2(සේවි) ශ්‍රීලංසංබ කණ්ඩායම



2020 වර්ෂයේ රෙමශ්‍රීලංසංබ හිදි පවත්වන ලද අන්තර් සංඥා ඒකක ස්කෝෂ් තරඟාවලියේ ප්‍රථම ස්ථානය දිනා ගත් 4 ශ්‍රීලංසංබ කණ්ඩායම



2020 අගෝස්තු මස 24 සහ 25 වන දින ඒකක පරිශ්‍රයේ පිහිටි ආසේමු (වන්නි) පිහිනුම් තටාකයේදි පවත්වන ලද අන්තර් සංඥා ඒකක පිහිනුම් සහ වෝටපෝලෝ තරඟාවලියේදි ප්‍රථම ස්ථානය දිනා ගත් 4 ශ්‍රීලංසංබ කණ්ඩායම



**මේජර් ජෙනරාල් එච් පී සෙනෙවිරත්න (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්ඩබ්ලිව්ඩබ්ලිව්**
2020 අන්තර් රෙජිමේන්තු අවු: 50 වැඩි බැඩ්මින්ටන් තරඟාවලියේ කේවල තරඟයේ දෙවන ස්ථානය



**බ්‍රිගේඩියර් ඩබ්ලිව් එල් ප්‍රේමසිරි යූඑස්පී**
2019 අන්තර් රෙජිමේන්තු අවු: 50 වැඩි බැඩ්මින්ටන් තරඟාවලියේ කේවල තරඟයේ තෙවන ස්ථානය



**කපිතාන් එස් පී අයි යු දයාරත්න**
2020 අන්තර් රෙජිමේන්තු බැඩ්මින්ටන් තරඟාවලියේ කාන්තා කේවල ඉසව්ව 3 වන ස්ථානය, කාන්තා යුගල 3 වන ස්ථානය



**ලා/කෝ දසනායක ඊ එම් ඩබ්ලිව් ඩබ්ලිව් එම් බී**
ජාතික ඔරු පැදීමේ තරඟාවලියේ Cox 4 1 වන ස්ථානය



**ලා/කෝ මධුසර ඩබ්ලිව් එල් ඒ අයි**
34 වන ජාතික ජ්‍යේෂ්ඨ ඔරු පැදීමේ තරඟාවලියේ අවු: 23 පහළ Double Scull 1 වන ස්ථානය
ජාතික ඔරු පැදීමේ තරඟාවලියේ විවෘත යුගල 3 වන ස්ථානය
ජාතික ඔරු පැදීමේ තරඟාවලියේ Cox 4 1 වන ස්ථානය



**සංසෙ (කා) මෙන්ඩිස් ටී අයි එස්**
ජාතික ඔරු පැදීමේ තරඟාවලියේ Cox 4 1 වන ස්ථානය
ජාතික ඔරු පැදීමේ තරඟාවලියේ ආධුනික ස්කල් තරඟාවලියේ 1 වන ස්ථානය
ආරක්ෂක සේවා ඔරු පැදීමේ තරඟාවලියේ ඩබල් ස්කල් යුගල 3 වන ස්ථානය
ආරක්ෂක සේවා ඔරු පැදීමේ තරඟාවලියේ තනි තරඟය 3 වන ස්ථානය



**සංසෙ නගීරාන් එම් එන් එම්**
ජාතික ඔරු පැදීමේ තරඟාවලියේ 1, 2 වන ස්ථානය
ආරක්ෂක සේවා ඔරු පැදීමේ තරඟාවලියේ ස්කල් තරඟ 1 වන ස්ථානය



**සංසෙ (කා) මාලිකා එන් පී ආර්**
ජාතික ඔරු පැදීමේ තරඟාවලියේ ආධුනික Cox 4 3 වන ස්ථානය
ජාතික ඔරු පැදීමේ තරඟාවලියේ Cox 4 3 වන ස්ථානය



**සංසෙ (කා) සමරනායක ආර් අයි එස්**
ජාතික ඔරුපැදීමේ තරඟාවලියේ ආධුනික Cox 4 3 වන ස්ථානය ජාතික ඔරු පැදීමේ තරඟාවලියේ ආධුනික යුගල 3 වන ස්ථානය



**සංසෙ (කා) පෙරේරා බී එම් එම්**
ජාතික ඔරු පැදීමේ තරඟාවලියේ Cox 4 3 වන ස්ථානය



**ආසෙ ප්‍රනාන්දු ඩබ්ලිව් එස්**
ජාතික ඔරු පැදීමේ තරඟාවලියේ Cox 4 3 වන ස්ථානය



**ලා/කෝ සේනාරත්න එස් ඒ ආර් එස්**
ජාතික මුයිතායි තරඟාවලියේ කි:ග්‍රෑ 75 අඩු රිදී පදක්කම
අන්තර් රෙජිමේන්තු මුයිතායි තරඟාවලියේ කි:ග්‍රෑ 81 අඩු රන් පදක්කම



**ලා/කෝ හංසනි කේ ඒ ආර්**
ජාතික මුයිතායි තරඟාවලියේ කාන්තා කි:ග්‍රෑ 70 වැඩි 3 වන ස්ථානය



**සංසෙ (කා) කල්දේරා එස් කේ ඩී ඩබ්ලිව් එස්**
2019 ජාතික මුයිතායි තරඟාවලියේ 75 kg බර පංතියේ 1 වන ස්ථානය
ජාතික මුයිතායි තරඟාවලියේ කි:ග්‍රෑ 75 බර පංතිය 1 වන ස්ථානය



**කෝප්‍රල් වික්‍රමසිංහ ඩබ්ලිව් එම් එස් එස්**
ජාතික ආධුනික ජිම්නාස්ටික් තරඟාවලිය සමාන්තර පොල්ල හා රෝමානු වලලු 3 වන ස්ථානය



**ලා/කෝ ප්‍රේමරත්න ආර් බී පී ටී කේ**
ජාතික ආධුනික ජිම්නාසටික් තරඟාවලිය ආධාරක අශ්වයා 3 වන ස්ථානය



**කෝප්‍රල් ප්‍රේමතිලක අයි එම් සී බී**
2019 වසරේ ජාතික ක්‍රීඩා කායවර්ධන තරඟාවලියේ කි:ග්‍රෑ 75 බර පංතියේ 1 වන ස්ථානය



**කෝප්‍රල් අමරතුංග එම් පී පී අයි**
ආරක්ෂක සේවා බිලියඩ් හා ස්නුකර් තරඟාවලිය 1 වන ස්ථානය



**කෝප්‍රල් මධුශාන් ඒ එම් ඒ**
2020 අන්තර් රෙජිමේන්තු කායාකින් තරඟාවලියේ සී කැනොවින් බෝට් 4 මීටර් 500 1 වන ස්ථානය සී 4 මීටර් 1000 1 වන ස්ථානය



**ලා/කෝ විජේබණ්ඩාර එච් පී ඩබ්ලිව් එන් කේ**
අන්තර් රෙජිමේන්තු මුයිතායි තරඟාවලියේ පිරිමි කි:ග්‍රෑ 83 2 වන ස්ථානය



**ලා/කෝ නුවන් කුමාර කේ එම් ඩී**
අන්තර් රෙජිමේන්තු මුයිතායි තරඟාවලියේ 2 වන ස්ථානය



**ලා/කෝ තිලකරත්න කේ ඒ එන්**
අන්තර් රෙජිමේන්තු මුයිතායි තරඟාවලියේ කාන්තා කි:ග්‍රෑ 64 2 වන ස්ථානය



**ලා/කෝ විජේරත්න පී පී ඩී එම්**
අන්තර් රෙජිමේන්තු මුයිතායි තරඟාවලියේ පිරිමි කි:ග්‍රෑ 57 අඩු 3 වන ස්ථානය



**ලා/කෝ බණ්ඩාර ආර් බී ඩබ්ලිව් බී**
අන්තර් රෙජිමේන්තු මුයිතායි තරඟාවලියේ පිරිමි කි:ග්‍රෑ 71 3 වන ස්ථානය



**ලා/කෝ ගයාශාන් වී ඒ එන්**
අන්තර් රෙජිමේන්තු මුයිතායි තරඟාවලියේ පිරිමි කි:ග්‍රෑ 60 3 වන ස්ථානය



**සංසෙ (කා) පෙරේරා එම් ඩී සී එන් එල්**
අන්තර් රෙජිමේන්තු මුයිතායි තරඟාවලියේ කාන්තා කි:ග්‍රෑ 41 1 වන ස්ථානය



**සංසෙ දිල්ශාන් ඊ ඒ**
අන්තර් රෙජිමේන්තු මුයිතායි තරඟාවලියේ පිරිමි කි:ග්‍රෑ 67 3 වන ස්ථානය



**සංසෙ (කා) ප්‍රියවංශ**
2020 අන්තර් රෙජිමේන්තු බැඩ්මින්ටන් තරඟාවලියේ කාන්තා යුගල 3 වන ස්ථානය

# EXAMINATION PHOBIA



Terms end are the most dreaded, if not hated by the students, for this is the time of annual examination in schools. These are the three months when the much talked about exam fever rages like an epidemic in the student world. But in this age of prophylactics and wonder drugs, can this ailment not be prevented? Yes, if the right remedies are taken. Fortunately they are within everyone's reach too.

The first thing one should do to immunize oneself against the exam fever is to stop worrying about it. It is easier said than done, one may say. But it can be just as easy if one had been preparing for it through the year, which will make the last minute preparations unnecessary. It is the frantic eleventh hour studies which send a chill through one's spine and give that down and out feeling, the symptom of the exam fever.

Only when one gets the symptoms of an ailment does one have to seek the physician's advice and take the medicines prescribed by him, however bitter they may be. If one feels well, the doctor and the drug are out of one's thoughts. Then work and play are both pleasures, for one is healthy and has enough energy to engage oneself in chosen pursuits and in the right spirits. Only when one is in the right spirits-free from all tension and nervousness does one learn or understand anything. The right frame of mind is necessary for all mental manoeuvres. When one learns with joy one develops interest and what is learnt proves interesting and he knowledge so acquired gets firmly embedded in one's memory. If a student had been learning with interest little by little the different subjects, if he had been diligently doing periodical revision of the portions learnt till then, if he had carefully checked the errors in this work the examination can gave him no fear. He will face it with confidence.

The examination fever attacks one because one lacks confidence in oneself. For this, one has only himself to blame. If one had been steady, though a slow learner, throughout the year, one would have been revising his lessons and notes now and then and this by itself would stand one in good stead at the examination without any last minute intensive study. For such a student, there is no need to burn the midnight oil. Even if one keeps awake late in the night and hurriedly studies the text books as the exam approaches, it is of no avail. In such rapid reading nothing will permanently stay in one's head. One will not absorb what one reads and so one's memory can fail one at the examination hall.

Bright students rarely fear the exam, on the contrary, they welcome its fast arrival so that they can finish it off and can then enjoy their vacation soon. Remember that no student is born bright. Only by one's healthy habits and steady diligence does one become bright. There is a saying: "Genius is 99 percent perspiration and one percent inspiration." In other words, no one is a born genius but become one because of one's hard work and intellectual application. This involves putting one's heart and soul into what one is doing at a time. If one whole heartedly devotes oneself to learning a little each day but regularly through the year, one will find no need to rush through the text-books towards the close of the academic year. One can even take it easy as the exam approaches.

Maj K V A Kodikara psc SLSC

## පරිගණක ලෝකයේ තවත් සන්ධිස්ථානයක් - "Cloud Computing"

තොරතුරු තාක්ෂණික සේවාවන් හා මෙවලම්වලට අන්තර්ජාලය ඔස්සේ ප්‍රවේශවීමේ ක්‍රමයක් ලෙසින් ‘‘Cloud Computing’’ යන්න හැඳින්විය හැකිය. මෙහිදී ලෝකයේ තිබෙන සියලු Application install කොට Server Computer Machine අන්තර්ජාලය හරහා සම්බන්ධ අපට අවශ්‍ය Application එක තෝරා ගැනීම මගින් අපට අවශ්‍ය කාර්යය කර ගැනීමට හැකි අතර අවශ්‍ය වන්නේ වෙබ් අතරික්සුවක් (Web browser) සහිත පරිඝණකයක් සහ අන්තර්ජාල සම්බන්ධතාවක් පමණි.




මෙමගින් ජාලයේ තිබෙන සියලුම සම්පත් ප්‍රයෝජනයට ගත හැකි සේවාවක් ලැබෙන අතර, ගෙවීමට සිදුවන්නේ අප පරිහරණය කරන සේවාවන්වලට පමණි. අවශ්‍ය මෘදුකාංග සියල්ල තැන්පත් කිරීමෙන් අන්තර්ජාලයට සම්බන්ධ Server computer machine එකක නිසා අවශ්‍ය කාර්යය කිරීමට අදාළ මෘදුකාංග අපගේ පරිඝණකය තුළ install කිරීම අවශ්‍ය නොවේ. එසේම අවශ්‍ය කාර්යය අපගේ පරිඝණකයෙන් සිදුකර එම දත්ත හා තොරතුරු Server computer machine එක තුළම තැන්පත් කරගත හැක. පසුව එම දත්තවලට ලෝකයේ ඕනෑම ස්ථානයක සිට අන්තර්ජාල සබඳතාවක් සහිත පරිඝණකයක් ඔස්සේ ප්‍රවේශ විය හැකිය. එසේම මෙම පහසුකම සක්‍රිය කරගැනීමට කළ යුත්තේ තුන්වන පාර්ශවීය සේවා සපයන්නෙකුගෙන් සුළු මුදලක් ගෙවීමට පමණි.

මෙය මුල් වරට ආරම්භ වුයේ 2009 වර්ෂයේ දී වන අතර නිදහස් විවෘත මෘදුකාංගවලින් මේ සේවාවට විශාල දායකත්වය ලබා දෙයි. “Cloud” යව වචනය මෙහිදී යොදා ගැනෙන්නේ දුරකථන ක්‍රමයක් හෙවත් දුරකථනයක් (Telephone) යන අර්ථයෙනි. 1990 දශකය පමණ වන තුරු දත්ත හුවමාරුව සිදුවුයේ රැහැන් සම්බන්ධතාවන් මගිනි. පසු කාලීනව විවිධ දුරකථන සමාගම් රැහැන් රහිත පරිඝණක ජාල ක්‍රමයක් හඳුන්වා දෙන ලදි. එය Virtual Private Network (VPN) ලෙස හදුන්වයි. එය භාවිතයෙන් පරිඝණක ජාලය තුළ තදබදය (Traffic) අවම වු අතර, තොරතුරු හුවමාරුව පහසු විය. Cloud Computing සංකල්පය මුල්වරට ඉදිරිපත් කරන ලද්දේ 1960 වර්ෂයේ John Mc Carthy විසිනි. නමුත් මෙම වචනය ජනප්‍රිය වුයේ 1990 වර්ෂයෙ ATM කරලියට පැමිණීමත් සමගය. ඉන් අනතුරුව 2007 වර්ෂයේදී Google සහ IBM සමාගම් විසින් විශාල පරිමාණයේ Cloud Computing ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

“Cloud Computing” වල ලක්ෂණ

අවශ්‍යතාවයට අනුකූල ස්වයං සේවාව
ඕනෑම තැනක සිට ජාලය පරිශීලනය
සම්පත් ගොනුව
සීඝ්‍රයෙන් වර්ධනය වන නම්‍යශීලී බව
පරිහරණය අනුව ගෙවීම් කළ හැකි වීම.

**කපිතන් ආර් එම් ඩී එන් ටී රාජපක්ෂ ශ්‍රීලංසංබ**

## BIG DATA (විශාල දත්ත)

ව්‍යුහගත නොවන සංවිධාන විසින් එකතු කරනු ලබන විශාල ප්‍රමාණයේ තොරතුරු කැණීම් (Data Mining) කර Machine learning ව්‍යාපෘති, Predictive ආකෘති නිර්මාණය, සහ වෙනත් Advanced analytics applications සඳහා යොදා ගැනීම.

Big Data වල වැදගත්කම

මෙහෙයුම් වැඩි දියුණු කිරීම සඳහා සමාගම් ඔවුන්ගේ පද්ධතිවල එකතු වී ඇති Big Data (විශාල දත්ත) භාවිතා කරයි, වඩා හොඳ පාරිභෝගික සේවාවක් සැපයීම, නිශ්චිත පාරිභෝගික මනාපයන් මත පදනම්ව පුද්ගලීකරණය කළ අලෙවිකරණ ව්‍යාපාරයක් නිර්මාණය කිරීම සහ අවසාන වශයෙන් ආයතනයේ ලාභදායිත්වය වැඩි කරයි. එමෙන්ම Artificial intelligence (කෘතීම බුද්ධිය) පදනම් වු වැඩසටහන් සඳහාද මෙම Big Data (විශාල දත්ත) යොදා ගැනේ.

**2/ලුතිනන් එම් ඒ ඩී සඳරුවන් ශ්‍රීලංසංබ**

# ආතතිය සහ ඉන් මිදීම

මානසික ආතතියක් නැති නම් පුද්ගලයා මැරුණු පුද්ගලයෙකු පමණි. අද සමාජයේ ජීවත් වන සියලු පුද්ගලයින්ට ආතතිය විවිධ ආකාරයෙන් බලපායි. ආතතියක් නොමැති පුද්ගලයෙකු සොයා ගැනීම අපහසුවන අතර පුද්ගලයින් විවිධ මට්ටම්වල ආතතිවලින් පෙළේ.

## ආතතිය යනු කුමක්ද?

අවට පරිසරයෙන් සිදුවන වෙනස්වීම් වලට අපගේ ශරීරය හා මනස ලබන්නා වූ අද්දැකීම ආතතිය ලෙස සරලව කිව හැකිය. ඔබ ආතතියකට ලක්වූවිට ඔබගේ ශරීරය ඒ සඳහා සූදානම් වේ. ඔබ අනතුරක් අභියස ඇති බව ශරීරය වටහාගනී. එවිට ශරීරය ඒ සඳහා ප්‍රතික්‍රියා කිරීමට පටන්ගනී. ඒ අතර හෝමෝන හා ඇඩ්‍රිනලීන් ශරීරයෙන් නිදහස් කිරීමට පටන්ගනී. මෙම ඇඩ්‍රිනලීන් (Adrenaline) නිසා හෘද ස්පන්දනය වේගවත් වීම, ශ්වසනය වේගවත්වීම හා ශරීරයේ සීනි ප්‍රමාණය ඉහළ යාම මගින් ඔබගේ ශරීරයට තව ශක්තියක් ලබා දෙයි. මෙය Fight of Flight අවස්ථාව නම් වේ.

මෙම ආතතිය නිසා ශරීරය සහ මනස ප්‍රතිචාර දක්වන ආකාරය කොටස් 2 කට වෙන් කළ හැක.

ධනාත්මක ප්‍රතිචාර - Eustress
සෘණාත්මක ප්‍රතිචාර - Distress

## ධනාත්මක ප්‍රතිචාර

ආතතිය ඉතා ප්‍රශස්ත මට්ටමකට පත් වූ විට මෙම අවස්ථා ඇති වේ.

- අවධානය යොමු කිරීමේ හැකියාව ඉහළ යාම.
- කාර්යක්ෂම හා නිවැරදිව කටයුතු කිරීමේ හැකියාව ඉහළ යාම.
- තමන්ගේ කාර්යය වඩා උද්‍යෝගයෙන් කිරීමට හැකියාව ලැබීම ආදියයි.

## සෘණාත්මක ප්‍රතිචාර

තමන්ගේ ආතතිය දරාගැනීමේ හැකියාව ඉතා පහළ මට්ටමකට පත්වූ විට මෙම අවස්ථාව උදාවේ. එවිට ඔබගේ ශරීරය හා මනස සෘණාත්මකව ප්‍රතිචාර දැක්වීමට පටන් ගනු ඇත.එම නිසා

- උද්‍යෝගය පහළ යාම.
- කාර්යක්ෂමබව අඩු වීම.
- තමන්ගේ කාර්යය වඩා උද්‍යෝගයෙන් කිරීමට හැකියාව ලැබීම ආදිය සිදුවේ.

## ක්‍රියාකාරීත්වය හා ආතතිය

රාජකාරී වලදී ආතතිය ඇතිවීමට හේතු

- තමන්ගේ යටතේ සිටින අයවළුන් පාලනය කිරීමට යාමේදී.
- තමන් යටතේ සිටින සේවකයින් පුහුණු කිරීමේදී හා ඔවුන්ගේ කාර්යයන් ඉටු කර ගැනීමේදී.
- නිවාඩු දවස්වල හා අතිරේක වෙලාවේදී වැඩ කිරීම.
- අධික වැඩ ප්‍රමාණය.




## ආතතිය නිසා දක්වන ප්‍රතිචාර

ශාරීරික ප්‍රතිචාර

- අධික මහන්සිය දැනීම.
- ඔළුවේ කැක්කුම.
- නිදි රටාව වෙනස් වීම.

මානසික ප්‍රතිචාර

- දුර්වල තීන්දු තීරණ ගැනීම.
- මතකය අඩුවීම.
- දුර්වල අවධානය.
- අසංවිධානාත්මක බව.

සංවේදනාත්මක ප්‍රතිචාර

- තරහා යාම.
- බය දැනීම.
- දුක්බර දැනීම.

## ABC ක්‍රමය

A Awareness (දැනුවත් වීම)
B Balance (සමබරතාවය)
C Control (පාලනය)

ආතතිය ඇති වු විට එය පාලනය කර ගැනීමෙන් තමන්ටත් සමාජයේ අන් අයටත් මහත් ප්‍රයෝජනයක් ලැබේ.

තමන් ගැන නැවත නැවත සිතීමට පටන් ගැනීමෙන්.
අනවශ්‍ය කාරණයක් ඇති නොකර ගැනීමෙන්.
ධනාත්මක චින්තනයන් ඇති නොකර ගැනීමෙන්.
ආතතියක් ඇති වු විට තමන් ඒ සඳහා දක්වන ප්‍රතිචාර දැන ගැනීම ආදිය මගින් නැවත ආතතිය ඇති වීම වළක්වා ගත හැකිය.

**කපිතන් නුවන් ඒකනායක ශ්‍රීලංසංබ**

## සංඥා මධ්‍යම වැඩපල (මසංවැ) - කොකාවිල් සහ බහුකාර්ය සම්ප්‍රේෂන මධ්‍යස්ථානය - කොකාවිල්

ශ්‍රී ලංකාවේ උතුරු පළාතෙහි පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයත් ස්ථානයන්හි පවත්වාගෙන යනු ලබන සංඥා සම්බන්ධතාවයන් සහ තොරතුරු තාක්ෂණ පද්ධතීන් වෙනුවෙන් අවශ්‍ය වන මධ්‍යම අලුත්වැඩියාවන් සැපයීමේ අරමුනින් සංඥා මධ්‍යම වැඩපල - කොකාවිල්, කොකාවිල් සම්ප්‍රේෂන මධ්‍යස්ථාන පරිශ්‍රයෙහි සංඥා මධ්‍යම වැඩපල යන නමින් ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි.

මෙම සංඥා මධ්‍යම වැඩපල යටතේ පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන සංඥා නිලධාරිගේ අධීක්ෂණය මත රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනය නමින් දිවයිනේ සිටින සියලු යුද්ධ හමුදා සාමාජිකයින් වෙත තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ පාඨමාලා පැවැත්වීමේ පුහුණු ආයතනයක් පවත්වාගෙන යනු ලබයි.

තවද මෙම සංඥා මධ්‍යම වැඩපල 2008 වසරේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා භට පිරිස් විසින් එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගෙන් නැවතත් අත්පත් කරගෙන 2012 වසරේදී ප්‍රතිසංස්කරණය කරන ලද කොකාවිල් බහුකාර්ය සම්ප්‍රේෂන මධ්‍යස්ථානය වෙත ආරක්ෂාවද සපයනු ලබයි.

